M. W. SUGATHAPALA DE SILVA

# A COLLOQUIAL SINHALESE READER

© 1971

by M.W. Sugathapala De Silva,
University of York.

# PREFACE

1. ARRANGEMENT. This book which presupposes an elementary knowledge of Sinhalese has been arranged in an increasing order of difficulty. As an aid to learning comparatively new words and expressions have been listed alphabetically at the end of each reading unit, and a complete glossary is given at the end of the book. All readings are in spoken colloquial Sinhalese and have been especially written up for the purpose by the author. This may be used in conjunction with such basic courses as M.W.S. De Silva and D.D. De Saram, Spoken Sinhalese for the Beginner, Colombo, Ceylon University Press, 1963, D. Garusinghe, Sinhalese, The Spoken Idiom, München, Max Hueber Verlag, 1962, and K. Matzel, Einführung in die Singhalesische Sprache, Wiesbaden, Otto Harrassowitz, 1966; but it is most suited as a companion reader to G.H. Fairbanks, J.W. Gair and M.W.S. De Silva, Colloquial Sinhalese, Cornell University, 1968.

2. GLOSSARY. Following the practice in Fairbanks, Gair and De Silva, Colloquial Sinhalese, citations in the glossary of this book are given in both singular and plural forms. For irregular verbs, all forms occurring in the texts have been cited in alphabetical order, while regular verbs have been cited in the simple present tense form only. Where a mere English translation equivalent is insufficient, transitivity or intransitivity has been indicated to clarify the usage. No other grammatical information has been provided.

3. The author is grateful to Professors Gordon H. Fairbanks and James W. Gair for their encouragement in the preparation of this Reader.

THE SINHALESE ALPHABET

The order of alphabetization in this book is as follows:

අ ආ ඇ ඈ

ඉ ඊ උ ඌ

එ ඒ ඔ ඕ

ක ග ච ජ ඤ

ට ඩ ත ද න

ප බ ම

ය ර ල ව

ශ ස හ

ං

The symbol ෘ is used to represent a 'ru' sound as in සංස්කෘතිය saŋskrutiyə. The sound 'f' is represented by fප.

C O N T E N T S


| | | |
|---|---|---|
| 1. | අපේ ගම | Our Village |
| 2. | මිනිස්සු යන එන හැටි | How People Get About |
| 3. | සිංහළ සිරිත් විරිත් කීපයක් | Some Sinhalese Customs |
| 4. | සිංහළයන්ගෙ ඉතිහාසෙ | The History of the Sinhalese |
| 5. | බමුනාගෙයි එළුවාගෙයි කතාව | The Story of the Brahman and the Goat |
| 6. | සිංහල අවුරුද්ද | The Sinhalese New Year |
| 7. | පොත් ලිවීම | Writing Books |
| 8. | නුවර පෙරහැර | The Kandy Procession |
| 9. | ගංවතුර | Floods |
| 10. | ගොවිතැන් කිරීම | Agriculture |
| 11. | ලංකාවෙ දේසගුනේ | The Climate of Ceylon |
| 12. | ඩී. ඇස්. සේනානායක තුමා | Mr. D.S. Senanayake |
| 13. | සිද්දාර්ත කුමාරයා | Prince Siddhartha |
| 14. | ගමරාලගෙ නුවන | The Wisdom of the Village Chief |
| 15. | වැඩකාරයො | Servants |
| 16. | සිංහල බාසාව | The Sinhalese Language |
| 17. | මිනිස්සු කන බොන හැටි | How People Eat and Drink |
| 18. | වළලු වෙළෙන්දා | The Bangle Seller |
| 19. | සිල්ලර කඩයක් | A Provisions Shop |
| 20. | බුලත් කෑම | Chewing Betel |
| 21. | පොල් ගහ | Coconut Tree |
| 22. | ගමේ වෙද මහත්තයා | The Village Physician |
| 23. | කාලගෝල කතාව | The Story of Kalagolaya |
| 24. | රස්තියාදු කාරයො | Loiterers |
| 25. | තේ වතුවල වැඩ | Work in Tea Estates |
| 26. | අපේ ආගම් | Our Religions |

27. පංච කල්‍යාණ — The Five Qualities of a Woman
28. විහිළු කිරීම — Joking
29. සාස්තර කාරයො — Astrologer
30. වැඩියෙ හොඳ සල්ලි ද? උගත් කම ද? — Which is Better, Money or Education?
31. දුර්ජනයො — Wicked People
32. ලංකාව ආංඩු කරන හැටි — How Ceylon is Governed
33. කවිකොළ කාරයා — Leaflet Seller
34. ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බංඩාරනායක තුමා — Mr. S.W.R.D. Bandaranaike
35. වට්ටි අම්මා — Vegetable Seller
36. මඟුල් ගෙදර — Wedding House
37. නිදහස් අද්‍යාපනේ — Free Education
38. දේසපාලනේ — Politics
39. තේ කෝප්පයක් හදන හැටි — How to make a Cup of Tea
40. සිංහල හෝඩිය — The Sinhalese Alphabet
41. වැද්දො — Veddas
42. විජය රජ්ජුරුවො — King Vijaya
43. සිරිමහ බෝදිය — The Sacred Bodhi Tree



## 1. අපේ ගම

අපේ ගම බොහොම කුඩායි. වර්ග හැතැප්ම හතරකට වැඩියෙ නෑ. නමුත් අපේ පලාතෙ අනිත් ගම්වලට වැඩියෙ අපේ ගම දියුනුයි. අපේ ගමේ තුන්මං හන්දිය බොහොම ප්‍රසිද්ද තැනක්. ගමට එන බස් සේරම නවත්තන්නෙ එතන. ගමේ ඉඳලා ටවුමටයි ටවුමෙ ඉඳලා ගමටයි බස් හතරක් දුවනවා. ඒ බස්වල වැඩියෙම ගමන් කරන්නෙ වෙළෙන්දො. ගමේ වෙළෙන්දො ගමේ වවන දේවල් විකුනන්න ටවුමට ගෙනියනවා. ටවුමෙ වෙළෙන්දො සාප්පු බඩු ජාති, අරැමෝසම් බඩු ආදිය විකුනන්න ගමට ගේනවා. අපේ ගමේ ඉරිදා පොල තමයි පලාතෙ හොඳම ඉරිදා පොළ.

මේ ගමේ ග්‍රාම සේවකයා හොඳ වැදගත් කෙනෙක්. උන්නැහෙ ගම් වැසියන්ට බොහොම හිතවත්. ගමේ කලකෝලහලයක් උනොත් උන්නැහෙ ඒක කොහොම හරි සනසනවා. ඒක නිසා අපේ ගමේ මිනිස්සු කවදාවත් උසාවි යන්නෙ නෑ. උන්නැහෙ අපට නිතරම අවවාද කරන්නෙ සමගියෙන් ඉන්නයි. අපේ ගම් සබාවත් තරමක් දියුනුයි. ගමේ පාරවල් හදන්නෙ ගම් සබාවෙන්. මෙහේ ගම් සබාමට ආදායම මදි. නමුත් ගම් සබාවෙ සබාපති උන්නැහෙ හොඳ කෙනෙක් නිසා ඒ ආදායමෙන් හුඟක් ප්‍රයෝජනවත් වැඩ කරනවා. දැනට අපේ ගමේ නාන ලිං හතරකුයි හොඳ පාරවල් තුනකුයි විසාල සාලාවකුයි ගම් සබාවෙන් හදලා තියෙනවා. ගමේ වැදගත් රැස්වීම් පවත්තන්නෙ ඒ සාලාවෙ තමයි.

අපේ ගමේ වැඩි දෙනා කරන්නෙ ගොවිතැන් වැඩ. රබර් කැපීමත් කරනවා: නමුත් මෙහෙ තියෙන්නෙ රබර් වතු දෙකයි. මේ ගම රබර් වවන්න හොඳ මදි ලු. මෙහෙ රබර් ගස්වලින් හුඟක් කිරි ගන්න බැරි ලු. ඒ නිසා කවුරුත් කැමති වී ගොවිතැනට තමයි. ගම මැද්දෙන් ගඟක් බහිනවා. ඒක නිසා ගොවි තැනට ඕන තරම් වතුර හම්බවෙනවා.

අපේ ගමේ සිංහල ඉස්කෝලෙ ලමයි තුන්සියක් විතර ඉන්නවා. ඒ ඉස්කෝලෙ ගුරු මංඩලේ බොහොම හොඳයි. ගුරුවරු කවුරුත් බොහොම උනන්දුවෙන්

උගන්නනවා. මුල් ගුරුවරයා ගමේම කෙනෙක්. ඒක නිසා උත්සාහෙන ඉස්කෝලෙ දියුනු කරන්න බොහොම මහන්සි ගන්නවා. කලින් උන්න මුල් ගුරුවරයාට වැඩියෙ දැන් ඉන්න මුල් ගුරුවරයා හොඳයි කියලා කවුරුත් කියනවා. මගේ කල්පනාව අපේ ගම නව අවුරුදු දෙකකින් තුනකින් ටවුමක් තරම් දියුනු වේවි.

අරුමෝසම් බඩු ornaments, toys and small luxury items

අවවාද කරනවා to advise, instruct

අවවාදෙ instruction, advice, warning

ආදායම income

ඉරිදා පොල Sunday fair

උනන්දුව interest, enthusiasm

උනන්දුවෙන් with interest

උසාවිය court

උසාවි යනවා to go to court, sue

ඕන තරම් as much as necessary

කලකෝලහලේ quarrel

කැපීම cutting

කිරි milk, latex

කුඩා small, little

ගමන් කරනවා to travel

ගම් වැසියෝ villagers

ගම් සබාව village council

ගුරුමංඩලේ teaching staff

ගොවිතැන agriculture

ගොවිතැන් වැඩ agricultural work

ග්‍රාම සේවකයා village officer

තුන්මං හන්දිය fork, where three roads meet

දියුනු developed



දියුනු කරනවා to develop (trans)

දියුනු වෙනවා to develop (intr)

දුවනවා to run

නාන ළිඳ bathing well, used for taking a bath

නානවා to take a bath

බහිනවා to flow down, go down, descend

මහන්සි ගන්නවා to make an effort

මැද්ද middle, centre

රබර් කැපීම tapping rubber

ළිං wells

වර්ග හැතැප්ම square mile

වවනවා to grow (trans)

වැඩිදෙනා majority (of people)

වැඩියෙම mostly

වැදගත් important, respectable

විකුනනවා to sell

විසාල large

වී unhusked rice

වෙළෙන්දා merchant

සනසනවා to appease, console

සමගිය unity

සාප්පු බඩු shop goods

සාලාව hall

හිතවත් well-wishing, affectionate

## 2. මිනිස්සු යන එන හැටි

දැන් බසුයි ටැක්සියි සෑහෙන්න තියෙන නිසා කොළඹ මිනිස්සු රික්සෝවලින් යන්නෙ නෑ. ඉඳලා හිටලා රික්සෝ එකක් දකින්න පුලුවනි. නමුත් වැඩිදෙනා සාමාන්‍යයෙන් රික්සෝවලින් යන්න කැමති නෑ. රික්සෝකාරයො බොහොම දුප්පත් මිනිස්සු. සුලු ගාස්තුවකට ඒ මිනිස්සු රික්සෝ ඇදගන බොහොම දුර දුවනවා. ඒ මිනිස්සු දාඩිය දාගන රික්සෝ අදින හැටි බැලුවාම දුක හිතෙනවා. ඒකයි මිනිස්සු රික්සෝවලට අකමැති.

ටැක්සි හැතැප්මකට සත පනහක් අයකරනවා. නමුත් ඉක්මනට යන්න එන්න පුලුවනි. බස්වලින් යන එක හරි ලාබයි. බස්වල හැතැප්මකට අයකරන්නෙ සත පහයි. ඒ නිසා බස් දුප්පත් මිනිස්සුන්ට බොහොම ප්‍රයෝජනවත්. දුර පලාත්වලට යන්න ඇක්ස්ප්‍රස් බස් තියෙනවා. බස් ගමනාගමනෙ දියුනුකරන්න ආංඩුවෙන් හුඟක් මුදල් වියදම් කරනවා. ලංකාවෙ කෝච්චිවලිනුයි බස්වලිනුයි ආංඩුවට ලාබයක් නැති වූ. ඒවා දියුනුකරන්න ආංඩුව හුඟක් වියදම් කරනවා; නමුත් මිනිස්සුන්ගෙන් අයකරන්නෙ බොහොම ටිකයි. මේ වාහන තියෙන්නෙ මහ ජනයාගෙ සැප පහසුවට; සල්ලි හම්බකරන්න නෙවි. කෝච්චි දුවවන්නෙ 'ලංකා ධූමරථ දෙපාර්තමේන්තුව' කියන දෙපාර්තමේන්තුවෙන්. බස් දුවවන්නෙ 'ලංකා ගමනාගමන මංඩලය' කියන සමාගමෙන්. මේ දෙකම ආංඩුවෙ දෙපාර්තමේන්තු.

නගරවල බර අදින්නෙ ලොරිවලින්. නමුත් ගම්වල තවමත් බරකරත්ත පාවිච්චි කරනවා. බර අදින කරත්ත ජාති දෙකක් තියෙනවා. එකක් බරකරත්තෙ. බරකරත්තෙ ගොන්නු දෙන්නෙක් බඳිනවා. බරකරත්ත දුර ගමන් යනකොට වැඩිපුරත් ගොනෙක් ගෙනියනවා. කරත්තෙ අදින ගොන්නු දෙන්නාගෙන් එකෙකුට මහන්සි උනාම ඌ ලිහාලා තුන්වෙනි ගොනා බඳිනවා. නමුත් සුලු ගමන්වලදි වැඩිපුර ගොනෙක් ගෙනියන්නෙ නෑ. අනිත් කරත්ත ජාතියෙ නම බරබාගෙ. බරබාගෙ අදින්නෙ එක ගොනායි. බරබාගෙ බරකරත්තෙට වැඩියෙ තරමක් පුංචියි. විනෝද ගමන් යන්නත් මිනිස්සු ගොන් කරත්ත පාවිච්චි කරනවා. ඒවා බොහොම කුඩායි. ඒවායෙ බර ගෙනියන්න බෑ. මිනිස්සු හතර දෙනෙකුට විතර යන්න පුලුවනි. ඒවා අදින ගොන්නු

බොහොම හයියෙන් දුවනවා.  උන්ට හයියෙන් දුවන්න පුරුදු කරලා තියෙනවා.  ඒ කරත්තවලට කියන්නෙ බක්කි කරත්ත.  ඉඳලා හිටලා බක්කි කරත්තෙකින් යන එක හරි විනෝදයි.  කරත්තකාරයන්ට රික්සෝකාරයන්ට වැඩියෙ සල්ලි හම්බකරන්න පුළුවනි.  නමුත් ගම් දියුනුවෙන කොට ගම්වල මිනිස්සුත් බරකරත්තවලට වැඩියෙ ලොරි පාවිච්චි කරන්න පටන් ගත්තා.

අකමැති dislike

අයකරනවා to charge (money)

ඇදගන pulling

ඉඳලා හිටලා occasionally

උන්ට to those animals

ඌ that animal

ඒකයි that's why

කරත්තකාරයා carter

කරත්තෙ cart

කියන called (so and so)

කියන්නෙ what is called, is called

ගමන trip, journey

ගමනාගමනෙ travelling

ගාස්තුව fare

ගොන් කරත්තෙ bullock cart

තවමත් still

දකින්න පුළුවනි can be seen

දාඩිය දාගන sweating

දාඩිය දානවා to sweat

දුක misery

දුප්පත් poor

දුවවනවා to run (trans)



දෙකම both (things)

නගර cities

නෙවි not

පුරුදු කරනවා to train

පුංචි small

බක්කි කරත්තෙ buggy cart

බඳිනවා to tie

බර weight, heavy

බරකරත්තෙ cart pulled by two bullocks, used for carrying loads

බරබාගෙ cart pulled by one bullock, used for carrying loads

මහ ජනයා the public

මංඩලේ corporation

මුදල් money

යනඑක going

යන එන හැටි modes of travel

යනවා එනවා to get about

රික්සෝ එක, රික්සෝව rickshaw

රික්සෝකාරයා rickshaw puller

ලංකා ගමනාගමන මංඩලය the Ceylon Transport Board

ලංකා දුම්රථ දෙපාර්තමේන්තුව the Ceylon Government Railways

ලාබ cheap

ලාබෙ profit

ලිහනවා to untie

ලොරිය truck

වාහන vehicles

වැඩිපුර extra

විනෝද ගමන picnic, pleasure trip

වියදම් කරනවා to spend

වෙනම separately

සමාගම corporation, association

සැපපහසුව comfort

සෑහෙන්න sufficiently

සුළු small, unimportant

හම්බකරනවා to earn

හයියෙන් fast

හරි very

හිතෙනවා to feel, seem



## 3. සිංහල සිරිත් විරිත් කීපයක්

පුරාන සිංහල සිරිත් විරිත්වලට ගරුකරන මිනිස්සු කවදාවත් වැඩිහිටියන්ට නම කියලා කතාකරන්නෙ නෑ. නෑදෑයන්ට කතාකරන කොට නෑකම කියලා කතාකරන්න ඕන. දරුවො තමන්ගෙ අයියාලා අක්කාලාට නම කියලා කතාකෙරුවොත් දෙමව්පියො දඬුවම් කරනවා. නෑකමක් නැත්තං තමන් එක්ක අයියා හරි අක්කා හරි නැන්දා හරි මාමා හරි කියලා කතාකරන්න ඕන. අල්ලපු ගෙදර බාරොන් අයියා අපේ නෑදෑයෙක් නෙවි. නමුත් මිනිහා මට වැඩියෙ වැඩිමල් නිසා මම මිනිහාට බාරොන් අයියා කියලා කියනවා. කරෝලිස් මාමාත් මගේ නෑදෑයෙක් නෙවි. මම දවසක් සෙල්ලමට කරෝලිස් මාමාට නම කියලා කතා කෙරුවා; අනේ! මිනිහා මාත් එක්ක තරහ වෙලා මාසයක් විතර මාත් එක්ක කතා කරන්නෙ නැතුව උන්නා.

කිරි බතුයි කෙසෙල් ගෙඩියි කන එකත් සිංහල සිරිතක්. අපි උපන් දිනේ, අලුත් අවුරුද්ද දවස වගේ වැදගත් දවස්වල උදේට කිරි බත් කනවා. මම කිරි බත්වලට සාමාන්‍යයෙන් කැමති නෑ. නමුත් අපේ ගෙදර කිරි බත් හැදුවාම නංගියි මල්ලියි දෙන්නා නම් බඩ පිරෙනකං කනවා. අපේ තාත්තා කිරි බත් කන්නෙ ලුනුමිරිස් එක්ක. තාත්තා පැනි රසට කැමතිනෑ. නංගිට නම් කිරි බත් කන කොට පැනි කෝප්ප දෙකක් විතර ඕන.

සිංහල සිරිත් විරිත්වලට ගරුකරන මිනිස්සු අවුරුද්දකට සැරයක් දෙමව්පියො බලන්න ගිහිල්ලා බුලත් දුංකල දීලා වඳිනවා. බුලත් දුංකල දෙන එක ගරු කිරීමෙ ලකුනක්. බුලත් අතක් උඩ දුංකලයක් තියලා දෙන එකටයි බුලත් දුංකල දෙනවායි කියන්නෙ. බුලත් අතකට කොල හතලිහක් තියෙනවා.

ගම්බද සිංහල ගෙවල්වල බාරියාව පුරුෂයාට නම කියලා කතාකරන්නෙ නෑ. පුරුෂයාට කතාකරන කොට 'ඇහුනාද' කියලා කතා කරනවා. පුරුෂයා ගැන කතා කරන කොට 'අපේ ගෙදර එක්කෙනා' කියලා කියනවා. පුරුෂයාත් බාරියාවට කතා කරන්නෙ 'ඇහුනාද' කියලා; බාරියාව ගැන කතාකරන්නෙ 'අපේ ගෙදර එක්කෙනා' කියලා.

අක්කා older sister

අනේ Oh! , Alas!

අයියා older brother

අයියාලා අක්කාලා older brothers and sisters

අලුත් අවුරුද්ද new year

උපන් දිනේ birth day

කරෝලිස් Karolis, (a name)

කිරි බත් milk rice

කොළ leaves

කෝප්පෙ cup

ගම්බද rural

ගරු කරනවා to respect

ගරු කිරීම respecting

ගෙදර එක්කෙනා 'the person at home' : husband or wife

තමන්ගෙ one's own

තරහ වෙනවා to get cross

තියනවා to put, place

දඬුවම punishment

දඬුවම් කරනවා to punish

දුංකොළ tobacco

දෙමව්පියො parents

නම name

නම කියලා by the name

නංගි younger sister

නැන්දා paternal aunt

නෑකම relationship

පැණි syrup

පැණි රස sweet



පිරෙනවා to get filled

පුරුෂයා husband, man

බඩ stomach

බඩ පිරෙන කං until the stomach is full

භාර්යාව wife

බාරොන් Baron, (a name)

බුලත් betel leaves

බුලත් අත forty betel leaves

බුලත් දුංකොළ betel and tobacco

මල්ලි younger brother

මිරිස් red pepper

ලකුණ sign, symbol

ලුණු salt

ලුණුමිරිස් a preparation made of red pepper, salt, onion etc.

වඳිනවා to worship

වැඩිමල් older

වැඩිහිටියො older people

සැරයක් once, an instance

සිරිත custom

සිරිත් විරිත් customs and manners

සෙල්ලමට for fun

## 4. සිංහලයන්ගෙ ඉතිහාසෙ

සිංහලයො ලංකාවට ආවෙ ක්‍රිස්තු වර්සෙන් ඉස්සර පන්සිය හතලිස් තුනේදි. සිංහලයන්ගෙ මුල් රජ්ජුරුවන්ගෙ නම 'විජය'. විජය තමන්ගෙ යාලුවො හත් සීයකුත් එක්ක ලංකාවට ඇවිල්ලා ලංකාවෙන් කසාදයක් බැඳගන රජ කරන්න පටන්ගත්තා. නමුත් විජයට දරුවො උන්නෙ නෑ. විජයගෙන් පස්සෙ විජයගෙ බෑනා කෙනෙක් ලංකාවට ඇවිල්ලා රජකම බාරගත්තා. ඒ රජ්ජුරුවන්ගෙ නම 'පංඩුකාබය'. විජය ගැන නොයෙක් කටකතා තියෙනවා, නමුත් ඒවා විස්වාස කරන්න අමාරුයි. එක කතාවක හැටියට විජයගෙ සීයා සිංහයෙක් ලු!

ලංකා ඉතිහාසෙ හරිහැටි දැනගන්න පුලුවන් බුද්දාගම ගෙනාවාට පස්සෙයි. ලංකා-වට බුද්දාගම ගෙනාවෙ ක්‍රිස්තු වර්සෙන් ඉස්සර තුන්වෙනි සතවර්සෙ. ලංකාවට බුද්දාගම ගෙනාවෙ ඉන්දියාවෙ උන්නු අසෝක කියන රජ්ජුරුවන්ගෙ පුතා, මහින්ද හාමුදුරුවො. බුද්දාගම ගේන කොට ලංකාවෙ රජ කලේ දෙවනපෑතිස් රජ්ජුරුවො. ලංකාවෙ රජ කරපු වැදගත් රජවරු තමයි දුටුගැමුනු, විජයබාහු, පරාක්‍රමබාහු කියන රජවරු. පලවෙනි සතවර්සෙ හරියෙදි දෙමලු අනුරාදපුරේ අල්ලා ගත්තා. විසාල යුද්දයක් කරලා රට බේරාගත්තෙ දුටුගැමුනු රජ්ජුරුවො. ලංකාව පොඩි කොටස්වලට බෙදිලා තියෙන කාලෙදි පරාක්‍රමබාහු රජ්ජුරුවො බොහොම මහන්සිවෙලා ලංකාව එක්සත් කෙරුවා.

ක්‍රිස්තු වර්සෙත් එක්දාස් පන්සිය පහේදි පුර්තුගීසි ලංකාවට ආවා. ඒ ඇවිල්ලා මුහුබඩ පලාත් අල්ලාගන්න පටන්ගත්තා. ඊට පස්සෙ ලන්දේසි ආවා. එක්දාස් අටසිය පාලහේදි ඉංගිරිසිකාරයො ලංකාව සේරම අල්ලාගත්තා. ඉංගිරිසිකාරයො ලංකාවෙ දියුනුවට හුඟක් වැඩ කලා.

ලංකාවට ආයෙත් නිදහස ලැබුනෙ එක්දාස් නමසිය හතලිස් අටේදි. දැන් ලංකාවෙ ආංඩුක්‍රමේ එංගලන්තෙ ආංඩුක්‍රමේට සමානයි. අපේ මන්ත්‍රීවරු තෝරන්නෙ අපි. ඒ නිසා මන්ත්‍රීවරු අපේ දියුනුවට වැඩ කරන්න බැඳිලා ඉන්නවා. දැනට ලංකාවෙ ප්‍රදාන රස්සාව ගොවිතැන. නමුත් ලංකාවෙ හුඟක් කර්මාන්ත කරන්න පුලුවනි. ඒ නිසා ආංඩුව අලුත් කර්මාන්ත ඇතිකරන්න මහන්සි ගන්නවා. අගමැති කමට ගෑනු කෙනෙක් පත්කරපු පලවෙනි රට ලංකාව බව කවුරුත් දන්නවා.

අගමැතිකම   Prime Ministership

අල්ලාගන්නවා   to conquer

අසෝක Asoka, a name

ආයෙත්   again

ආංඩුක්‍රමේ   method of government

ඇතිකරනවා   to introduce, set up, bring into being

ඉතිහාසෙ   history

එක්සත් කරනවා   to unite

කටකතා   legends

කතාව   story

කර්මාන්තෙ   industry

කවුරුත්   everyone

කසාදෙ marriage

කසාදෙයක් බැඳගත having obtained a wife

කොටස   portion, section

ගෑනුකෙනෙක්   a woman

තෝරනවා   to choose

දැනගන්නවා   to get to know

දියුනුව   development

දුටුගැමුනු   Dutugemunu, a name

දෙමළු   Tamils

දෙවනපෑතිස් Devanapetis, a name

නිදහස   independence, freedom

පත්කරනවා   to appoint

පරාක්‍රමබාහු   Parakramabahu, a name

පංඩුකාභය Pandukabhaya, a name

පුර්තුගීසි   Portuguese

පොඩි   little, small



ප්‍රධාන   chief

බාරගන්නවා   to take over

බැඳිලා ඉන්නවා   to be in duty bound

බෑනා කෙනෙක් a nephew

බුද්ධාගම   Buddhism

බෙදෙනවා   to be divided

බේරාගන්නවා   to save, rescue

මන්ත්‍රීවරයා   member (of Parliament)

මහන්සිවෙනවා   to make an effort

මහින්ද හාමුදුරුවො   the Venerable Mahinda

මුල්   first, earliest

මුහුදුබඩ   coastal

යාලුවා   friend

යුද්දෙ   war

රජකම   kingship

රජකරනවා to rule as king

රජවරු   kings

රජ්ජුරුවො   king

ලන්දේසි   the Dutch

ලංකා ඉතිහාසෙ Ceylon history

ලැබෙනවා   to get

විජය Vijaya, a name

විජයබාහු   Vijayabahu, a name

විස්වාස කරනවා   to believe, trust

සමාන   similar

සිංහයා   lion

සිංහලයා   Sinhalese man

සීයා   grandfather

හරියෙදි in about ...., circa

හරිහැටි properly



## 5. බමුනාගෙයි එළුවාගෙයි කතාව

දවසක් බමුනෙක් බොහොම දුර ගමකට ගිහිල්ලා බොහොම අමාරුවෙන් එළුවෙක් සොයාගත්තා. බමුනා බොහොම සන්තෝසෙන් එළුවා කර තියාගන ආපහු එන්න පටන්ගත්තා. හොරු තුන්දෙනෙකුට මේක ආරංචි උනා. හොරු හරි කපටියි. හොරු තුන්දෙනා බමුනා රවටාලා එළුවා ගන්න විදියක් කල්පනා කෙරුවා.

තුන්දෙනා බමුනා එන පාරෙ තුන් පලක නැවතුනා. පලවෙනි මිනිහා බමුනා දැක්ක හැටියෙ පාරෙන් අයින්වෙලා බමුනාට කතාකරලා 'අනේ, මේ බල්ලෙක් කර තියාගන යන්නෙ මොකද? බ්‍රාහ්මනයෙක් බල්ලෙක් කර තියාගන යනඑක කොච්චර නරකද! අනේ, ඔය බල්ලා අහකට වීසි කරන්න.' කියලා කිව්වා. බමුනා ඒ කතාව පිලිගත්තෙ නෑ. තව ටික දුරක් යන කොට බමුනාට දෙවෙනි හොරා හම්බ උනා. ඒ හොරාත් පාරෙන් අයින් වෙලා 'මේ කිලුටු බල්ලෙක් කරතියාගන යන්නෙ මොකද? මේ කැත සතා වීසි කරන්න.' කියලා කිව්වා. බමුනාට ටිකක් සැක හිතුනා. මිනිහා සතා අතගාලා බැලුවා. ඌට අං තියෙනවා; කුර තියෙනවා; පොඩි රැවුලකුත් තියෙනවා. බල්ලන්ට අං නෑ; කුර නෑ; රැවුලකුත් නෑ. ඒක නිසා මිනිහා හොරාගෙ කතාව පිලිගන්නෙ නැතුව යන්න පටන්ගත්තා. තව හැතැප්ම බාගයක් විතර යනකොට මිනිහාට තුන්වෙනියා හම්බඋනා. ඒ හොරා බිම වැටිලා වැඳලා 'අනේ, හාමුදුරුවනේ, මේ කැත සතා කර තියාගන යනඑක නින්දාවක් නේද? අනේ, මූ අහකට වීසිකරලා යන්න.' කියලා කියන්න පටන්ගත්තා.

ඒ පාර බමුනා ඒ කතාව පිලිගත්තා. 'තුන් දෙනෙක් ම මේ සතා බල්ලෙකුයි කියලා කිව්වා. ඒක නිසා මූ එළුවෙක් වෙන්න බෑ. මම වගේ බමුනෙක් මේ කැත බල්ලා අරගන ආවෙ මොකටද?' කියලා මිනිහා එළුවා පැත්තකට වීසිකරලා ගඟකට බැහැලා නාලා ගෙදර ගියා. හොරු තුන් දෙනා එළුවා අල්ලාගන මරාලා බඩ පිරෙන කං එළුමස් කෑවා.

අතගානවා to touch, rub

අමාරුවෙන් with difficulty

අයින්වෙනවා to move to one side

අහකට away

අං horns

ආපහු back (as in 'go back')

ආරංචි වෙනවා to hear, get to know

එළුවා goat

කපටි cunning

කර තියාගන placing on the shoulder

කල්පනා කරනවා to think

කැත ugly

කිලුටු dirty

කුර hooves

තුන් පලක in three places

තුන්වෙනියා the third person

දැක්ක හැටියෙ as soon as (he) saw

නරක bad

නින්දාව insult

පිළිගන්නවා to accept

බමුනා Brahman

බල්ලා dog

බිම floor

බිම වැටෙනවා to fall on the ground

බ්‍රාහ්මනයා Brahman

මරනවා to kill

මූ this animal

රවටනවා to deceive

රැවුල beard

විසිකරනවා to throw

සතා animal

සන්තෝසෙන් with delight



සැක හිතෙනවා to feel doubtful, suspect

සොයාගන්නවා to find

හාමුදුරුවනේ O, Venerable Sir!

හොරා thief

## 6. සිංහල අවුරුද්ද

සිංහල අවුරුද්ද කියන්නෙ අප්‍රියෙල් මාසෙ දහතුන්වෙනිදා. ඒකට සිංහල අලුත් අවුරුද්ද කියලාත් කියනවා. එදාට මිනිස්සු බොහොම විනෝද වෙනවා. බොන මිනිස්සු ඕනවාට වැඩියෙ බීලා කෝලාහල කරනවා. දුප්පත් මිනිස්සු නයට සල්ලි ඉල්ලා ගන සූදු කෙලිනවා. සූදු කෙලලා පරාද උනාම ඒ මිනිස්සු හුඟක් අමාරුවලට වැටෙ-නවා. සමහරු ගෙවල් දොරවල් හිටං උකස් තියලා සූදු කෙලිනවා. අවුරුද්ද කිට්ටු වෙන කොට සමහරු පිස්සො වගේ වෙනවා.

සිංහල අවුරුද්ද කිට්ටු වෙන කොට පුංචි ළමයින්ට හරියට තෑගි හම්බවෙනවා. පුංචි ළමයි සිංහල අවුරුද්ද දාට අලුත් ඇඳුම් අඳින්න ඕන. වැඩිහිටි නෑදෑයො පුංචි ළමයින්ට තෑගිබෝග අරං එන නිසා පුංචි ළමයි නෑදෑයො එනකං බලාගන ඉන්නවා. හුඟක් ළමයි අවුරුද්ද දාට අලුත් ඇඳුම් ඇඳගන රතිඤ්ඤා පත්තුකරනවා. රතිඤ්ඤා පත්තුකරන සද්දෙ නිසා කන් දෙක බිරිවෙන්න හදනවා. ගමේ ළමයි කට්ටිය එක තැනකට එක්කහුවෙලා නොයෙක් සෙල්ලම් කරනවා.

අවුරුද්ද ළංවෙන කොට අම්මාලා හොඳ හොඳ කෑම ජාති හදන්න පටන්ගන්නවා. අප්‍රියෙල් මාසෙ පටන්ගන්නත් ඉස්සෙල්ලා අපේ අම්මා කැවිලි ජාති මහ ගොඩක් හදලා පෙට්ටිවල පුරවනවා. කිට්ටුව පාත මිනිස්සු සේරම දහතුන්වෙනිදාට අවුරුද්ද කන්න අපේ ගෙදරට එනවා. අම්මා ඒ සේරටම බත් මාලුයි කැවිලි පෙවිලියි දීලා සංග්‍රහ කරනවා. අපිත් නෑදෑයන්ගෙ ගෙවල්වලට ගිහිල්ලා නොයෙක් ජාති කනවා.

අවුරුද්දට මට හරියට අලුත් ඇඳුම් හම්බවෙනවා. අම්මායි තාත්තායි මට හැම අවුරුද්දෙම කලිසමකුයි කමිසෙකුයි අරන් දෙනවා; ආච්චි සරමක් අරන් දෙනවා; මාමායි බාප්පායි දෙන්නාත් ඇඳුම් මොනවා හරි අරන් දෙනවා. මට හුඟක් සෙල්ලම් බඩුත් හම්බවෙනවා. ගිය අවුරුද්දෙ රතිඤ්ඤා පත්තුකරන්න ගිහිල්ලා මගේ අතත් පිච්චුනා. එයින් පස්සෙ තාත්තා මට රතිඤ්ඤා පත්තුකරන්න ඉඩ දෙන්නෙ නෑ. ඒත් මම ඉඳලා හිටලා තාත්තාට හොරා රතිඤ්ඤා කරලක් දෙකක් පත්තුකරනවා.

අත   hand, arm

අඳිනවා   to wear

අරන් එනවා to bring (things)

අරන් දෙනවා to buy (for someone else) as a present

අවුරුද්ද කනවා to hold a new year feast

ආච්චි grandmother

ඇඳුම් clothes, garments

ඉස්සෙල්ලා before

උකස් තියනවා to pawn

එක්කහුවෙනවා to gather (intr)

ඕනවාට වැඩියෙ more than necessary

කට්ටිය group (of people)

කන ear

කමිසෙ shirt

කරල one, as in one firework

කලිසම pair of trousers

කැවිලි sweetmeats, cakes etc

කැවිලි පෙවිලි sweetmeats and so on of various kinds

කිට්ටුව පාත in the neighbourhood

කිට්ටු වෙනවා to get close

කෝලහල කරනවා to quarrel

ගෙවල් දොරවල් houses and property

ගොඩක් a lot

තාත්තාට හොරා without the knowledge of the father

තෑගි gifts

තෑගි බෝග gifts of various kinds

පත්තු කරනවා to burn, kindle, light

පරාද වෙනවා to be defeated

පිච්චෙනවා to be burnt

පිස්සා mad man

පුරවනවා to fill (trans)



පෙට්ටිය box

බත් මාලු rice and curries

බලාගන ඉන්නවා to wait for, expect

බීරිවෙනවා to become deaf

මහ ගොඩක් a great quantity

රතිංඤා crackers, fireworks

රතිංඤා කරල cracker, firework

ළං වෙනවා to get close

වැඩිහිටි elderly, older

විනෝද වෙනවා to enjoy

සද්දෙ noise

සරම sarong

සංග්‍රහ කරනවා to treat, entertain (with food and drink)

සිංහල අලුත් අවුරුද්ද Sinhalese new year

සිංහල අවුරුද්ද Sinhalese new year

සූදු කෙලිනවා to gamble

සෙල්ලම් කරනවා to play (games)

සෙල්ලම් බඩු toys

හිටං even

## 7. පොත් ලිවීම

පොත් ලියන එක ලේසි වැඩක් නෙවි. ලියන්න ඉස්සෙල්ලා ලියන්න ඕන දේවල් කල්පනා කරන්න ඕන; කල්පනා කරලා ලියන්න ඕන විදිය හිතාගන්න ඕන. ඊ ලඟට ලියන්න ඕන කරුනු කොටින් සටහන් කරගන්න ඕන. ලියන්න පුලුවන් වෙන්නෙ එතකොටයි. පොත් ලියන්න වෙලාවත් හුඟක් ගතවෙනවා. පොතක අකුරු කොච්චර තියෙනවා ද! පොත් ලියන මිනිහා ඒ සේරම අකුරු තමන්ගෙ අතින් ලියන්න ඕන. අකුරෙන් අකුර ලියලා පිටු දෙතුන් සීයක් ලියන්න ඕන. ඒකට කොච්චර වෙලා ගත-වෙනවා ද! වචනෙක අකුරු කීපයක් තියෙනවා. පේලියක වචන කීපයක් තියෙනවා. සමහර විට එක වාක්‍යයක් පේලි කීපයක් දිගයි. පිටුවක පේලි හුඟක් තියෙනවා. පොතක පිටු සිය ගානක් තියෙනවා. ඒත් සමහර කත්‍රෑවරු පොත් විස්සක් තිහක් ලියලා තියෙනවා. කොච්චර අමාරු වැඩක් ද!

සමහර කත්‍රෑවරුන්ට අවුරුද්දකට පොතක් දෙකක් ලියන්න පුලුවන්. නමුත් සමහරුන්ට අවුරුදු දෙකකට තුනකට සැරයක් වත් පොතක් ලියන්න අමාරුයි. ඒ, කත්‍රෑවරු දක්ෂ නැති නිසා නෙවි;, ලියන්න අදහස්කරන දේවල් ව්‍යාකූල නිසා.

සමහර රටවල්වල පොත් හොඳට විකිණෙනවා. නමුත් සමහර රටවල්වල පොත් විකිනෙනවා මදි. පොත් විකිනෙන්නෙ නැති උනාම කත්‍රෑවරුන්ට සෑහෙන්න ආදායමක් හම්බවෙන්නෙ නෑ. ඒක නිසා හුඟක් පොත් කත්‍රෑවරු දුප්පත් මිනිස්සු. පොත් වෙලඳාමෙන් පෝසත් වෙන්නෙ කත්‍රෑවරු නෙවි, සාප්පු කාරයො. සමහර රටවල්වල පොත් ලියන මිනිස්සුන්ට ආංඩුවෙන් ආදාර කරන්නෙ ඒ නිසායි.

පොත් ලියන්නෙ අදහස් ප්‍රකාස කරන්න. අදහස් ප්‍රකාස කරන්නෙ මිනිස්සුන්ට තේරුම්ගන්න. ඒක නිසා පොත් ලියන කොට පැහැදිලිව ලියන්න ඕන. පැහැදිලි නැති පොත් තේරුම්ගන්න අමාරුයි. මිනිස්සු පැහැදිලිව ලියන කත්‍රෑවරුන්ට කැමතියි. පැහැදිලිව ලියන කත්‍රෑවරු හොඳ කත්‍රෑවරු. හොඳ කත්‍රෑවරුන්ගෙ පොත් හොඳට විකිණෙනවා. ඔහේ හොඳ කත්‍රෑවරයෙක් වෙන්න කැමතිද? එහෙනම් දැන් ඉඳලාම පැහැදිලිව ලියන්න පුරුදුවෙන්න. එතකොට ඔහේටත් දක්ස කත්‍රෑවරයෙක් වෙන්න පුලුවනි.

අකුරෙන් අකුර letter by letter

අදහස් ideas

අදහස් කරනවා to intend

ආධාර කරනවා to support

කර්තෘවරයා author

කරුණු facts

කොටින් in short, briefly

ගතවෙනවා to be spent (time)

දක්ෂ clever

දැන් ඉඳලා ම from right now

දිග long

පැහැදිලිව clearly

පිට page

පිටු pages

පුරුදු වෙනවා get accustomed to

පුලුවන් වෙනවා to become possible

පේලිය line

පොත් සාප්පුකාරයා book seller

ප්‍රකාස කරනවා to express

ලිවීම writing

වාක්‍යය sentence

ව්‍යාකූල complicated

සටහන් කරගන්නවා to jot down (for one's own use)

සිය ගානක් some hundreds

හිතාගන්නවා to think, determine



## 8. නුවර පෙරහැර

බුද්ධාගමේ වැදගත් දවස්වලට පෙරහැරවල් යන එක සිරිතක්. වෙසක් පෝය දාට රටේ හැම නගරෙකම පෙරහැරවල් යනවා. පොසොන් පෝයටත් පෙරහැරවල් පවත්තනවා. වෙසක් පෝය බුදු හාමුදුරුවො උපන් දවස. පොසොන් පෝය ලංකාවට බුද්ධාගම ගෙනා දවස.

නුවර පෙරහැර පවත්තන්නෙ ඇසළ පෝයට. ඇසළ පෝය කියන්නෙ ජුලි මාසෙ පාලොස්සක දවස. නුවර පෙරහැර ලංකාවෙ ප්‍රසිද්ධ ම පෙරහැර. ඒක බලන්න රටේ හැම තැනින් ම සෙනග එනවා. පෙරහැර කාලෙට නුවර යන්න එන්න වත් බෑ. ඒ තරමට සෙනග රැස්වෙනවා. නුවර පෙරහැර සිංහල රජ කාලෙ ඉඳලා පවත්තන උත්සවයක්. තාමත් ඒක පවත්තන්නෙ පුරාන විදියටමයි.

මේ පෙරහැර දවස් කීපයක් පවත්තනවා. පෙරහැර යන්නෙ රෑට; අන්තිම දවසෙ දවාලටත් යනවා. රෑට පවත්තන පෙරහැරට කියන්නෙ රෑ පෙරහැර. රෑ පෙරහැර දවල් පෙරහැරට වැඩියෙ ලස්සනයි. නුවර පෙරහැර ප්‍රසිද්ධ අලින්ටයි. හැම අවුරුද්දෙම පෙරහැරට අලි හතලිහක් පනහක් ගෙනියනවා. මේ අලි හොඳට සැරසුවාම බලන්න ලස්සනයි. නුවර පෙරහැරේ උඩරට නැටුම් හරියට තියෙනවා. බෙරකාරයොයි නැට්ටුක්කාරයොයි දෙතුන් සීයක් විතර යනවා.

නුවර පෙරහැර කියන්නෙ දළදා පෙරහැර. බුදු හාමුදුරුවන්ගෙ දළදාව තියෙන්නෙ නුවර දළදා මාලිගාවෙ. මේ පෙරහැර පවත්තන්නෙ දළදා වහන්සෙට ගරු කරන්න. පෙරහැර දළදා මාලිගාවෙන් පටන් අරන් නුවර ටවුම වටේ යනවා. දළදා මාලිගාවෙ නිලදාරින් පෙරහැරේ යනවා. ඒ නිලදාරින්ට කියන්නෙ නිලමෙලා. දළදා මාලිගාවෙ ප්‍රදාන නිලදාරියාට කියන්නෙ 'දියවඩන නිලමෙ'.

දළදා මාලිගාව තියෙන්නෙ නුවර වැව අයිනෙ. ක්වීන්ස් හෝටලේ තියෙන්නෙත් ඒ ලඟ. හුඟක් දෙනා පෙරහැර බලන්නෙ ක්වීන්ස් හෝටලේ උඩ ඉඳගන. ඔහේ නුවර ගියොත් ක්වීන්ස් හෝටලේ ඉඳලා වැව දිහා බලන්න. හරි ලස්සනයි. පෝය දාට හඳ එලියට වැව හරිම ලස්සනයි. ක්වීන්ස් එකේ ඉඳලා පෝයදාට දළදා වඩින්න යන මිනිස්සුත් බලන්න පුලුවනි. නුවර ලස්සන පෝයදාට තමයි.

අන්තිම final

අලියා elephant

ඇසළ පෝය full moon day of July

උපන් දවස date of birth, birth day

එළිය light

ක්වීන්ස් හෝටලේ the Queen's Hotel

තාමත් still

දලදා පෙරහැර the procession of the Tooth Relic

දලදා මාලිගාව the Temple of the Tooth

දලදාව the Tooth Relic

දලදා වඳිනවා to worship the Tooth Relic

දලදා වහන්සෙ the Holy Tooth Relic

දවල් පෙරහැර day procession

දියවඩන නිලමෙ Diyawadana Nilame

දිහා at

නැට්ටුක්කාරයා dancer

නිලධාරියා officer

නිලමෙ Nilame, an ancient word meaning 'officer' or 'chief'

පාලොස්සක දවස full moon day

පොසොන් the month of June, a Buddhist festival

පොසොන් පෝය full moon day of June

බුද්දාගම Buddhism

බෙරකාරයා drummer

රැස්වෙනවා to assemble (intr)

වටේ around

වැව lake

වෙසක් පෝය **full moon day of May**

හඳ එළිය moon light

හරි ලස්සනයි extremely beautiful



## ୨. ගංවතුර

ලංකාවට හරියට වහිනවා. සමහර පලාත්වලට අවුරුද්දකට අඟල් පනහක් හැටක් වරුසාව හම්බවෙනවා. උතුරු පලාතටයි නැගෙනහිර පලාතටයි ඒ තරම් වහින්නෙ නෑ. හුඟක් වහින්නෙ මැයි ඉඳලා අගෝස්තු විතර වෙන කං තමයි. ඒ කාලෙට සමහර පලාත්වල ගංවතුර ගලනවා. එකදාස් නමසිය හතලිස් ගනන්වලදි නුවර පලාතෙ විසාල ගංවතුරක් ගැලුවා. ඒ ගංවතුරට පේරාදෙනිය සේරම යටඋනා. ගෙවල් කැඩුනා; ගෙවල්වල තිඋන බඩුමුට්ටු පා උනා. ඒක නිසා මිනිස්සුන්ට හුඟක් හිරිහැර උනා.

ගොවිතැන් පූදින කාලෙට ගංවතුර ගැලුවොත් ගොයම් සේරම කුනුවෙනවා. එහෙම උනොත් ගොවියන්ට හුඟක් පාඩුවෙනවා. ගම්බද ගොවියො සාමාන්‍යයෙන් බොහොම දුප්පත් මිනිස්සු. ඒක නිසා ගංවතුරෙන් පාඩු උනොත් ඒ මිනිස්සුන්ට ආංඩුවෙන් ආදාර කරනවා. ගංවතුරට ගෙවල් කැඩුනොත් මිනිස්සුන්ට ඉන්න තැනක් නැතිවෙනවා. පේරා- දෙනියෙ ගංවතුරෙන් හුඟක් දෙනෙකුට ඉන්න හිටින්න තැනක් නැතිඋනා. ඒ මිනිස්සුන්ටත් ආංඩුවෙන් සැලකුවා. ගංවතුරෙන් රටකට පාඩු සිද්ද උනොත් පිට රටවල්වල ආංඩු- වලින් ඒ රටට ආදාර කරනවා. ලංකාවෙ ගංවතුර ගැලූ කාලෙත් පිට රටවල් කීපෙ- කින්ම ලංකාවට ආදාර හම්බ උනා. වෙන රටක ගං වතුර ගැලුවොත් ලංකාවෙනුත් පුලුවන් තරම් ආදාර දෙනවා.

වරුසාව අඩු පලාත්වල ගංවතුර ගලන්නෙ නෑ. නමුත් ඒ පළාත් වී ගොවිතැනට හොඳනෑ. ඉස්සර සිංහල රජ කාලෙ උතුරු පලාතෙ වී ගොවිතැන් කෙරුවෙ වැව්වලින් වතුර අරගන. වැව් කියන්නෙ මොනවාද දන්නවාද? වැස්සෙන් හම්බවෙන වතුර ආර- ක්සා කරගන්න බැඳපු ජලාස. ඒවා බොහොම විසාලයි. සමහර වැව් අක්කර කීපයක් විසාලයි. වැව්වලින් වැඩිහරිය තියෙන්නෙ අනුරාදපුරේ. ඔයාලා ලංකාවට ගියොත් අනුරාදපුරේ පැත්තට ගිහිල්ලා වැව් බලන්න ඕන. සමහර වැව් බැඳලා තියෙන්නෙ ක්‍රිස්තු වර්සෙන් පලවෙනි සතවර්සෙ හරියෙදි. ඒ කාලෙ බොහොම දක්ස සිංහල ඉංජිනේරු- වො ඉඳපු බව මේ වැව්වලින් පේනවා. එහෙම වැව් බැන්දෙ නැත්තං වරුසාව අඩු පලාත්වල ගොවිතැන් කරන්න බැරිවෙන්න තිඋනා. නමුත් ඒ වැව් නිසා අක්කර දහස් ගානක් වගා කරලා රටට ඕන ආහාර සපයාගන්න පුලුවන් උනා. ගංවතුර ගැලුවත් රටට පාඩුයි; වැස්ස නැතිඋනත් රටට පාඩුයි.

අක්කරේ acre

අඟල inch

ආධාරෙ support

ආරක්ෂා කරගන්නවා to take care of

ආරක්ෂාව protection

ආහාර food

ඉන්න හිටින්න to live and survive

ඉංජිනේරුවා engineer

එක්දාස් නමසිය හතලිස් ගනන්වලදි during the 1940's

කැඩෙනවා to be broken

කුනුවෙනවා to go rotten, go bad

ගලනවා to flood (intr)

ගංවතුර flood

ගංවතුර ගලනවා to flood (intr)

ගොයම් rice plants

ගොවියා farmer

ජලාසෙ reservoir

දහස් ගානක් some thousands

නැතිවෙනවා to be lost

පාඩුව loss

පාඩු වෙනවා to lose (income)

පා වෙනවා to float

පිටරට foreign country

පූදිනවා to blossom for the first time

බඩුමුට්ටු goods and belongings

බැරිවෙනවා to become impossible

යටවෙනවා to go under water (land etc.)

වගා කරනවා to cultivate (land)



වතුර water

වරුසාව rain

වැව tank

සපයා ගන්නවා to obtain for one's own use, produce

සලකනවා to look after

සිද්ද වෙනවා to happen

හිරිහැරේ trouble

# 10. ගොවිතැන් කිරීම

ලංකාවෙ ක්‍රම දෙකකට ගොවිතැන් කරනවා. එකක් ගොඩ ගොවිතැන. අනිත් එක මඩ ගොවිතැන. ගොඩ ගොවිතැන කියන්නෙ තෙතමනේ අඩු, වරුසාව අඩු ප්‍රදේසවල කරන ගොවිතැන. උඳු, මුං, තල වගේ දාන්‍ය ජාතියි එලවලු ජාතියි වවන්නෙ ගොඩ. මඩ ගොවිතැන කියන්නෙ වතුර තියෙන ගොහොරු බිම්වල කරන ගොවිතැන. වී වගා කරන්නෙ මඩ බිම්වල. වී ගොවිතැන තමයි ලංකාවෙ ප්‍රදානම ගොවිතැන. සමහර පලාත්වල අවුරුද්දකට දෙසැරයක් වී වපුරනවා. සමහර පලාත්-වල වපුරන්නෙ එක සැරයයි. දෙපාරක් වපුරන බිම්වලින් පෙබරවාරි මාසෙයි, අගෝස්තු මාසෙයි අස්වැන්න දෙකක් ගන්න පුලුවනි. වී ගොවිතැන තරමක් අමාරු වැඩක්. දවස් තුන හතරකට සැරයක් වෙල්වල වතුර බඳින්න ඕන. ආයෙත් දවස් තුන හතරකින් ඒ වතුර අස් කරන්න ඕන. ඒ වගේම වල් පැල අස් කරන්න ඕන. මේ විදියෙ වැඩ කරන්න තියෙන නිසා ගොවියා නිතරම ගොයිපල දිහාවට යන්න ඕන.

ලංකාවෙ මිනිස්සුන්ගෙ ප්‍රදාන ආහාරෙ බත්. සිංහලයො එලෝලුවක් හරි දෙකක් හරි එක්ක දවසට දෙසැරයක් බත් කනවා. උදේටත් හාල් පිටිවලින් හදාපු මොනවා හරි කනවා. සමහරු උදේටත් බත් කනවා. මූදුබඩ මිනිස්සු මාලු කනවා. නමුත් රට මැද හරියෙ ඉන්න මිනිස්සු ඒ තරම් මාලු කන්නෙ නෑ. බුද්දාගම් කාරයො මස් කනවා අඩුයි. ඒත් රට මැද ඉන්න මිනිස්සු පාත රට ඉන්න මිනිස්සුන්ට වැඩියෙ මස් කනවා. ලංකාවෙ මිනිස්සු කට දන කෑම කන්න බොහොම කැමතියි. එලඹුලු මාලු හදන කොට මිරිස් තුනපහ හුඟක් පාවිච්චි කරනවා. සිංහල කෑම බටහිර අයට කන්න අමාරුයි. ඉන්දියාවෙ මිනිස්සු හිටං සිංහල කෑම සැර වැඩියි කියලා කියනවා. දුප්පත් මිනිස්සු හොඳ එලවලු මස් කන්නෙ නෑ. පරිප්පු කරවල වගේ දේවල් තමයි ඒ මිනිස්සු නිතරම කන්නෙ. නමුත් ලංකාවෙ මිනිස්සුන්ට එක වාසියක් තියෙනවා. කොහේට ගියත් හොඳ දෙයක් සොයා ගන්න පුලුවනි. කොළ ජාති, පලතුරු ජාති ලංකාවෙ හැම තැනම වැවෙනවා. ඒක නිසා ගම්බද මිනිස්සුන්ට කෑමෙන් බාදාවක් නෑ.

අස් කරනවා to remove

අස්වැන්න harvest

උඳු a kind of cereal

කරවල dried fish

කුඹුර rice field

ක්‍රමේ method

ගොඩ ගොවිතැන high land cultivation

ගොයිපළ rice field

ගොවිතැන් කරනවා to cultivate, farm

ගොහොරු marshy

තල a kind of cereal

තුනපහ curry powders

තෙතමනේ dampness

ධාන්‍ය grains

දිහාවට towards

පරිප්පු lentils

පාතරට low country

පැළේ plant

පිටි flour

ප්‍රදේශය area

මඩ mud

මඩ ගොවිතැන cultivation in marshy lands

මුං a kind of cereal

වපුරනවා to sow seeds

වල්පැළ weeds

වවනවා to grow (trans)

වාසිය gain

වැවෙනවා to grow (intr)

හාල් uncooked rice



## 11. ලංකාවෙ දේශගුනේ

ලංකාව නිරක්ෂෙට කිට්ටු නිසා ඔහේ හිතනවා ඇති ලංකාව හුඟක් උස්න රටක් කියලා. නමුත් ලංකාව එච්චර උස්න නෑ; වටේටම මූද තියෙනවා නේ. ඒක නිසා රස්නෙ දැනෙනවා අඩුයි. කොලඹ සාමාන්‍යයෙන් උස්න නගරයක්. නමුත් හවස් වෙලා ඉර බහින කොට කොලඹ බොහොම අගෙයි. අවල් කාලෙත් මූදු හුලඟ නිසා රස්නෙ දැනෙන්නෙ නෑ. කොලඹ රස්නෙ අංසක අසූ පහකට වැඩියෙ ඉහල නගින්නෙ බොහොම කලාතුරකින්. හවසට ගෝල්පේස් පිට්ටනියට ගිහිල්ලා බංකුවක් උඩින් හරි බිම තනකොල උඩින් හරි වාඩි උනාම මූද දිහා බලාගන ඕන තරම් වෙලා ඉන්න පුලුවන්.

ලංකාව පුංචි රටක්. සේරම වර්ග හැතැප්ම විසිපන්දාහයි. ඒත් හැම තැනම දේසගුනේ එක වගේ නෙවි. රට මැද හරියෙ තියෙන කඳු නිසා ලංකාවෙ දේසගුනේ නොයෙක් නොයෙක් විදියට වෙනස් වෙලා තියෙනවා. ලංකාවට හිම වැටෙන්නෙ නෑ. නමුත් නුවරඑලිය, දියතලාව, බංඩාරවෙල වගේ පලාත් සමහර කාලවලදි අංසක හතලිහකට වැඩියෙ රස්නෙ නෑ. උඩරට පලාත් සාමාන්‍යයෙන් පාතරට පලාත්වලට වැඩියෙ සීතලයි. කොලඹ ඉඳලා නුවරට අවසක කෝච්චියෙන් යන්න. ඔහේට එතකොට තේරේවි ටිකින් ටික දේසගුනේ වෙනස් වෙන හැටි. සීතල රටවල්වලින් ඇවිල්ලා ඉන්න මිනිස්සු නිවාඩු ගතකරන්න උඩරටට යන්නෙ ඒ නිසායි.

දකුනු පලාතයි බස්නාහිර පලාතයි තමයි ලංකාවෙ සශ්‍රීක පලාත්. අවුරුද්දෙන් වැඩිහරිය වරුසාව තියෙන නිසා ඒ පලාත්වල තෙතමනේ තියෙනවා. ඒක නිසා ගස් කොලන් හොඳට වැවෙනවා. දකුනු පලාත බස්නාහිර පලාතටත් වැඩියෙ සශ්‍රීකයි. රට මැද කඳුකර පලාතෙත් වැව්ලි හොඳට වැවෙනවා. දකුනු පලාත බස්නාහිර පලාතටත් වැඩියෙ සශ්‍රීකනිසා ඒ පලාතෙ තමයි කුඹුරු හුඟක් තියෙන්නෙ. කඳුකර පලාත වැඩියෙ ප්‍රසිද්ද දේසගුනේටයි, වැව්ලිවලට නෙවි. අනිත් පලාත්වල වැව්ලි අඩුයි. උතුරු පලාත ගොවිතැනට හොඳ මදි. එහේට සෑහෙන්න වැස්ස නෑ. ගිනිකොන පැත්තෙයි වයඹ පැත්තෙයි වැස්ස බොහොම අඩුයි. නැගෙනහිර පැත්තටත් වැස්ස හම්බවෙන්නෙ ටිකයි.

ලංකාව ඉන්දියාවට වැඩියෙ බොහොම සශ්‍රීකයි. අහස් යාත්‍රාවකින් ලංකාවෙ

ඉඳලා ඉන්දියාවට යන්න. එතකොට ඔහේට පෙනේවි රටවල් දෙකේ තියෙන වෙනස. කොලඹින් පිටත් උනාම ලංකාවෙ උතුරු කෙලවරට යනකං දිගටම නිල්පාට ගස්කොලන් පෙනේවි. ඊට පස්සෙ නිල්පාට නැතිවෙලා ගුරුපාට පෙනේවි. ඒ ගුරුපාටට පේන්නෙ වියලි ප්‍රදේස. එතනින් එහාට ඉන්දියාවෙ හුඟක් දුර යනකං දිගටම වියලි ප්‍රදේසෙ. දකුනු ඉන්දියාවෙ ගස් කොලන් වැවෙනවා අඩුයි.

වියලි ප්‍රදේසවල හරියට දූවිල්ල තියෙනවා. ලංකාවෙත් සමහර පලාත්වල දූවිල්ල තදයි. නමුත් දකුනු ඉන්දියාවෙදි මම දැකපු දූවිල්ලට සමාන දූවිල්ලක් මම ලංකාවෙ කොතනකවත් දැකලා නෑ. ලංකාවෙ දේසගුනේ මාරුවෙන හැටි බලන්න හොඳ ක්‍රමයක් කියන්න ද? කොලඹ ඉඳලා කෝච්චියෙන් නුවරට යන්න. නුවර ඉඳලා බස් එකකින් හරි කාර් එකකින් හරි නුවරඑළියටයි බංඩාරවෙලටයි යන්න. බංඩාරවෙල ඉඳලා කාර් එකකින් කතරගමට යන්න. ආයෙත් වෙනින් දවසක කොලඹ ඉඳලා කෝච්චියෙන් යාපනේට යන්න. මේ ගමන් ටික ගියාම ඔහේට පෙනේවි ලංකාවෙ දේසගුනේ හැටි. එකක් කියන්න බැරි උනා: අප්‍රියෙල් මාසෙ දවසක සිරිපාදෙ නගින්න අමතක කරන්න එපා. සමනල කන්ද අඩි 7360ක් උස බව ඔහේ දන්නවා, නේද?

අගේ value

අඩිය foot

අමතක කරනවා to forget, put out of mind

අහස් යාත්‍රාව aeroplane

අංසක degrees

ඉර බහිනවා to set (sun)

ඉහල above

උස high, tall

උස්න hot, warm

කතරගම Kataragama, a place in Ceylon

කඳුකර mountainous

කන්ද mountain

කලාතුරකින් rarely



කෙලවර end

ගතකරනවා to spend (time)

ගස්කොලන් trees and so on

ගිනිකොන South-East

ගුරුපාට orange colour, orange coloured

තද hard, strong

තනකොල grass

දැනෙනවා to feel

දියතලාව Diyatalawa, a place in Ceylon

දූවිල්ල dust

දේසගුනේ climate

නගිනවා to climb, ascend

නිරක්සෙ equator

නිල්පාට blue

නුවරඑළිය Nuwara Eliya, a place in Ceylon

පිටත්වෙනවා to set out, start a journey

පිට්ටනිය park

බංකුව bench

බංඩාරවෙල Bandarawela, a place in Ceylon

මාරුවෙනවා to change over, cross over

මූද sea

රස්නෙ heat

වටේටම all round

වයඹ North-West

වැව්ලි vegetation

වියලි dry

වෙනස්වෙනවා to change (intr)

වෙනින් some other

සමනල කන්ද Adam's Peak

සශ්‍රීක fertile

සිරිපාදෙ Sacred Foot print

සීතල cold

හිතනවා to think

හිම snow

හුලඟ wind



## 12. ඩී. ඇස්. සේනානායක තුමා

ලංකාව හුගක් කල් ඉංගිරිසි කාරයො අතේ තිඋනා නේ. ඒ කාලෙ ඉඳලාම ආයෙත් රටට නිදහස ගන්න ලංකාවෙ දේසපාලනඥයො හුගක්ම මහන්සි ගත්තා. සර් පොන්නම්බලම් රාමනාදන්, සර් ජේම්ස් පීරිස්, සර් ඩී. බී. ජයතිලක, ඇෆ්. ආර්. සේනානායක, ඩී. ඇස්. සේනානායක වගේ ජන නායකයො ඉංගිරිසි ආංඩුවත් එක්ක කතාබස් කරලා නිදහස ලබා ගන්න විදියක් කල්පනා කෙරුවා. ඔය අතරෙදි එක්දාස් නමසිය තිස් නමේදි දෙවෙනි ලෝක යුද්දෙ පටන්ගත්තා. යුද්දෙන් පස්සෙ ඉංගිරිසි ආංඩුව යටත් රටවල්වලට නිදහස දෙන්න පටන්ගත්තා. එක්දාස් නමසිය හතලිස් හතේදි ඉන්දියාවට නිදහස දුන්නා. එක්දාස් නමසිය හතලිස් අටේදි ලංකාවට නිදහස දුන්නා. එක්දාස් නමසිය හතලිස් අට වෙන කං ලංකාවෙ තිඋනෙ 'ස්ටේට් කවුන්සිල්' කියන රාජ්‍ය මංත්‍රන සබාව. එතකොට මහ ඇමති තුමා ඩී. ඇස්. සේනානායක තුමා.

ලංකාවට සුදුසු ආංඩුක්‍රමේ මොකක්ද කියලා බලන්න ඉංගිරිසි ආංඩුව කොමිසමක් පත්කෙරුවා. ඒ කොමිසමේ ප්‍රදානියා සෝල්බරි සාමි. ඒක නිසා ඒ කොමිසමට සෝල්බරි කොමිසම කියලා කියනවා. ලංකාව නිදහස් ආංඩුවකට සුදුසුයි කියලා ඒ කොමිසම වාර්තාකෙරුවා. ඒක නිසා ලංකාවට නිදහස ලැබුනා එක්දාස් නමසිය හතලිස් අටේ පෙබරවාරි හතරවෙනිදා. නිදහස හම්බ උනාට පස්සෙ ලංකාවෙ පාර්ලිමේන්තුවක් පිහිටවන්න චන්දයක් විමසුවා. ඒ චන්දෙන් ඩී. ඇස්. සේනානායක තුමාගෙ පක්සෙ ජය ගත්තා. ඒ පක්සෙ නම එක්සත් ජාතික පක්සෙ. ඒක නිසා සේනානායක තුමා නිදහස් ලංකාවෙ පලවෙනි අගමැති තුමා හැටියට පත් උනා.

සේනානායක තුමාගෙ මරනෙ බොහොම කනගාටුදායකයි. උන්නැහෙ හැමදාම උදේ අස්වයා පිට යන එක සිරිතක් වෙලා තිඋනා. දවසක් උදේ අස්වයා පිට යන කොට උන්නැහෙ කලන්ත වෙලා බිම වැටිලා ඉස්පිරිතාලෙට ගෙනිච්චා. ඉස්පිරිතාලෙදි උන්නැහෙට බේත් කරන්න පිට රටවල්වලින් හොඳ හොඳ දොස්තරවරු ගෙන්නුවා. නමුත් සනීප කරන්න බැරිඋනා.

අගමැතිතුමා Prime Minister

අතේ in the hands of

අශ්වයා horse

අශ්වයා පිට යනවා to ride a horse

එක්සත් ජාතික පක්ෂෙ the United National Party

ඔය අතරෙදි in the meantime

කතාබස් කරනවා to discuss, talk over

කනගාටුදායක pathetic, pitiful

කලන්ත වෙනවා to faint

කොමිසම commission

ගෙන්නනවා to import

ඡන්දෙ election, vote

ඡන්දයක් විමසනවා to hold an election

ජනනායකයා leader of people

ජය ගන්නවා to win

තුමා the honorable ....

දේසපාලනඥයා politician

පක්ෂෙ party

පත්වෙනවා to be appointed

පාර්ලිමේන්තුව parliament

පිහිටුවනවා to establish, set up

ප්‍රධානියා chief

බේත්කරනවා to give medical treatment

මරනෙ death

මහ ඇමති chief minister

යටත් රට colony

රාජ්‍ය මන්ත්‍රන සබාව State Council

ලෝක යුද්දෙ world war



වාර්තා කරනවා to report

විමසනවා to enquire

සනීප කරනවා to cure

සර් Sir

සාමි Lord

හුඟක් කල් for a long time

## 13. සිද්දාර්ත කුමාරයා

ක්‍රිස්තු වර්ෂෙන් ඉස්සර හයවෙනි සතවර්ෂෙදි ඉන්දියාවෙ මැද හරියෙ කපිලවාස්තු කියලා නුවරක් තිඋනා. ඒ නුවර සුද්දෝදන කියලා රජකෙනෙක් රජකලා. ඒ රජ්ජුරුවන්ගෙ බිසව මහමායා දේවි. මේ දෙන්නාට පුතෙක් උපන්නා. ඒ ළදරුවා සාස්තර කාරයන්ට පෙන්නුවාම ඒගොල්ල කිව්වා ලු 'මේ දරුවා මහජනයාට යහපතක් කරන්න උපන් කුමාරයෙක්. ඒක නිසා සිද්දාර්ත කියලා නම දෙන්න.' කියලා. ඒ පාර සුද්දෝදන රජ්ජුරුවෝ කුමාරයාට සිද්දාර්ත කියලා නම තිව්වා.

පුංචි කාලෙදි මේ කුමාරයාට සේරම සැප සම්පත් දුන්නා. කවදාවත් දුකක්, වේදනාවක් දැනෙන්න ඉඩදුන්නෙ නෑ. කුමාරයාට ජීවත් වෙන්න බොහොම ලස්සන මාලිගාවල් තුනක් හදවාලා දුන්නා. ඒ තුන අවුරුද්දෙ ඉර්තු තුනටයි. එකක් ග්‍රීස්ම ඉර්තුවට. එකක් වරුසාව කාලෙට. අනිත් එක සීත ඉර්තුවට. කුමාරයා සුදුසු වයසට ආවාම හොඳ පවුලකින් කුමාරිකාවකුත් කසාද බැඳලා දුන්නා. ඒ කුමාරිකාවගෙ නම යසෝදරා. මේ ජෝඩුවට රාහුල කියලා පුතෙකුත් උපන්නා.

සිද්දාර්ත කුමාරයා දවසක් විනෝදෙන් උයනට යන කොට අතරමගදි එක නාකි මිනිහෙක් දැක්කා. මීට ඉස්සර කුමාරයා කවදාවත් නාකි මිනිහෙක් දැකලා නෑ. කුමාරයා ගියේ අස්ව කරත්තෙන්. කුමාරයා කරත්තකාරයාගෙන් ඇහුවා ඒ මිනිහා කුදු ගැහිලා යන්නෙ මොකද කියලා. කරත්තකාරයා කිව්වා 'ඒ නාකි මිනිහෙක්. අපි කවුරුත් නාකි වෙනවා. නාකි උනාම කෙලින් ඇවිදින්න බෑ. බර වැඩක් කරන්න බෑ. පිට කුදුගැහෙනවා. ඇඟ වෙව්ලනවා.' කියලා. ආයෙත් දවසක් උයනට යන කොට මළ මිනියක් ගෙනියනවා කුමාරයාට පෙනුනා. කුමාරයා කරත්තකා රයාගෙන් ඇහුවා 'මේ මිනිස්සු අඬ අඬ පාර දිගේ යන්නෙ මොකද?' කියලා. කරත්තකා රයා කිව්වා 'මේ මළමිනියක්. අපි කවුරුත් මැරෙනවා. උපන් කවුරුත් නාකි වෙනවා, ලෙඩ වෙනවා, මැරෙනවා.' කියලා. ආ, මට එකක් කියන්න බැරි උනා: මළමිනිය දකින්න ඉස්සෙල්ලා දවසක කුමාරයා ලෙඩෙක් ගෙනියනවාත් දැක්කා. එදාත් කරත්තකාරයා ඒක කුමාරයාට විස්තර කරලා දුන්නා. කුමාරයා මේ නාකි මිනිහායි ලෙඩායි මළමිනියයි දැකලා සංසාරෙ ගැන කලකිරුනා.

ආයෙත් දවසක් උයනට යන කොට කුමාරයා මහන වෙච්ච මිනිහෙක් දැක්කා. එතකොට කුමාරයා කරත්තකාරයාගෙන් ඇහුවා 'මේ කහපාට සිවුරක් පෙරවාගන ඉන්න මිනිහා කවුද?' කියලා. කරත්තකාරයා කිව්වා 'මේ හාමුදුරුනමක්. සංසාරෙ දුක දැකලා ඒ මනුස්සයා ගිහිගේ අත ඇරලා ගිහින් මහන වෙලා තියෙනවා.' කියලා.

කුමාරයාට එතකොට සේරම හොඳට තේරුනා. කුමාරයා 'මමත් සංසාරෙ දුක නැති කරන විදියක් කල්පනා කරන්න ඕන. දරු පවුලකුත් එක්ක සැපෙන් ජීවත් වෙලා සංසාරෙ දුක නැති කරගන්න බෑ. ඒක නිසා මමත් ගිහිගේ අතඇරලා යන්න ඕන.' කියලා හිතාගන එලිපත්ත ලඟට ගිහිල්ලා දරුවායි බිසවයි දිහා බලලා සේරම සම්පත් අත ඇරලා ගිහිල්ලා මහන උනා. මහනවෙලා අවුරුදු හයකටත් වැඩියෙ බොහොම මහන්සි වෙලා දුක නැති කරන විදියක් සෙව්වා.

දවසක් වෙසක් මාසෙ පාලොස්සක දා උන්වහන්සෙට ලෝකෙ දුක නැතිකරන විදිය අවබෝද උනා. එදා ඉඳලා උන්වහන්සෙට අපි බුදුහාමුදුරුවොයි කියනවා. 'බුදු' කියන වචනෙ තේරුම 'සේරම වටහාගත්ත තැනැත්තා' කියනඑකයි. හාමුදුරුවො කියලා කියන්නෙ අපි උන්වහන්සෙට ගරු කරන්න ඕන නිසායි.

අඬ අඬ crying

අත අරිනවා to give up

අවබෝද වෙනවා to realize

අස්ව කරත්තෙ horse cart

ආ Oh!

ඇඟ body

ඉර්තුව season

උන්වහන්සෙ He (respectful, religious)

උපදිනවා to be born

උපන් born

උපන්නා was born

උයන park

එලිපත්ත threshold



කපිලවාස්තු Kapilawastu

කලකිරෙනවා to be disgusted

කසාද බඳිනවා to marry

කසාද බැඳලා දෙනවා to give in marriage

කහ පාට yellow

කුදු ගැහෙනවා to become hunch backed

කුමාරයා prince

කුමාරිකාව princess

කෙලින් straight

ගිහිගේ household life

ගිහින් having gone

ග්‍රීස්ම ඉර්තුව hot season

ජෝඩුව pair, couple

තැනැත්තා person

දරු පවුල wife and children

දේවි queen

නම තියනවා, නම දෙනවා to give a name

නාකි old (person)

නාකි වෙනවා to grow old

පෙරවනවා to wear (robes)

බර වැඩ hard work

බිසව queen

බුදු enlightened

බුදු හාමුදුරුවො the Buddha

මනුසස්යා person

මලමිනිය corpse

මහනවෙනවා to become a Buddhist monk

මහමායා දේවි Queen Mahamaya

මාලිගාව palace

මැරෙනවා to die

යසෝදරා Yasodara

යහපත benefit, good

රජ කෙනෙක් a king

රාහුල Rahula

ළදරුවා child, infant

ලෙඩ වෙනවා to become sick

ලෙඩා sick person

ලෝකෙ world

වටහාගන්නවා to understand

විස්තර කරනවා to describe

වෙව්ලනවා to shiver

වේදනාව pain

සංසාරෙ existence

සාස්තරකාරයා astrologer

සැප සම්පත් comforts

සැපෙන් comfortably

සිද්දාර්ත කුමාරයා Prince Siddhartha

සිවුර robe

සීත ඉරිතුව cold season

හදවනවා to get made

හාමුදුරු නම Buddhist monk



## 14. ගමරාලගෙ නුවන

ගමරාලයි ගමමහගෙයි ගැන හුඟක් කතන්තර තියෙනවා. 'ගමරාල' කියන වචනෙ තේරුම 'ගමේ ප්‍රධානියා' කියන එකයි. 'ගම මහගෙ ' කියන්නෙ ගමරාලගෙ බාරියාව. පිටිසර පලාත්වල ඇනුත් ගමේ ප්‍රධානියාට කියන්නෙ ගමරාල කියලායි. නමුත් දැන් ඒ වචනෙ පාවිච්චි කරන්නෙ පිටිසර විතරයි. ගමරාලයි ගමමහගෙයි ගැන තියෙන කතන්තරවලින් එකක් තමයි මේ.

එක දවසක් ගමරාලට ගොයම් කප්පන්න ඕනැඋනා. ගමරාලට හුඟක් කුඹුරු තියෙනවා. කුඹුරු පැහුනාම කුලියට ගෑනු අඬගහගන ගොයම් කප්පන්න ඕන. ඒක නිසා ගමරාල ගම පුරාම ඇවිදලා ගෑනුන්ට කියලා ගොයම් කප්පන්න දිනයක් නියම කරගන ආවා. නියම කල දිනේට ගෑනු ගොයම් කපන්න ආවා. ගම රාලයි ගෑනුයි කුඹුරට ගියා. නමුත් කුඹුරෙ ගොයම් තවම පැහිලා මදි. ඉතින් මොකද කරන්නෙ! ගමරාල හුඟක් වෙලා කල්පනා කලා. 'දැන් මම මේ ගෑනුන්ට එන්න කියාපු නිසා කුලී ගෙවන්න ඕන. වැඩක් ගන්නෙ නැතුව කුලී ගෙවන්න බෑ. ඒක නිසා මේ ගෑනුන්ට කරන්න වැඩක් දෙන්න ඕන. ගොයම් ලා උනාට කමක් නෑ. ගෑනුන්ට කියලා කප්පන්න ඕන.' මෙහෙම කල්පනා කරලා මිනිහා ගෑනුන්ට කියලා ගොයම් කැප්පුවා. ලා ගොයම් සේරම කප්පාලා ගෙදර ගෙනි-හිල්ලා තමන්ගෙ හපන්කම ගැන බාරියාවට කියන්න ගියා. මිනිහා හිතුවා තමන්ගෙ නුවන ගැන බාරියාව හුඟක් සතුටු වේවියි කියලා. ගමරාල ගෑනිට සේරම විස්තර කෙරුවා. ගම මහගෙ බොහොම සතුටුවෙලා කිව්වා 'බොහොම හොඳයි. ඔයාගෙ නුවන කොච්චර අගේ ද! නමුත් බලන්න. ඔයාට වගේම නුවනක් මටත් තියෙනවා.' කියලා. මෙහෙම කියලා ගම මහගෙ තමන්ගෙ ඔලුව පෙන්නුවා. ඒ ගෑනිගෙ ඔලුව සේරම බූගාලා!

ගමරාල පුදුම වෙලා මොකද කියලා ඇහුවා. ගමමහගෙ සේරම විස්තර කෙරුවා. එදා උදේ ගමරාලගෙ රැවුල කපන බාබර් ගෙදරට ආවා. නමුත් ගමරාල ගෙදර උන්නෙ නෑ. මිනිහා ගොයම් කප්පන්න කුඹුරට ගියා නේ. ඒ මිනිහාට දවස ගානෙ කුලී ගෙවන්න ඕන. ඒ මිනිහාගෙන් වැඩක් ගන්න ඕන නිසා ගමමහගෙ තමන්ගෙ කොන්ඩෙ බූගාවා ගත්තා. මේ විස්තරේ අහලා ගමරාල බොහොම සතුටුඋනා. මගේ නෝනාටත් මට වගේම මොළේ තියෙනවායි කියලා මිනිහා උඩ පැන පැන නටන්න පටන් ගත්තා.

අඬගහගන්නවා to call a person to one's place

උඩ පනිනවා to jump up

ඔලුව head

කතන්තරේ story

කප්පනවා to get cut

කුලිය wages

කොන්ඩෙ hair

ගෑනි woman

ගෙවනවා to pay

දවස ගානෙ every day

දිනේ date

නියමකරගන්නවා to decide upon

නුවන wisdom

පැහෙනවා to mature

පුදුම වෙනවා to be astonished

පුරාම all over

පෙන්නනවා to show

බූගානවා to shave head

බූගාවාගන්නවා to get head shaved

මොලේ brain

රැවුල beard

රැවුල කපනවා to shave beard

ලා tender, unripe

ලා උනාට although not ripe

විස්තරේ description

සතුටු වෙනවා to be pleased



## 15. වැඩකාරයො

ලංකාවෙ බොහොම දෙනා දුප්පත්. රටේ රස්සාවලුත් හිඟයි. ඒක නිසා ගම්බද උදවිය පෝසත් ගෙවල්වල වැඩකාරකම් කරන්න යනවා. වැඩකාරකමට ගියාම මාසෙ පතා සුලු පඩියක් හම්බවෙනවා. හුඟක් දෙනා වැඩකාරයන්ට සලකනවා හොඳ මදි. සමහරු වැඩකාරයන්ට සලකන්නෙ ගස්ගල්වලට වගේ. සමහර ගෙදරවල්වල නෝනාලා මහත්තයාලා එලෝලු මස් මාලු හතරක් පහක් එක්ක බත් කනවා; නමුත් වැඩකාරයන්ට දෙන්නෙ එක එලෝලුවයි, නැත්තං දෙකයි. මිනිස්සු දුක් විඳ විඳ අනුන්ගෙ වැඩකාරකම් කරන්නෙ දුප්පත් නිසායි. ඒත් සමහරු වැඩකාරයන්ට හොඳට සලකනවා. සමහර වැදගත් මිනිස්සු වැඩකාරයන්ට පවුලෙම අය වගේ සලකනවා. හොඳට කන්න අඳින්න දෙනවා. ඒ වගේ ගෙදරවල්වල වැඩකාරකම් කරන්න හම්බවෙන අය වාසනාවන්තයි.

වැඩකාරයොත් ජාති දෙකක් ඉන්නවා. සමහරු අවංකයි. හොරකම් කරන්නෙ නෑ. පඩි අඩු උනත් බොහොම හොඳින් වැඩ කරනවා. සමහරු හොරු. කොච්චර පඩි දුන්නත් හොරකම් කරනවා. හරියට වැඩ කරන්නෙ නෑ. මේ නිසා හොඳ වැඩකාරයෙක් සොයාගන්න එක පරිස්සමෙන් කරන්න ඕන. ඒ වගේම තමන්ගෙ වැඩකාරයන්ට හොඳට සලකන්න ඕන. වැඩකාරයො නැතුව වැඩ කරන්න පුරුදු වෙන එකයි හොඳම වැඩේ.

සමහර ගෙවල්වල වැඩකාරයො හතරපස් දෙනෙක් ඉන්නවා. කුස්සියෙ වැඩට දෙන්නෙක් ඉන්නවා: උයන්න එක්කෙනායි, එලෝලු කපන්න මිරිස් අඹරන්න එහෙම එක්කෙනායි. කඩේට ගිහිල්ලා බඩු ගේන්නයි කෑම මේසෙ වැඩ කරන්නයි තව වැඩකාරයො දෙන්නෙක් ඉන්නවා. ගෙදර පිරිසිදු කරන්න තව එක්කෙනෙක් ඉන්නවා. සමහර ගෙවල්-වල ඉන්නෙ වැඩකාරයො දෙන්නායි. සමහර ගෙවල්වල එක්කෙනායි. සමහර ගෙවල්වල වැඩකාරයො එක්කෙනෙක්වත් නෑ. ඒක තමයි වැඩියෙම හොඳ. ගෙදරවල්වල නවතින්නෙ නැතුව ගෙයින් ගෙට ගිහිල්ලා වැඩකාරකම් කරන අයත් ඉන්නවා. ඒ අය සඳුදා එක ගෙදරක වැඩ කරනවා, අඟහරුවාදා එක ගෙදරක වැඩ කරනවා, බදාදා තව ගෙ-දරක වැඩ කරනවා. ඔය විදියට සුමානෙ හත් දවසෙ ගෙවල් හතක වැඩ කරන්න යනවා. එහෙම වැඩ කරන අයට ගෙදරවල්වල නැවතිලා වැඩ කරන අයට වැඩියෙ ආදායම හම්බ වෙනවා.

වැඩකාරයො ඉන්න ගෙවල්වල වැඩකාරයන්ට වෙනම කාමරයක් තියෙනවා. කාමරයක් නැත්තං ඒ ගොල්ල නිදාගන්නෙ කුස්සියෙ. වැඩකාරයො දෙතුන් දෙනෙක් ඉන්නවා නම් ඒ මිනිස්සුන්ට පාලු නෑ. ගෙදර වැඩ ඉවර උනාම දෙතුන්දෙනා එකට වාඩිවෙලා නොයෙක් කතන්තර කියකියා විනෝද වෙනවා. නමුත් එක වැඩකාරයෙක් ඉන්න තැන්වල වැඩකාරයාට හරිපාලුයි. කතාකරන්න කෙනෙක් නෑ නේ.

අඳිනවා to wear

අනුන් others

අඹරනවා to grind

අවංක sincere

ඉවරවෙනවා to finish (intr)

උදවිය persons

උයනවා to cook

එකට together

ඒ වගේම similarly

කෑම මේසෙ dinner table, dining table

කුස්සිය kitchen

ගස්ගල්වලට වගේ like unto trees and stones

ගෙයින් ගෙට from house to house

දුක් විඳිනවා to suffer

නිදාගන්නවා to sleep

පරිස්සමෙන් carefully

පාලු lonely

පිරිසිදු කරනවා to clean

පෝසත් rich

මාස්පතා monthly

වාසනාවන්ත fortunate

වැඩකාරකම servants' job



වැඩකාරකම් කරනවා to work as a servant

වැඩකාරයා servant

වෙනම separately

සලකනවා to treat, look after

හොරකම theft, robbery

හොරකම් කරනවා to steal

## 16. සිංහල බාසාව

සිංහල මිනිස්සුන්ගෙ බාසාව සිංහල බාසාව. දැන් ලංකාවෙ රාජ්‍යබාසාවත් සිංහල බාසාව. ලංකාවෙ වැඩ හුඟක් දුරට කරන්නෙ සිංහලෙන්. දෙමල බාසාව කතා කරන පලාත්වල දෙවල පාවිච්චි කරනවා, නමුත් වැඩි දෙනා පාවිච්චිකරන්නෙ සිංහල බාසාව නිසා ප්‍රදාන බාසාව හැටියට සලකන්නෙ සිංහල. ආංඩුවෙ වැඩ ඉස්රම සිංහල බාසාවෙන් කරන්න දැන් කටයුතු සූදානම් කරලා ඉවරයි.

සිංහල මිනිස්සු ලංකාවට ආවෙ මීට අවුරුදු දෙදාස් පන්සීයකටත් වැඩියෙ ඉස්සර. ඒ කාලෙ සිංහල බාසාව ඒ කාලෙ ඉන්දියාවෙ කතා කරපු බාසාවල්වලට හුඟක් දුරට සමානයි. ඒ කාලෙ ඉන්දියාවෙ කතාකලේ ප්‍රාකෘත බාසා. මුල් කාලෙ සිංහල බාසාවත් ප්‍රාකෘත බාසාවක්. ඉන්දියාවෙන් වෙන්උනාට පස්සෙ සිංහල බාසාව හුඟක් දුරට වෙනස් වෙන්න පටන්ගත්තා. ඒක නිසා දැන් සිංහල බාසාව පුරාන සිංහල බාසාවට වැඩියෙ හුඟක් වෙනස්. සිංහල විතරක් නෙවි, කොයි බාසාවත් වෙනස් වෙනවා. පුරාන සිංහල බාසාවෙන් ලියාපු සෙල්ලිපි බර ගානක් තියෙනවා. ක්‍රිස්තු වර්සෙත් ඉස්සර තුන්වෙනි සත වර්සෙ ඉඳලා ලංකාවෙ සෙල්ලිපි තියෙනවා. ඒ සෙල්ලිපිවල අකුරුයි බාසාවයි දෙකම දැන් අකුරුවලටයි බාසාවටයි වැඩියෙ වෙනස්. අමුතුවෙන් ඉගනගන්නෙ නැතුව ඒවා කියවන්න බෑ. තේරුම්ගන්නත් බෑ. ක්‍රිස්තුවර්සෙ මුල හරියෙ ඉඳලා සිංහලෙන් පොතුත් ලියලා තියෙනවා. නමුත් ඒ පොත්වලින් වැඩිහරිය දැන් නෑ. හතරවෙනි සතවර්සෙ ලියාපු සමහර පාලි පොත්වල ඒ පැරනි සිංහල පොත් ගැන සඳහන් කරලා තියෙනවා. දැනට තියෙන පරනම සිංහල පොත ලියලා තියෙන්නෙ නමවෙනි සතවර්සෙ.

පුරාන සිංහල රජවරු බොහොම උගත් අය. සමහර රජවරු කවියො. සමහර රජවරු දක්ස වෙද්දු. සමහරු දක්ස නීතිඥයො. ඒ රජවරු තමන් දන්න විසේස දේවල් ගැන සිංහලෙන් පොත් ලිව්වාලු. දැනට තියෙන පරනම සිංහල කවි පොත 'කව් සිළුමින'. ඒක ලියලා තියෙන්නෙ පරාක්‍රමබාහු කියන රජ්ජුරුවො. පොලොන්න-රුවට ගියොත් ඔහෙට පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙ පිළිමෙ බලන්න පුළුවනි. ඒ පිළිමෙත් ඒ රජ්ජුරුවන්ගෙ කාලෙදිම කරපු එකක්.

මිනිස්සු කතාකරන සිංහල බාසාව පොත් ලියන සිංහල බාසාවට වැඩියෙ හුඟක් වෙනස්. මේ පොතේ තියෙන බාසාව කතා කරන සිංහල බාසාව. කතා කරන සිංහල හොඳට ඉගනගත්තාම ලියන සිංහල ඉගනගන්න එක අමාරු නෑ. කතා කරන බාසාවෙන් ලියනවා අඩුයි. සමහරු යාලුවන්ටයි නෑදෑයන්ටයි ලියුම් ලියන්නෙ කතාකරන සිංහලෙන්. නමුත් සමහරු ඒ විදියෙ ලියුම් ලියන්නෙත් ලියන සිංහලෙන්. ලියන බාසාවෙන් කතා කරන්න හොඳ නෑ. එහෙම කතා කෙරුවොත් මිනිස්සු හිනහ වෙනවා. කවුරුවත් ලියන බාසාවෙන් කතා කරන්නෙ නෑ. සිංහල ඉගනගන්න පිටරටියො සමහරවිට ලියන බාසා-වෙන් කතාකරනවා. එතකොට සිංහල මිනිස්සු හරියට හිනහ වෙනවා.

අමුතුවෙන් anew, especially

උගත් learned

කටයුතු activities

කවිපොත poem

කවියා poet

තමන් oneself

තේරුම්ගන්නවා to understand

දෙමළ Tamil

නීතිඥයා lawyer

පාලි Pali

පිටරටියා foreigner

පිළිමෙ statue

ප්‍රාකූර්ත Prakrit

බර ගානක් a large sum

බාසාව language

මුල beginning

රාජ්‍ය official

විතරක් නෙවි not only

විසේස special



වෙදා physician of Ayurvedic medicine

වෙන් වෙනවා to separate (intr)

සඳහන් කරනවා to mention

සූදානම් කරනවා to prepare, arrange

සෙල්ලිපිය inscription

හිනහා වෙනවා to laugh, smile

## 17. මිනිස්සු කන බොන හැටි

කෑම කන්නෙ නැතුව ජීවත්වෙන්න බෑ. මිනිස්සුන්ට විතරක් නෙවි, සත්තුන්ටත් ගස් වැල්වලටත් කෑම ඕන කරනවා. කෑම විතරක් නෙවි, බීමත් ඕන කරනවා. මිනිස්සු ධාන්‍ය ජාති, එළවලු ජාති, මස් ජාති, මාලු ජාති කාලා ජීවත් වෙනවා. කොයි රටේත් මිනිස්සු මේ ජාති කන්න පුරුදුවෙලා ඉන්නවා. කන බොන දේවල් එක සමානයි; ඒත් වෙන වෙන ජාතිවල මිනිස්සු කන බොන විදි වෙනස්.

ලංකාවෙ මිනිස්සු සාමාන්‍යයෙන් කෑම කන්නෙ අතින්. ලංකාවෙ කෑම මේසයක් ලෑස්ති කරන කොට අත සෝදන්න වතුර කෝප්පත් තියන්න ඕන. එක් කෙනෙකුට පිඟානයි, වතුර වීදුරුවයි, අත සෝදන්න වතුර කෝප්පයයි බැගින් තියන්න ඕන. එතකොට මිනිස්සු කෑම කාලා ඒ වතුර කෝප්පෙන් අත සෝදාගන්නවා. ලංකාවෙ මිනිස්සු අතින් කන්නෙ බත් මාලු විතරයි. කිරි පැනි, පුඩිං ජාති එහෙම කන්නෙ හැන්දෙන්. කෑම කන කොට තලු ගහන්න, සද්ද කරන්න තහනම්.

එංගලන්තෙ මිනිස්සු කෑම කන්නෙ එහෙම නෙවි. කෑම මේසයක් ලෑස්ති කරන කොට හැඳි ගෑරුප්පු, පිහියා එහෙම තියන්න ඕන. එංගලන්තෙ මිනිස්සු ගෑරුප්පුව අල්ලන්නෙ වමතින්. පිහිය අල්ලන්නෙ දකුනු අතින්. හැන්දක් පාවිච්චි කරනවා නම් ඒක අල්ලන්නෙ දකුනු අතින්. මේ උපකරන අල්ලන විදිය බලාලා මිනිහා මොන තරාතිරමකට අයිති ද කියලා දැනගන්න පුලුවන් ලු. කෑම කන කොට කටින් සද්ද කරන්න හොඳ නෑ. දවසක් උනු සිද්දියක් මට තාම මතකයි. මම දවසක් එංගලන්තෙදි හෝටලේකට ගියා තේ එකක් බොන්න. ඒ හෝටලේ හරියට සෙනග උන්නා. ඒක නිසා මම තව මහත්තුරු දෙන්නෙක් වාඩිවෙලා උන්නු මේසෙකින් වාඩිඋනා. ඒ මහත්තුරු දෙන්නාගෙන් එක්කෙනෙක් සුප් පිඟානක් ගෙන්නාගන බොන්න පටන්ගත්තා. ඒ දුප්පත් මනුස්සයා වයසක කෙනෙක්. කටේ දත් නෑ. ඒක නිසා සුප් කටට ගන්න කොට 'සොරොස්' ගාලා සද්ද වෙන්න පටන් ගත්තා. එතකොට අර අනිත් මහත්තයා කල වැඩේ දන්නවා ද? ඒ මහත්තයා අර දුප්පතාට කතා කරලා කිව්වා 'තමුසෙගෙ සංගීතෙ මට නෑහෙන්න කරන්න.' කියලා! මම ඔහේගෙන් ප්‍රශ්නයක් අහන්නම්. මේ දෙන්නාගෙන් නරක විදියට හැසුරුනෙ සුප් බිව් මිනිහා ද? අනිත් මිනිහා ද?

ඇමෙරිකාවෙ මිනිස්සු කෑම කන කොට ගෑරුප්පුව අල්ලන්නෙ දකුනු අතින්. මස් කපන්න තියෙනවා නම් ඉස්සෙල්ලා පිහියෙන් කපාලා පස්සෙ ගෑරුප්පුවෙන් කනවා. පුඩිං ජාති කන්නෙ ගෑරුප්පුවෙන්.

බීමත් නොයෙක් රටවල්වල නොයෙක් විදියට කරනවා. එක රටක බීම කලවම් කරන විදිය තව රටක බීම කලවම් කරන විදියට වැඩිය වෙනස්. ලංකාවෙ මිනිස්සු නොයෙක් ජාතිවල බීම පාවිච්චි කරනවා. පිට රටින් ගෙන්නන විස්කි, බ්‍රැන්ඩි, ආදිය බොහොම ගනන්. මේවා ලංකාවෙත් හදනවා. ලංකාවෙ හදන අරක්කු ලාබයි. අරක්කු විස්කිවලට වැඩිය සැරයි. ලංකාවෙ අරක්කුයි ලංකාවෙ තේයි ලංකාවෙ සුරුට්ටුයි ලෝකෙ කිසිම තැනකට දෙවෙනි නෑ.

අරක්කු arrack, a strong drink

උපකරනෙ instrument

එක සමාන similar

ඕන කරනවා to become necessary

කනවා බොනවා to eat and drink

කලවම් කරනවා to mix

කිසිම any whatsoever

කෝප්පෙ cup

ගස්වැල් trees and vines

ගෑරුප්පුව fork (for eating with)

තරාතිරම status

තලු ගහනවා to make noise while eating

තහනම් prohibited

තාම still

දකුනු අත right hand

දත tooth

නෑහෙන්න not to be heard

පිඟාන plate



පිහිය knife

පුඩිම pudding

ප්‍රශ්නෙ question

බැගින් at the rate of

බීම drink

බ්‍රැන්ඩි brandy

මතක remember

ලෑස්ති කරනවා to make ready

වමත left hand

වයසක elderly

විස්කි whisky

වීදුරුව glass

වෙන වෙන different

සතා animal

සද්ද කරනවා to make a noise

සද්ද වෙනවා to make a noise (ref. inanimare things)

සංගීතෙ music

සිද්දිය incident

සුප් soup

සෙනග crowd

'සොරොස්' ගාලා making a noise 'soros'

සෝදාගන්නවා to wash one's own self

හැන්ද spoon

හැසිරෙනවා to behave

# 18. වලලු වෙළෙන්දා

ඔහේලා ජාතක කතා ගැන අහලා තියෙනවා ද? ජාතක කතා ලියලා තියෙන්නෙ පාලි බාසාවෙන්. ඒවා සිංහලටත් පරිවර්තනේ කරලා තියෙනවා. ජාතක කතා බුදු හාමුදුරුවො කියාපු කතාවල් ලු. ඒවා කියලා තියෙන්නෙ දර්මෙ විස්තර කරන්න උදාහරන හැටියට. වලලු වෙළෙන්දාගෙ කතාවත් ජාතක කතාවක්.

එකමත් එක කාලෙක ඉන්දියාවෙ එක නගරෙක කච්චපුට කියලා වෙළෙන්දෙක් හිටියා. ඒ වෙළෙන්දා කෙරුවෙ වලලු වෙළඳාම. මිනිහා හැමදාම උදේ පාන්දරින් වලලු පෙට්ටියක් ඔලුව උඩ තියාගන ගමින් ගමට යනවා. මිනිහා බොහොම යහපත් කෙනෙක්. මිනිස්සු රවට්ටලා සල්ලි ගන්නෙ නෑ. ඒ නගරෙම තවත් වලලු වෙළෙන්දෙක් හිටියා. මිනිහාගෙ නම සේරිවානිජ. මිනිහා කච්චපුටත් එක්ක තරඟෙට වෙළඳාම් කරන්න පටන් ගත්තා. සේරිවානිජ හරි කපටියා. මිනිහා පුලුවන් තරම් මිනිස්සු රවට්ටලා සල්ලි හම්බ කෙරුවා. මේගොල්ල වෙළඳාමට යන පාරෙ උන්නා එක දුප්පත් ගෑනියෙකුයි ඒ ගෑනිගෙ මිනිපිරියි. දවසක් උදේ සේරිවානිජ වලලු වෙළඳාම් කරන්න යනකොට මේ කෙල්ලට වලලු කුට්ටමක් ගන්න හිතුනා. නමුත් දුප්පත් ආච්චි ලඟ සල්ලි තිබුනෙ නෑ. දෙන්නා එක්ක විකුනන්න දෙයක් තියෙනවාද කියලා කල්පනා කලා. ගෙදර පරන පිඟානක් තියෙන බව ආච්චිට මතක් උනා. ආච්චි වලලුකාරයාට අඬගහලා කිව්වා 'කීයකට හරි මේ පිඟාන අරගන දරුවාට වලලු කුට්ටමක් දෙන්න.' කියලා. මිනිහා බොහොම අදිමදි කරලා, 'පිඟාන සත පනහකට වැඩියෙ වටින්නෙ නෑ. ඒ පිඟානට වලලු කුට්ටමක් දෙන්න බෑ.' කියලා කිව්වා. මිනිහා එහෙම කියාලා ගියේ පස්සෙන්දා ඇවිල්ලා එක වලල්ලක් දීලා පිඟාන ගන්න හිතාගනයි. ඊට ටිකකට පස්සෙ කච්චපුට ඒ ගෙදර ලඟින් ගියා. ආච්චි අඬ අඬ ඒ මිනිහාට කතාකරලා 'මේ පිඟාන අරගන එක වලල්ලක් වත් දෙන්න.' කියලා කිව්වා. මිනිහා පිඟාන දිහා හොඳට බැලුවා. මේ පිඟාන රත්තරන් බව මිනිහාට පෙනුනා. මිනිහා කිව්වා 'මේ පිඟාන බොහොම වටින එකක්. මේකට දෙන්න තරම් සල්ලි මම ලඟ නෑ.' කියලා. 'ඒකට කමක් නෑ. පුලුවන් දෙයක් දෙන්න.' කියලා ආච්චි කිව්වා. මිනිහා එතකොට තමන් ලඟ තිබුනු සේරම සල්ලියි සේරම වලලුයි දීලා පිඟාන අරන් ගියා.

ඔය අතරෙදි සේරිවාණිජ පිඟාන ගන්න ආපහු ආවා. ඇවිල්ලා පිඟාන ඉල්ලුවාම ආච්චි සිද්දිය විස්තර කෙරුවා. ඒ කතාව අහලා මිනිහාට කේන්තිගියා. 'ඒපිඟාන අයිති මටයි, ඒ මිනිහාට නෙවි.' කියලා මිනිහා කච්චපුට පස්සෙන් දුවන්න පටන්ගත්තා. නමුත් කච්ච පුට ගඟකින් එගොඩවෙලා ගියා. සේරිවාණිජට ගඟෙන් එගොඩවෙන්න බැරිඋනා. කච්චපුට ඒ වටින පිඟානත් අරගන වෙන නගරෙකට ගිහිල්ලා හොඳින් ජීවත්උනා.

අදිමදි කරනවා　to show reluctance

අරන් යනවා　to take away

ආපහු　back

උදාහරණෙ　example

උදේ පාන්දර　early in the morning

එකමත් එක කාලෙක　once upon a time

එගොඩ වෙනවා　to cross (a river etc.)

ඒකට කමක් නෑ　that doesn't matter

කුට්ටම　pair

කෙල්ල　girl

කේන්ති යනවා　to become angry

ජාතක කතා　Jataka stories

තරඟෙ　competition

දර්මෙ　religious doctrine

පරිවර්තනේ කරනවා　to translate

පස්සෙන්දා　following day

පෙට්ටිය　box

මිනිපිරි　grand daughter

යහපත්　good, gentlemanly

රත්තරන්　gold

රවට්ටනවා　to deceive

වටිනවා　to be valuable



වළලුකාරයා　bangle seller

වළල්ල　bangle

විස්තර කරනවා　to describe

වෙළඳාම් කරනවා　to trade, sell

හිටියා　there was

## 19. සිල්ලර කඩයක්

ගම්වල තියෙන කඩ බොහොම පුංචියි. නමුත් ඒ කඩවල ඕන දෙයක් තියෙනවා. ඒවායෙ වැඩියෙම තියෙන්නෙ සිල්ලර බඩු. සිල්ලර බඩු කියන්නෙ කෑමට ඕනකරන බඩු ජාති: මිරිස්, තුනපහ, හාල්, සීනි, තේ කොල වගේ ජාති. ඒක නිසා ඒ කඩවලට සාමාන්‍යයෙන් කියන්නෙ සිල්ලර කඩ කියලායි.

මේ කඩවල වෙනම කාමර නෑ. සේරටම තියෙන්නෙ එක කාමරයයි. ඒ කාමරේ බිත්තිවල රාක්ක හයිකරලා තියෙනවා. එක බිත්තියක් දිගේ වීදුරු අල්මාරි දෙකක් තුනක් තියෙනවා. රාක්කවල තියෙන්නෙ බෝතලවල පුරවාපු කෑම ජාති: සීනි බෝල, විස්කෝතු, වගේ දේවල්. අල්මාරිවල තියෙන්නෙ කඩදාසි, පැන්සල්, තීන්ත කූඩු, රෙදි, සෙල්ලම් බඩු වගේ දේවල්. හාල්, සීනි, මිරිස් වගේ දේවල් තියෙන්නෙ ගෝනිවල. මේ බඩු කිරන්න ලොකු තරාදියක් තියෙනවා. මුදලාලිගෙ මේසෙ තියෙන්නෙ කඩේ මැද්දෙ. සල්ලි පෙට්ටිය තියෙන්නෙ මුදලාලිගෙ මේසෙ උඩ. මුදලාලිට වාඩිවෙන්න පුටුවක් තියෙනවා. බඩු විකුනන කොලුවාට වාඩිවෙන්න බංකුවක් තියෙනවා.

කඩේ ඉස්සරහ මිදුලක් තියෙනවා. එලෝලු, අල බතල ජාති එහෙම තියෙන්නෙ මිදුලෙ කෙලවරක. මිදුලෙ අනිත් කෙලවරේ බංකුවක් තියෙනවා. වැඩක් නැති මිනිස්සු ඇවිල්ලා ඒ බංකුව උඩ වාඩි වෙලා ඕපදූප කතා කරනවා. සමහර කඩවල්-වල තේ වතුර, කෝපි එහෙම විකුනනවා. කඩේට එන රස්තියාදුකාරයො කඩෙන් කෙසෙල් ගෙඩියි විස්කෝතුයි කාලා තේ එකක් හරි කෝපි එකක් හරි බොනවා. ඒ වෙලඳාමෙනුත් මුදලාලිට සෑහෙන ආදායමක් හම්බවෙනවා.

ගමේ සේරම ගෙවල්වලට පත්තරේ ගන්නෙ නෑ. ගමේ පිරිමි පත්තරේ බලන්න ඕන උනාම යන්නෙ කඩේට. පත්තරේ බලන්න එන මිනිස්සු සුරුට්ටු සිගරට් බොන නිසා ඒකෙනුත් මුදලාලිට සුලු ලාබයක් ලැබෙනවා.

කඩේ තියෙන්නෙ හාල් සිල්ලරයි එලෝලුයි විතරක් නෙවි. වලඳුත් තියෙනවා. වලඳක් ගන්න ඕන උනාම ගෑනු කඩේට ගිහිල්ලා පැයක් දෙකක් වලං තෝරනවා. ඒත් මුදලාලිට තරහ යන්නෙ නෑ. කලයක් සත පනහක් විතර වෙනවා. හට්ටියක් සත විසිපහයි.

මුදලාලි ඒ තරම් පෝසතෙක් නෙවි. නමුත් කාටත් නයට බඩු දෙනවා. සමහර මිනිස්සු මාස ගානක් යනකං නය ගෙවන්නෙ නෑ. සමහරු මාස්පතා ගනුදෙනු බේරනවා. කඩේ කිට්ටුව වත්තක් තියෙනවා නම් මුදලාලිට හුඟක් වාසියි. වතුවල වැඩ කරන කුලිකාරයන්ට සුමානෙකට සැරයක් ගාස්තු ගෙවනවා. එතකොට ඒ මිනිස්සු ඒ සල්ලි සේරම කඩේට ගෙනිහිල්ලා වියදම් කරනවා. ඒක නිසා වතු කිට්ටුව කඩවල මුදලාලිලාට ගමේ අනිත් කඩවල මුදලාලිලාට වැඩිය සල්ලි හම්බවෙනවා.

ගම්බද කඩකාරයො තමන්ගෙ කඩවල්වලට බඩු ගේන්නෙ ටවුමෙන්. එක පාරකට ගේන්නෙ බඩු ටිකයි. ඒ ටික විකුනුනාම ආයෙත් ටවුමට ගිහිල්ලා බඩු ටිකක් ගේනවා. කඩේ මුදලාලිට එක බඩුවකින් සතේකට දෙකකට වැඩියෙ ලාබ හම්බවෙන්නෙ නෑ. නමුත් මුදලාලි සල්ලි ඉතුරු කරන හැටි දන්න නිසා මුදලාලි ළඟ නිතරම රුපියල් හත් අට සීයක් තියෙනවා.

අලබතල yams
අල්මාරිය wardrobe, cupboard
ඉතුරු කරනවා to save (money)
ඕපදූප gossip
කඩකාරයා shop keeper
කඩදාසිය paper
කලේ pot
කිරනවා to weigh
කුලිකාරයා person who works for daily wages
කොලුවා lad
කෝපි coffee
ගනුදෙනු බේරනවා to settle accounts
ගාස්තුව wages, fares
ගෝනිය sack
තරහ යනවා to become angry
තරාදිය weighing scales



තීන්ත ink
තීන්ත කූඩුව ink pot
තේ කොළ tea (leaves)
තේ වතුර tea (drink)
පත්තරේ newspaper
පත්තරේ බලනවා to read the newspaper
පැන්සල pencil
පුටුව chair
පුරවනවා to fill
පෝසතා rich man
බංකුව bench
බිත්තිය wall
බෝතලේ bottle
මිදුල compound, yard
මුදලාලි merchant
රාක්කෙ shelf
රෙදි cloths
ලැබෙනවා to obtain, be available
වළඳ pan
විස්කෝතු biscuits
වීදුරු glass
සෑහෙන sufficient
සිල්ලර provisions
සීනිබෝල candy
සේරටම for every thing
හට්ටිය pan
හම්බවෙනවා to receive
හයිකරනවා to put up, hang

## 20. බුලත් කෑම

ගම්බද ගෙදරකට අමුත්තෙක් ආවොත් ඉස්සෙල්ලාම දෙන්නෙ බුලත් විඩක්. ගම්බද මිනිස්සු කෑම කාලා ඉවර උනු හැටියෙ කන්නෙ බුලත් විඩක්. සමහරු උදේ නැගිට්ට හැටියෙත් බුලත් විඩක් කනවා. බුලත් විඩ කියන්නෙ බුලතුයි, පුවකුයි, හුනුයි, දුංකලයි. බුලත් කොළේකුයි පුවක් කෑල්ලකුයි හුනු ටිකකුයි දුංකල කෑල්ලකුයි හොඳට හැපුවාම කට රතු පාට වෙනවා. බුලත් විඩ කන දෙයක් නෙවි, හපන දෙයක්. බුලත් හපන එකට බුලත් කනවායි කියලාත් කියනවා, නමුත් බුලත් ගිල්ලන්නෙ නෑ. බුලත් හපන එකත් සිගරට් බොන එක වගේ පුරුද්දක්.

සමහරු බුලත් විඩ රස කරන්න එංසාල්, කරාබු නැටි වගේ සුවඳ ජාතිත් කලවම් කරනවා. එතකොට කට රතු පාට වෙනවා විතරක් නෙවි, සුවඳ ගහන්නත් පටන් ගන්නවා. බුලත් කන එක වරදක් නෑ. නමුත් බුලත් කාලා හැම තැනම කෙල ගහන එක නම් හොඳ වැඩක් නෙවි. ගම්වල හුඟක් මිනිස්සු බුලත් කාලා ගිය ගිය තැන කෙල ගහනවා. හුනු ඇඟිල්ලට අරගන කටේ ගාලා ඉතුරු හරිය කොහේ හරි ගානවා!

උත්සවයක් හරි පිංකමක් හරි තියෙනවා නම් එතෙන්ට බුලත් විඩි වෙළෙන්දෙක් එනවා. ඒ මිනිහා බුලත් විඩි පෙට්ටිය කරේ එල්ලාගන කවි කිය කිය ගෙජ්ජි හොල්ල හොල්ල එහාට මෙහාට යනවා. මිනිස්සු සල්ලි දීලා බුලත් විඩි අරගන හපනවා. බුලත් කෑම කරන්නෙ ලංකාවෙ මිනිස්සු විතරක් නෙවි. මලයාව, ඉන්දුනීසියාව, ඉන්දියාව වගේ රටවල්වල මිනිස්සුත් බුලත් කනවා ලු. ඒ මිනිස්සුත් බුලත් කාලා හැම තැනම කෙල ගහනවා ද දන්නෙ නෑ.

බුලත් උතුම් දෙයක් හැටියට සලකනවා. වැඩිහිටියන්ට බුලත් අතක් දීලා වඳින එක සිංහල සිරිතක්. ගම්බද මිනිස්සු මඟුල්වලට ආරාධනා කරන්නෙ බුලත් දීලා. බුලත් සාමාන්‍යයෙන් මිලයි. කොළයක් සතයක් විතර වෙනවා. වැදගත් කෙනෙක් හම්බවෙන්න යන කොට බුලත් අතක් අරන් යන එක හොඳ සිංහල සිරිතක්.

බුලත් හැදෙන්නෙ වැල්වල. රස්සාවට බුලත් වවන මිනිස්සු ඉන්නවා. අපේ ගමේ එලියෙස් කියලා මිනිහෙක් ඉන්නවා. ඒ මිනිහාගෙ රස්සාව බුලත් වැවීම. මිනිහා බුලත් වෙළඳාමටත් ගෙනියනවා. අපි ඒ මිනිහාට කියන්නෙ බුලත් එලියෙස් අයියා

කියලා. බුලත් එලියෙස් අයියාට බුලත් වෙළඳාමෙන් හුඟක් වාසියි. මිනිහා දූටයි පුතාටයි දෙන්නාටම හොඳට උගන්නාලා තියෙනවා. පුතා දැන් බී.ඒ. කාරයෙක්. දුව ළඟදි දොස්තර කෙනෙක් කසාද බඳින්න යනවා ලු. බුලත් වෙළඳාම නරක වෙළඳාමක් නෙවි, නේද?

අපේ ගම්වලට ඕන කරන දුංකලවලින් වැඩි හරිය ගේන්නෙ යාපනෙන්. යාපනේ දුංකල වතු බර ගානක් තියෙනවා. ඒ මිනිස්සු දුංකල කපලා වේලලා පෙට්ටිවල අහුරලා අපේ පලාතට එවනවා. අපේ පලාතෙ දුංකල වවන්න බෑ. දේසගුනේ දුංකල වගාවට හොඳ නැහිලු. පුවක් ගස් කොහෙත් වවන්න පුලුවන්. හමුත් යාපනේ පැත්තෙ අපේ පැත්තෙ තරම් සාරෙට පුවක් වැවෙන්නෙ නෑ.

අමුත්තා stranger, guest
අහුරනවා to pack
ආරාධනා කරනවා to invite
ඇඟිල්ල finger
ඉතුරු හරිය the remainder, balance
ඉන්දුනීසියාව Indonesia
උතුම් noble
එවනවා to send
එලියෙස් Eliyes
එල්ලාගන්නවා to hang up (by, for or on oneself)
එංසාල් cardamoms
කරාබු නැටි cloves
කවි කියනවා to recite poetry
කෑල්ල piece
කෙළ saliva
කෙළ ගහනවා to spit
කොහෙත් everywhere
ගම්බද rural



ගානවා to apply
ගිලිනවා to swallow
ගෙජ්ජ small bell
නැගිටිනවා to rise, wake up
පිංකම religious festival (Buddhist)
පුරුද්ද habit
පුවක් arecanuts
බී.ඒ. කාරයා person holding a B.A. degree
බුලත් එලියෙස් 'Betel Eliyes'
බුලත් කෑම chewing betel
බුලත් විට chew of betel
මගුල wedding
මලයාව Malaya
මිල expensive
රතුපාට red
රස කරනවා to make tasty
වගාව cultivation
වරදක් නෑ not bad, no harm
වාසි profitable
වේලනවා to dry (trans)
සාරෙට in a fertile manner
සුවඳ ගහනවා to smell good
හපනවා to chew
හුනු lime, calcium
හොල්ලනවා to shake

## 21. පොල්ගහ

මහත්තයා කුරුම්බා බීලා තියෙනවා ද? කුරුම්බා කියන්නෙ ළපටි පොල්. කුරුම්බා වතුර හොඳට රසයි. අපේ වත්ත පහළ කුරුම්බා හොඳ ගහක් තියෙනවා. ගමේ කොල්ලො රෑට ඇවිල්ලා අපට හොරා ඒ ගහෙන් කුරුම්බා කඩාගන යනවා. සමහර ගස්වල කුරුම්බා හොඳ නෑ; ලුනු රසයි. පැහිච්ච පොල් කෑමට ගන්නවා. එළවලු උයන කොට සිංහල මිනිස්සු පොල් කිරි පාවිච්චි කරනවා. මහත්තයා පොල් සම්බල් කාලා තියෙනවා ද? කට දන්න පොල් සම්බලක් හදාගත්තාම ඕන තරම් බත් කන්න පුළුවනි. දුප්පත් මිනිස්සුගෙවල් හෙවිලි කරන්නෙ පොල් අතුවලින්. පොල් අතු කපාලා ලස්සනට වියලා හෙවිලි කෙරුවාම මාස හතරක් පහක් තියෙනවා. සාමාන්‍යයෙන් පොල් අතු හෙවිලි කරන මිනිස්සු අවුරුද්දට දෙපාරක් හෙවිලි කරනවා. ළා පොල් කොලවලට කියන්නෙ ගොක් කොල කියලා. උත්සවවලට සැරසිලි කරන කොට හුඟක් දෙනා ගොක්කොල පාවිච්චි කරනවා. පොල් මලුත් උත්සවවලට ගන්නවා. පොල් මල සැරසිලිවලට අපූරුයි. පොල් මල රත්තරන් පාටයි. මල දිග ඇරලා කළේක දැම්මාම හරි ලස්සනයි. පොල් ගහේ කඳ ගෙවල් හදන්න පාවිච්චි කරනවා. පොල් පරාල බොහොම සක්තිමත්. පොල් කොලයි පොල් ලෙලියි වේලුනාම දරට පාවිච්චි කරනවා. කොටින් කියනවා නම් පොල් ගහේ හැම කොටසක්ම මිනිස්සු ප්‍රයෝජනේට ගන්නවා.

පොල් හැම තැනම වවන්න බෑ. පොල් වවන්න ලුනු මිශ්‍ර පසක් ඕන. ඒකයි මුහුදුබඩ පළාත්වල පොල් හොඳට වැවෙන්නෙ. ලංකාවෙ මුහුදුබඩ පළාත්වල මුහුද අයිනෙ දිගටම පොල් ගස් දකින්න පුළුවනි. මුහුදුබඩ පළාත්වල පොල් ගස්වලින් රා මදිනවා. මහත්තයා ලංකාවට ගියොත් වරද්දන්නෙ නැතුව රා මදින හැටි බලන්න යන්න ඕන. හුඟක් ගස් මදින්න තියෙනවා නම් ගහින් ගහට කඹ දානවා. එතකොට මදින මිනිහා ගහින් ගහට යන්නෙ කඹ දිගේ. රා මදින හැටි මහත්තයා දන්නවා ද? පොල් මලෙන් ගන්න ඉස්මවලට කියන්නෙ තෙලිජ්ජ. පොල් මල කපාලා මුට්ටියක් එල්ලුවාම තෙලිජ්ජ ගන්න පුළුවනි. තෙලිජ්ජ උනු කරන්නෙ නැතුව පැහෙන්න තිව්වාම රා වෙනවා. රා බීරවලට සමානයි. සිංහල අවුරුද්ද දාට ගම්බද සමහර මිනිස්සු රා බීලා වෙරි වෙලා පාරෙ වැටිලා ඉන්නවා දැකලා තියෙනවා ද?

අත්ත branch

අපූරු wonderful

ඉස්ම juice

උනු කරනවා to boil (liquids)

කඳ trunk

කඹේ rope

කුරුම්බාව young coconut

කොටස portion, section

කොල්ලා lad

ගොක්කොළ tender coconut leaves

තෙලිජ්ජ sap

දිග අරිනවා to stretch, open

පරාලෙ rafter

පස soil, earth

පැහිච්ච ripe

පොල් සම්බල් a preparation of chillies, coconut, etc.

මදිනවා to tap (trees for sap)

මල flower

මිස්ර mixed

මුට්ටිය pot

රා toddy

ලපටි tender

ලුනු මිස්ර salty

ලෙල්ල husk, skin (of fruit etc.)

වරද්දන්නෙ නැතුව without fail

වියනවා to plait

වෙරිවෙනවා to get drunk

සක්තිමත් strong

සෙවිලි කරනවා to thatch



## 22. ගමේ වෙදමහත්තයා

ගමේ වැදගත් මිනිස්සු හිපදෙනෙක් ඉන්නවා. හන්දියෙ කඩේ මුදලාලියි රිජිස්ටර් රාලහාමියි වෙදමහත්තයායි තමයි එයින් ප්‍රධාන අය. වෙදමහත්තයෙක් නැත්තං මිනිස්සුන්ට ලෙඩ හොඳකරගන්න විදියක් නෑ. පිරිස් වෙදමහත්තයාගෙ බේත්ගුලි ඕන ලෙඩකට හොඳයි. බේත්ගුලියක් ගිලලා වතුර ටිකක් බිව්වාම ඕනම ඉසරදයක් සනීපවෙනවා. බඩ රිදෙනවා නම් බේත්ගුලි දෙකක් ගිලින්න ඕන. ඒ බේත්ගුලි කොන්දෙ කැක්කුමටත් හොඳයි. පිරිස් වෙදමහත්තයා කසාය දෙන්නෙ ලොකු අසනීපවලට විතරයි. උන්නැහෙගෙ කසාය තිත්ත නිසා මිනිස්සු බොන්න කැමති නෑ. ඒකනිසා උන්නැහෙ කසාය නියමකරන්නෙ බොහොම කලාතුරකින්. ගමේ මිනිස්සුන්ට උදව්කරන්න වෙදමහත්තයා හරි සතුටුයි. ඒක නිසා ගමේ මිනිස්සුත් වෙදමහත්තයාට සලකනවා. ගොයම් කැපුනාම ගොවියො වෙදමහත්තයාට වී ගෙනිහිල්ලා දෙනවා. එළෝලු වවන මිනිස්සු වෙදමහත්තයාට එළෝලු ගෙනිහිල්ලා දෙනවා. ඒකනිසා වෙදමහත්තයාට කඩෙන් ගන්න තියෙන්නෙ මිරිස් තුනපහ ආදිය විතරයි. අපේ වෙදමහත්තයා මස් කන්නෙ නෑ. උන්නැහෙ කන්නෙ මාලු විතරයි.

ලෙඩ්ඩු වෙදමහත්තයා බලන්න යනකොට ගෙනියන්නෙ බුලත් අතක් විතරයි. පෝසත් මිනිස්සු බුලත් අතත් එක්ක රුපියලකුත් දෙනවා. නමුත් මම කලින් කිව්වා වගේ, උන්නැහෙ සල්ලි බලාපොරොත්තු වෙන්නෙ නෑ. සමහර මිනිස්සු වෙදමහත්තයා හම්බවෙන්න යනකොට දොඩම් ගෙඩි දෙකක් තුනක් හරි අන්නාසි ගෙඩි දෙකක් හරි අරන් යනවා. වෙදමහත්තයා ඒවා දුප්පත් ලෙඩ්ඩුන්ට දෙනවා. වෙදමහත්තයාගෙ ගේ බොහොම පුංචියි. ඒකනිසා ලෙඩ්ඩු බලන්න වෙනම කාමරයක් නෑ. අපේ වෙදමහත්තයාට බේත් බඩු කඩයක් තියෙනවා. කසායවලට ඕනකරන බේත් බඩු එතනින් ගන්න පුලුවනි. වෙදමහත්තයා කොහේ හරි යනකොට බේත්ගුලි බෝතලෙත් අරන් යනවා. නාඩි අල්ලලා ලෙඩ අඳුනාගන්න වෙදමහත්තයා හරි හපනා. ටවුමෙ ඉන්නවා දොස්තර කෙනෙක්. ඉංගිරිසි බේත්වලට කැමති මිනිස්සු ඒ දොස්තර ළඟට යනවා. ඒ දොස්තර නලාව තියලා ලෙඩ්ඩු බලන නිසා සමහරු උන්නැහෙට කැමතියි. අපේ වෙදමහත්තයාටත් නලාවක් ගන්න කියලා හිපදෙනෙක්ම කිව්වා. අල්ලපු ගමේ වෙදමහත්තයා ගිය මාසෙ නලාවක් ගත්තා. ඊට පස්සෙ උන්නැහෙ ළඟට ඉස්සරට වැඩියෙ ලෙඩ්ඩු යන්න පටන්ගත්තා. නමුත් මුන්නැහෙ

ඒ විහිළුවලට කැමති නෑ. නලාව පාවිච්චි කරන්නෙ දොස්තරලා. වෙදමහත්වරු නලාව පාවිච්චිකරන එක සිරිතක් නෙවි. පීරිස් වෙදමහත්තයා පරන සිරිත්වලට ගරුකරන කෙනෙක්. උන්නැහෙට නලාවට වැඩියෙ පරන සිරිත් අගෙයි.

අඳුනාගන්නවා to get to know
අන්නාසි pineapple
ඉසරදේ headache
ඕන any
කසාය decoction
කැක්කුම pain, ache
කොන්ද lower back, small of the back
තිත්ත bitter
දොඩම් oranges
නලාව stethescope
නලාව තියලා බලනවා to examine with stethescope
නාඩි අල්ලනවා to feel the pulse
නියම කරනවා to prescribe
පීරිස් Peiris
බඩ රිදෙනවා to have stomach ache
බේත්ගුලිය medical pill
බේත් බඩු medical herbs
රිජිස්ටර් රාලහාමි registrar of marriages, deaths and births
ලෙඩ අඳුනාගන්නවා to diagnose diseases
විහිළුව joke
වෙදමහත්තයා physician of Ayurvedic medicine
සතුටු pleased, glad
හපනා clever fellow
හොඳ කරගන්නවා to get cured



## 23. කාලගෝල කතාව

ඉස්සර කාලෙ කාලගෝලයායි කියලා මිනිහෙක් හිටියා. ඒ මිනිහා මිටියි, කලුයි, මහතයි: හරියට බෝලයක් වගෙයි. ඒ මිනිහා අවුරුදු හතක් තිස්සෙ මහන්සි වෙලා වැඩ කරලා සල්ලි හම්බකරගන ගෑනියෙක් ගත්තා. ගෑනිගෙ නම දික්තලා. දික්තලා කාලගෝලයා වගේ නෙවි, බොහොම ලස්සනයි. උසයි, හීන්දෑරියි, රත්තරන් පාටයි. මිනිහා කැතයි ගෑනි ලස්සනයි උනාම වෙන්නෙ මොකක්ද කියලා දන්නවා නේ? කාලගෝ-ලයා ගෑනිට වාල් වෙලා ගෑනි කියන කියන එක කරන්න පටන්ගත්තා.

දවසක් ගෑනි මිනිහාට කතාකරලා කිව්වා 'අපි හෙට මගේ දෙමව්පියො බලන්න යමු.' කියලා. කාලගෝලයා ඒකට එකඟවෙලා කැවිලි පෙවිලි හදාලා ඇඳුම් පැලඳුම් එකතු කරලා පෙට්ටියක පුරවාගන ගමනට ලෑස්ති උනා. යන කොට ගෑනි ඉස්සරහින් ගියා, මිනිහා බඩු පෙට්ටියත් ඔලුව උඩ තියාගන පිටිපස්සෙන් ගියා. ඒ දෙන්නා ගමනක් යනකොට දික්තලා හැරෙන්න කිව්වොත් කාලගෝලයා හැරෙන්න ඕන; දික්තලා නවතින්න කිව්වොත් කාලගෝලයා නවතින්න ඕන. ඒ මිනිහා එහෙම ගෑනිට වාල්වෙලා ජීවත් උනේ මොකද මම දන්නෙ නෑ.

මේ දෙන්නා යන පාරෙ ගඟක් තියෙනවා. කාලගෝලයා ගඟ ලඟට ඇවිල්ලා එගොඩ වෙන්න විදියක් කල්පනා කලා. මිනිහා හරි මෝඩයා. ගඟේ වතුර හුඟක් තිඋනෙ නැති නිසා බොහොම ලේසියෙන් එගොඩ වෙන්න තිඋනා. නමුත් මිනිහාට ඒක තේරුනේ නෑ. ගෑනි ගඟේ බැහැලා එගොඩ වෙන්න කැමති උනේ නෑ. මිනිහාට ගෑනි කර තියා ගන යන්න සක්තියක් තිඋනෙ නෑ.

මේ අතරෙදි දික්පිටියා කියලා මිනිහෙක් එතෙන්ට ආවා. ඒ මිනිහා උසයි, තරමක් මහතයි, තලඑලෙලුයි. මිනිහා දැක්ක හැටියෙ දික්තලාට කාලගෝලයා එපා උනා. මෝඩ කාලගෝලයා දික්පිටියාට කතා කරලා කිව්වා 'යාලුවා, අපට මේ ගඟෙන් එගොඩ වෙන්න උදව් කරන්න.' කියලා. දික්පිටියා දික්තලාත් කර තියාගන ගඟින් එගොඩ උනා. කාලගෝලයා හිතුවා දික්පිටියා ගෑනි එගොඩින් ඉන්දාලා තමන් එක්ක යන්න එවියි කියලා. දික්පිටියා එහෙම මෝඩයෙක් නෙවි. මිනිහා ගෑනිත් අරගන පස්ස බලන්නෙ නැතුව යන්න ගියා.

ගෑනිත් බොහොම සන්තෝසෙන් දික්පිටියාත් එක්ක ගියා. දුප්පත් කාලගෝලයා මේ වේදනාව ඉවසාගන්න බැරුව බොහොම අමාරුවෙන් ගඟෙන් එගොඩ වෙලා වැටි වැටී ඒ දෙන්නා පස්සෙන් දුවන්න පටන්ගත්තා. ඒ වෙලාවෙ මහවිසද පංඩිතයො උසාවියෙ නඩු අහනවා. කාලගෝලයා කෑගහන සද්දෙ පංඩිතයන්ට ඇහුනා. පංඩිතයො උසාවියෙ උන්නු මිනිස්සුන්ට කිව්වා මේ තුන්දෙනා අල්ලන්න කියලා. මිනිස්සු දික්තලායි දික්පිටියායි කාලගෝලයායි උසාවියට ගෙනාවා.

පංඩිතයො නඩුව අහන්න පටන්ගත්තා. කාලගොලයා පංඩිතයන්ට සිද්දිය විස්තර කෙරුවා. නමුත් දික්පිටියායි දික්තලායි ඒක බොරුයි කිව්වා; බඩු පෙට්ටිය අයිති තමන්ටයි කිව්වා. පංඩිතයො දික්පිටියායි දික්තලායි වෙනම කාමරේකට ඇරලා කාලගෝලයාගෙන් ඇහුවා පෙට්ටියෙ තියෙන්නෙ මොනවාද ක්යලා. කාලගෝලයා සේරම විස්තර කෙරුවා. ඊට පස්සෙ දික්තලා ගෙන්නාලා එයාගෙනුත් ඇහුවා ඒ ප්‍රස්නෙ. දික්පිටියා, දන්නෙ නැති නිසා, බොරු කිව්වා. කාලගෝලයාගෙ උත්තරෙයි දික්තලාගෙ උත්තරෙය් එක සමානයි. ඒක නිසා පංඩිත න්ට සේරම ස්ද්දිය අවබෝද උනා. පංඩිතයො දික්තලාට අවවාද කරලා දක්ප්ටයා හිරේට අරින්න තීන්දුව දුන්නා.

අරිනවා to send

ඇඳුම් පැලඳුම් clothings

ඉන්දනවා to place (a person)

ඉවසනවා to endure

ඉවසාගන්න බැරුව being unable to endure

උත්තරේ reply, answer

උස height, tall

එකඟවෙනවා to agree

එකතුකරනවා to collect

එපාවෙනවා to get disgusted

කළු black

කාලගෝල කතාව the story of Kalagola



කාලගෝලයා Kalagolaya

කැත ugly

කෑගහනවා to shout

කියන කියන එක every thing that is said

ගෑනියෙක් ගන්නවා to marry a woman

තලෙලෙලු not too dark in complexion

තිස්සෙ throughout

තීන්දුව sentence

දික්තලා Diktala

දික්පිටියා Dikpitiya

නඩු අහනවා to hear the case

නඩුව case, law suit

පස්ස behind, back

පංඩිතයො learned man

පංඩිතයා learned man

පිටිපස්සෙන් from behind

බොරුව lie

බෝලෙ ball

මහත fat

මහවිසද Mahawsada

මාව me

මිටි short

මෝඩ foolish

මෝඩයා fool

ලේසි easy

ලේසියෙන් easily

වාල් slayish

වාල් වෙනවා   to become a slave to

වැට වැටී   falling

සක්තිය   strength

සන්තෝසෙන්   with pleasure

හිරේ   jail

හින්දැටි   slim



## 24. රස්තියාදුකාරයො

රස්තියාදුකාරයො නැත්තෙ කොයි රටේ ද! හන්දැවක ඇවිදින්න යන්න. නැත්තං කෝපි කඩයක් ළඟට යන්න. නැත්තං බස් නවත්තන තැනකට යන්න. අපි නොදන්න රස්තියාදුකාරයො කොච්චර ඉන්නවා ද කියලා එතකොට බලාගන්න පුළුවනි. රස්සාවල් හිඟ රටවල්වල රස්තියාදුකාරයො වැඩියි. ඒ මිනිස්සුන්ට සල්ලි නෑ. කරන්න වැඩක් නෑ. කාලෙ ගතකරන්න විදියක් නෑ. ඒක නිසා කට්ටි ගැහිලා අනුන්ට හිරිහැර කරනවා. අනුන්ගෙ දේවල් හොරකම් කරනවා. හූ කියකිය හන්දියක් ගානෙ රස්තියාදු වෙනවා.

ඕන වෙලාවක හන්දියෙ කඩේ ළඟට යන්න. කඩේ ඉස්සරහ බංකුවක් තියෙනවා: ඒක උඩ නිතරම හතර පස් දෙනෙක් බුලත් කකා වාඩිවෙලා ඉන්නවා. ඒ මිනිස්සුන්ගෙන් කඩේට කිසි ප්‍රයෝජනයක් නෑ. සල්ලි දීලා කිසි දෙයක් ගන්නෙ නෑ නේ. තේ වතුර බොන්න ඕන උනාම කඩේ ළමයාට කියලා තේ හදවාගන බොනවා. නමුත් කිසි දවසක සල්ලි දෙන්නෙ නෑ. මුදලාලි ඒ මිනිස්සුන්ට මොකුත් කියන්නෙ නෑ. කිව්වොත් ඒගොල්ල මුදලාලිට හිරිහ ර කරන්න පටන්ගන්න නිසා මුදලාලි බයයි. මේමිනිස්සු පාරෙ යන කොට අහිංසක සතෙක් දැක්කොත් ඌට හිරිහැර කරන්න පටන්ගන්නවා. වාහනයක් නවත්තාලා තියෙනවා දැක්කොත් ඒකට මොකක් හරි කරනවා. අහිංසක නාකි මිනිහෙක් හරි හිඟන්නෙක් හරි දැක්කොත් ඒ මිනිහාට ගල් මුල්වලින් ගහන්න පටන්ගන්නවා. සමහරු රා බීගන පාර දිගේ වැටිලා ඉන්නවා. සමහරු අනුන්ගෙන් සල්ලි ටිකක් ඉල්ලාගන, නැත්තං හොරකම් කරගන, සූදු කෙලලා පරාද කරනවා. පැරදුනාම දිනාපු මිනිස්සුන්ට ගහනවා, බනිනවා, හිරහැර කරනවා.

මේ මිනිස්සු පුදුම මිනිස්සු! හිතක් පපුවක් නෑ. හිරේට යන්න බය නෑ. අනුන්ගෙ දේවල්වලට ගරුකරන්න දන්නෙ නෑ. වයසක උදවියට සලකන්න දන්නෙ නෑ. රස්සාවක් සොයාගන්න කැමති නෑ. ජීවිතේ අගයක් දන්නෙ නෑ. ආගමක් දහමක් නෑ. කවදාවත් පන්සලකට පල්ලියකට යන්නෙ නෑ. පොතක් පතක් කියවන්නෙ නෑ. පත්තරයක් බලන්නෙ නෑ. ලෝකෙ පෙරලුනත් ඒ ගැන කිසි දෙයක් දන්නෙ නෑ. හරියට තිරිසන්නු වගෙයි. තිරිසන්නු උනත් මොළෙන් කල්පනා කරලා වැඩ කරන හැටි දන්නවා. තිරි-සන්නු කියන එක අහනවා. හීලෑ කරගන්න පුළුවනි. නමුත් රස්තියාදු කාරයො එහෙම

හීලෑකරන්න පුලුවන් ජාතියක් නෙවි. ඒ මිනිස්සු ලෝකෙට බරක්. ලෝකෙට නය වෙවී ඔහේ ඉන්නවා.

අහිංසක innocent

ආගම religion

ආගමක් දහමක් a religion or philosophy

ඔහේ ඉන්නවා to remain idling

කට්ටි ගැහෙනවා to throng together

කියන එක අහනවා to obey, be obedient

ගල්මුල් stones etc.

තිරිසනා animal

දිනනවා to win

නය වෙනවා to be indebted

පපුව chest

පරාද කරනවා to lose (money etc.) in gambling

පල්ලිය church

පැරදෙනවා to be defeated

පුදුම wonderful, amazing

පෙරලෙනවා to turn over (intr)

පොතපත books and papers

බය fear, afraid

බර weight, heavy

බීගන්නවා to get drunk

රස්තියාදු වෙනවා to loiter, waste time, idle

හිඟන්නා beggar

හිතක් පපුවක් නෑ 'He is heartless'

හිරිහැර කරනවා to disturb

හීලෑ කරනවා to tame



## 25. තේ වතුවල වැඩ

උඩරට පලාතෙ හරියට තේ වතු තියෙනවා. ඒවායින් වැඩි හරිය අයිති ඉංගිරිසි කාරයන්ට. ලංකාවට තේ ගෙනාවෙ ඉංගිරිස්කාරයො. ඒකයි තේ වතුවලින් වැඩි හරිය ඒගොල්ලන්ට අයිති. ලංකාවෙ තේ වතු අයිති කොම්පැනි කීපයක් තියෙනවා. ඒ කොම්පැනිවලින් සමහරක් ඔහේලා අහලා ඇති. ලිප්ටන් සමාගම එයින් එකක්.

තේවතුවල හුඟක් වැඩ තියෙනවා. දවස ගානෙ දලු කඩන්න ඕන. උදලු ගාන්න ඕන. ගස් කප්පාදු කරන්න ඕන. වතුවල කානු කපන්න ඕන. ගස්වලට හෙවන වෙන්න නොයෙක් ගස් ජාති හිටවන්න ඕන. පස හෝදා යාම නවත්තන්න ගල්වැටි බඳින්න ඕන. මේ වගේ වැඩ කරන්න හුඟක් කුලීකාරයො ඕනකරනවා.

ලංකාවෙ තේවතුවල දලු කඩන්නෙ ගෑනු. ඒ ගෑනුන්ගෙන් වැඩිහරිය දෙමල ගෑනු. සිංහලයො සාමාන්‍යයෙන් කුලී වැඩට කැමති නෑ. ඒක නිසා සුද්දො කුලී වැඩට ඉන්දියාවෙන් මිනිස්සු ගෙනැත් තියෙනවා. සමහරවිට ඔහේලා දලු කඩන ගෑනුන්ගෙ පින්තූර දැකලා ඇති. පිටේ පැසක් එල්ලාගන දලු කඩන ගෑනුන්ගෙ පින්තූර සල්ලිවලට ගන්න පුලුවන්. දලු කඩන ගෑනු වැඩකරන්නෙ කංගානියො යටතෙ. කංගානි කියන්නෙ ගෑනු කට්ටියට කියලා වැඩ කරවන පිරිමි. එක කංගානියෙක් යටතෙ ගෑනු විසි පස්දෙනෙක් විතර වැඩ කරනවා. ගෑනු දලු කඩාලා පැක්ටේරියට ගෙනියනවා. පැක්ටේරියෙදි දලු කිරනවා. ගෑනුන්ට කුලී ගෙවන්නෙ දලුවල බරේ හැටියටයි. වතුවල අනිත් වැඩ කරන්නෙ පිරිමි.

තේ පැක්ටරිවල වැඩ කරන්නෙ මැෂින්වලින්. තේ දලු වේලීම, දලු තේරිම, දලු ඇඹරීම, දලු හැලීම වගේ වැඩ කරන්න මැසින් තියෙනවා. මැසින් වැඩ කරන්න ඕන නිසා හැම වත්තකම ඉලෙක්ට්‍රික් මෝලක් තියෙනවා. සමහර වතුවල දිය ඇලි තියෙනවා. ඒක නිසා ඒ වතුවල ඉලෙක්ට්‍රික් මෝල් වතුරෙන් වැඩකරන්න පුලුවන්.

තේ අඹරලා ඉවර උනාම තේ වර්ග කරනවා. තේ කුඩුයි තේ කොලයි කියලා ජාති දෙකක් තියෙනවා. තේ කොල ජාති කීපයක් තියෙනවා. තේ කුඩුත් ජාති දෙකක් තියෙනවා. තේ මෙහෙම වර්ගකරලා ඉවරවෙලා රාත්තලේ පැකැට්වල අසුරනවා. තේ පිටරට අරින්න වෙනම පෙට්ටි ජාතියක් හදනවා. ඒවාට කියන්නෙ තේ පෙට්ටි කියලා.

ලංකාවෙන් වැඩියෙම පිටරට යවන්නෙ තේ. තේවලින් ලංකාවට හුඟක් ආදායම ලැබෙනවා. ලංකාවෙ ආදායමෙන් සියේට අනූවක් විතර හම්බවෙන්නෙ තේවලින්. ලංකාවෙන් පිටරට යවන තේවලින් වැඩිහර්ය ගන්නෙ එංගලන්තෙ. ඔහේලා ලංකාවෙ තේ බීලා තියෙනවා ද? ඔහේලාට පිරිසිදු ලංකාවෙ තේ හම්බවෙන්නෙ නැතුව ඇති. ලංකාවෙ තේයි කියලා පිටරටවල විකුනන්නෙ වෙන රටවල තේත් එක්ක කලවම් කරපු ඒවා.

ඇඹරීම grinding

ඉලෙක්ට්‍රික් මෝල electric generator

උදලු ගානවා to weed with a hoe

කප්පාදු කරනවා to prune

කංගානියා supervisor

කානු කපනවා to dig ditches

කානුව drain, ditch

කුඩු dust, powder

කොම්පැනිය company

ගල්වැටිය stone embankment

තේරීම selecting, choosing

දල්ල tender leaf

දලු කඩනවා to pick tender leaves

දිය ඇල්ල waterfall

පැක්ටේරිය factory

පැහැ basket

පිටරට අරිනවා to export

පිටරට යවනවා to export

පිරිසිදු clean

මැසිම machine

යටතෙ under



රාත්තල pound

ලැබෙනවා to get

වර්ගකරනවා to grade

වැඩ කරනවා to work

වේලීම drying

සියේට අනූවක් ninety per cent

සුද්දා white man

හැලීම sifting

හෙවන shade

හෝදා යනවා to erode

හෝදා යාම erosion

## 26. අපේ ආගම්

ලංකාවෙ ආගම් කීපෙක මිනිස්සු ඉන්නවා. සිංහලයින්ගෙන් වැඩිදෙනා බුද්ධාගම් කාරයො. දෙමල මිනිස්සුන්ගෙන් වැඩිදෙනා හින්දු ආගම්කාරයො. අලුත් ජනලේඛනේ හැටියට ලංකාවෙ ජනගහනෙනත් සියේට හැටක් විතර බුද්ධාගම්කාරයො. මුස්ලිම් මිනිස්සුත් ඉන්නවා. මරක්කල මිනිස්සු සේරම වගේ මුස්ලිම්කාරයො. සිංහලයොයි දෙමලුයි දෙගොල්ල ම අතරෙ ක්‍රිස්තියානිකාරයොයි කතෝලිකයොයි සෑහෙන ගානක් ඉන්නවා. මේ විදියට ලංකාවෙ හැම ආගමේම මිනිස්සු ඉන්න නිසා ලංකාවෙ මිනිස් - සුන්ට හරියට නිවාඩු දවස් තියෙනවා. වෙසක් පෝය පොසොන් පෝය වගේ දවස් බුද්ධාගමේ වැදගත් දවස්. හැම පෝයටම ආංඩුවෙ නිවාඩු. තයිපොන්ගල් දීපවාලි වගේ දවස් හින්දු ආගමේ වැදගත් දවස්. ඒ දවසුත් ආංඩුවෙ නිවාඩු දවස්. නත්තල් වගේ ක්‍රිස්තියානි ආගමේ වැදගත් දවස්වලටත් ආංඩුවෙ නිවාඩු. මුස්ලිම් ආගමේ වැද- ගත් දවස්වලටත් නිවාඩු. ඉරිදා වෙනුවට නිවාඩු ලැබෙන්නෙ පෝයදාට.

ආගම් කොච්චර තිඋනත් මිනිස්සු බොහොම සමගියෙන් ඉන්නවා. අනුන්ගෙ ආගම් වලට හිරිහැර කරන සිරිතක් නෑ. බුද්ධාගම්කාරයො පෝයදාට පන්සල් යනවා. බුද්ධා- ගමේ අයට වැඳුම් පිදුම් කරන්න හැම ගමකම හැම නගරෙකම පන්සලක් දෙකක් තියෙනවා. මුස්ලිම් මිනිස්සු ඉන්න පලාත්වල මුස්ලිම් පල්ලි තියෙනවා. ක්‍රිස්තියානිකාර- යන්ට ඒගොල්ලන්ගෙ නිකායවල හැටියට වෙන වෙන පල්ලි තියෙනවා. හින්දු ආගම් කාරයො ඉන්න දිහාවල්වල කෝවිල් තියෙනවා. ක්‍රිස්තියානිකාරයො සිරිතක් වසයෙන් හැම ඉරිදාම පල්ලි යනවා. හින්දු ආගම්කාරයොත් කෝවිල්වලට ගිහිල්ලා පුදපූජා පවත්තනවා. බුද්ධාගම්කාරයො පන්සල් යනඑක අවස්‍ය නෑ. නමුත් හුඟක් දෙනා පන්සල්වලට ගිහිල්ලා බුදුන්ගෙ නමට ගරුකරනවා.

ඉස්කෝල පිහිටවන්න ඉස්සෙල්ලා අද්‍යාපනේ තිඋනෙ පන්සලේ හාමුදුරුවො අතේ. ගමේ ලමාලපටි පන්සලට ගිහිල්ලා හාමුදුරුවන්ගෙන් අකුරු ඉගනගත්තා. ඉස්කෝල පිහිටෙව්වාට පස්සෙ ලමයි සාමාන්‍යයෙන් හාමුදුරුවො ලඟට යන්නෙ නෑ. ඒත් සංස්කෘත පාලි ඉගනගන්න ඕන අය දැනුත් පන්සල්වලට ගිහිල්ලා හාමුදුරුවන්ගෙන් ඉගනගන්නවා. හාමුදුරුවරු පරන පිළිවෙලට උගන්නන්න දන්නවා.

අධ්‍යාපනේ education

අවශ්‍ය necessary

කතෝලිකයා Catholic person

කෝවිල Hindu temple

ක්‍රිස්තියානිකාරයා Christian person

ජනගහනෙ population

ජනලේඛනේ census

තයිපොංගල් Taipongal, a Hindu festival

දිහාව area

දීපවාලි Dipavali, a Hindu festival

නත්තල් Christmas

නිකාය sect

පාලොස්වක පෝය දා full moon day

පිලිවෙල way

පුදපූජා offerings

බුදුන් the Buddha

බුද්ධාගම්කාරයා Buddhist person

මරක්කල Moor

මුස්ලිම් Muslim

මුස්ලිම්කාරයා Muslim person

මුස්ලිම් පල්ලිය mosque

ළමා ළපටි young children

වැඳුම්පිදුම් කරනවා to worship and make offerings

සමගිය unity

සංස්කෘත Sanskrit

සිරිතක් වශයෙන් as a custom, habit

පේරම වගේ almost all

හින්දු ආගම්කාරයා Hindu person



## 27. පංචකල්‍යාණෙ

ගෑනියෙකුට ගුනාංග පහක් තියෙන්න ඕන කියලා කතාවක් තියෙනවා. ඉස්සර කාලෙ ඉඳලා ලංකාවෙයි ඉන්දියාවෙයි මිනිස්සු මේක පිළිඅරන් තියෙනවා. ඒ ගුනාංග පහට පංචකල්‍යාණෙයි කියලා කියනවා.

එයින් එකක් තමයි කේසකල්‍යාණෙ. ගෑන්යෙකුගෙ කොන්ඩෙ විලුඹ ලඟට දික්වෙන්න ඕන. කොන්ඩෙ ඝනට වැවිලා තියෙන්න ඕන. ලස්සනට කලුපාටට තියෙන්න ඕන. සමහර ගෑනුන්ගෙ කොන්ඩෙ අකලට පැහෙනවා. ඒක හරි නෑ. කොච්චර වයසට ගියත් අවුරුදු විස්සක කෙල්ලෙකුගෙ වගේ කොන්ඩෙ ලස්සනට තියෙන්න ඕන. සමහර ගෑනුන් ගෙ කොන්ඩෙ දිග නෑ: කොන්ඩෙ නොකැපුවත් අඩියකට දෙකකට වැඩියෙ දික්වෙන්නෙ නෑ. ඒ ගෑනුන්ටත් කේස කල්‍යාණෙ නෑ.

දෙවෙනි එක දන්ත කල්‍යාණෙ. දත් කට්ටම මුතුඇට පේලි දෙකක් වගේ දිලිසෙ-නවා නම්, සමහර දත් ලොකුවටයි සමහර දත් පොඩියටයි නැතුව එක සමානව තියෙ-නවා නම්, ඒක තමයි දන්ත කල්‍යාණෙ. අකලට දත් වැටෙන්න හොඳ නෑ. දත් දිරන්න හොඳ නෑ. දත් දිරුවොත්, දත් වැටුනොත්, එයාට දන්තකල්‍යාණෙ නෑ. අවු-රුදු හැටක් ගියත් අවුරුදු විස්සෙදි වගේ දත් ටික හොඳට තියෙන්න ඕන. සමහරුන් ගෙ දත් අවුරුදු විස්සෙදිත් වැටෙනවා!

තුන්වෙනි කල්‍යාණෙ මාංසකල්‍යාණෙ. ඇගේ මස්පිඩු හොඳ ලස්සනට තියෙන්න ඕන. උස්වෙන්න ඕන තැන්වල උස්වෙන්න ඕන. හින්වෙන්න ඕන තැන්වල හින්වෙන්න ඕන. වයසට යනකොට මස්පිඩු නෙරනවා නම් එයාට මාංසකල්‍යාණෙ නෑ. සමහරුන්ගෙ වලලුකර බත්කෙන්ඩට වැඩියෙ මහතයි. සමහරුන්ගෙ බෙල්ල බෙරයක් වගෙයි. සමහරුන්ගෙ බඩ දවසින් දවස නෙරනවා. ඒගොල්ලන්ට මාංසකල්‍යාණෙ නෑ. ගෑනුන් ගෙ බත්කෙන්ඩ ලස්සනට ටිකින් ටික හින්වෙන්න ඕන. නහර පෑදෙන්න හොඳ නෑ. වයස හැටක් උනත් විස්සකට වැඩියෙ පේන්න හොඳ නෑ.

හතරවෙනි එක ඡවිකල්‍යාණෙ. ඡවිකල්‍යාණෙයි කියන්නෙ හොඳ හමක් තියෙන එක. හම රැලි වැටෙන්න හොඳ නෑ. හම ගොරහැඩිවෙන්න හොඳ නෑ. හම රන්වන් පාට වෙන්න ඕන. නාකි උනත් හම හොඳට තියෙන්න ඕන. සමහර ගෑනු වයසට යනකොට

හම නරක්වෙනවා. ඒ ගෑනුන්ට චවිකල්‍යානෙ නෑ.

පස්වෙනි කල්‍යානෙ තමයි වයස්කල්‍යානෙ. කොච්චර නාකි උනත් වයස විස්සකට වැඩියෙ පේන්න හොඳ නෑ. දහසයක් වගේ පේනවා නම් වැඩියෙත් හොඳයි. දැන් නම් සමහර ගෑනු විස්සෙදිත් හතලිහක් වගේ පේනවා. ඒක හොඳ ගුනාංගයක් නෙවි. කොච්චර වයසට ගියත් රූපෙ ලස්සනට තියෙනවා නම් කවුරුත් දකින්න සතුටුවෙනවා නේ.

අකලට unduly, at undue time

අඟ body

උස්වෙනවා to become high

කේසකල්‍යානෙ the quality of good hair

ගනට thickly

ගුනාංග qualities

ගොරහැඩි rough

චවිකල්‍යානෙ the quality of good skin

දත tooth

දත්කුට්ටම set of teeth

දන්තකල්‍යානෙ the quality of good teeth

දිරනවා to decay

දිලිසෙනවා to shine (intr)

නහරෙ vein

නෙරනවා to bulge out

නොකැපුවත් even if not cut

පංචකල්‍යානෙ the five good qualities of a woman

පැහෙනවා to grow grey

පෑදෙනවා to appear

පිලිගන්නවා to accept

පේලිය line

පොඩියට in a small shape



බත්කෙන්ඩෙ calf of leg

බෙරේ drum

බෙල්ල neck

මස්පිඩු muscles

මාංසකල්‍යානෙ the quality of good flesh

මුතු pearls

මුතුඇටේ pearl

රන්වන්පාට golden

රැලිවැටෙනවා to wrinkle

රූපෙ form, beauty

ලොකුවට in a big shape

වයසට යනවා to grow old

වයස්කල්‍යානෙ the quality of youthfulness

වළලුකර ankle

විලුඹ heel

සතුටුවෙනවා to become pleased

හම skin

හරි නෑ not proper

හීන් වෙනවා to become thin

හොඳ ලස්සනට beautifully

## 28. විහිලු කිරීම

සිංහල රජ කාලෙ විහිලු කරලා රජ්ජුරුවො සතුටු කරන්න කවටයෙක් උන්නා. එක රජකෙනෙකුගෙ කවටයාගෙ නම අන්දරේ. අන්දරේගෙ නම රට පුරාම ප්‍රසිද්දයි. මින්හා බොහොම දක්ෂ විහිලුකාරයෙක්. මිනිහා හිටිවන කවි කියන්න සූරයා. අන්දරේ උන්නු ගමේ ලොකු ගලක් තිඋනා. මිනිස්සු හරියට මහන්සි ගත්තා, නමුත් මේ ගල අස් කරන්න විදියක් සොයාගන්න බැරිඋනා. ගම්මු මේක රජ්ජුරුවන්ට පැමිනිලි කලා. ඒ කතාව අන්දරේට ඇහුනා. එතකොට අන්දරේට විහිලුවක් කරන්න හිතුනා. අන්දරේ මිනිස්සුන්ට කතාකරලා කිව්වා 'මට තුන් මාසයක් හොඳට කුකුල් මසුත් එක්ක කන්න දෙන්න. එතකොට මම ගල කුඹුරෙන් අස්කරන්නම්.' කියලා. මිනිස්සු අන්දරේට ඒ විදියට කන්න දුන්නා. තුන් මාසෙ ඉවරඋනාම අන්දරේ මිනිස්සුත් එක්ක කුඹුරට ගියා. මින්හා වටපිට බලාලා කිව්වා 'ආ, මේක බොහොම ලේසි වැඩක්. කට්ටිය එක්ක මේක ගලවලා මගේ කරෙන් තියන්න. මම එතකොට කියන තැනකට ගෙනිහිල්ලා දාන්නම්.' කියලා. මිනිස්සු අන්දරේට බැන බැන යන්න ගියා.

සිංහල මිනිස්සු කවටකම් කරන්න සාමාන්‍යයෙන් ප්‍රසිද්දයි. අන්දරේ ගැන කියනකොට මට මතක් උනා සිංහල රජකෙනෙක් කරපු කවටකමකුත්. ඉස්සර ලංකාවෙ යසලාලකතිස්ස කියලා රජකෙනෙක් හිටියා. මේ රජ්ජුරුවො විහිලුකරන්න බොහොම කැමතියි. රජ්ජුරු-වන්ගෙ දොරටුපාලයා රජ්ජුරුවො වගේමයි. රජ්ජුරුවො කල කවටකම මොකක්ද දන්නවා ද? රජ්ජුරුවො දොරටුපාලයාට තමන්ගෙ ඇඳුම් අන්දාලා සිංහාසනේ වාඩිකර-වනවා. තමන් දොරටුපාලයාගෙ ඇඳුම් ඇඳගන දොර ලඟ හිටිනවා. රජ්ජුරුවො දකින්න එන ඇමතිවරු රජ්ජුරුවොයි කියලා හිතාගන දොරටුපාලයාට වඳිනවා. රජ්ජුරු-වො මේක බලාලා බක බක ගාලා හිනහ වෙනවා. මේකයි කරපු විහිලුව. දවසක් රජ්ජුරුවො මේ විදියට වෙස් මාරුකරගන ඉන්නකොට ඇමතිවරු ඇවිල්ලා රජ්ජුරුවො යි කියලා හිතාගන දොරටුපාලයාට වැන්දා. ඒක දැකලා දොර ලඟ උන්නු නියම රජ්-ජුරුවො බක බක ගාලා හිනහවෙන්න පටන්ගත්තා. එතකොට සිංහාසනේ උඩ උන්නු දොරටුපාලයාට කේන්තිගියා. 'රජ්ජුරුවන්ට අවනම්බුකරන දොරටුපාලයාගෙ බෙල්ල කපන්න.' කියලා මිනිහා ඇමතිවරුන්ට අන කලා.

අන කරනවා to order

අන්දනවා to dress someone

අවනම්බු කරනවා to insult

අස්කරනවා to remove

ඇමතිවරයා minister of government

කවටකම් කරනවා to joke

කවටයා jokester

ගම්මු villagers

ගලවනවා to uproot, pull out

දොර door

දොරටුපාලයා gate keeper, door keeper

නියම actual

පැමිනිලිකරනවා to report

බක බක ගාලා making the sound 'baka baka'

බැන බැන scolding

මතක්වෙනවා to remember

මරනවා to kill

වටපිට around

වාඩිකරනවා to seat (trans)

විහිලු කරනවා to crack jokes

විහිලුකාරයා jokester

විහිලුකිරීම joking

වෙස් මාරුකරගන්නවා to disguise oneself

සතුටුකරනවා to please (trans)

සිංහාසනේ throne

සූරයා clever person

හිටිනවා to stand

හිටිවන impromptu



## 29. සාස්තරකාරයා

අපි දන්නෙ අපට වෙච්ච දේවල් විතරයි. වෙන්න තියෙන දේවල් අපි දන්නෙ නෑ. නමුත් වෙන්න ඕන හැටි අපි දන්නවා. අපි කරදරේ වැටෙන්න සතුටු නෑ; දුප්පත් වෙන්න සතුටු නෑ; කනගාටුවට පත්වෙන්න සතුටු නෑ. අපි නිතරම බලාපොරොත්තුවෙන්නෙ දියුනු වෙන්න; වඩ්ඩවැඩියෙ පෝසත් වෙන්න; වැඩිවැඩියෙ ගරු බුහුමන් ලබන්න. මෙහෙම බලාපොරොත්තු ඇතිකරගන අපි නොයෙක් දේවල් කරනවා. නමුත් සේරම හරියන්නෙ නෑ. නොයෙක් විට අපට අමාරුවෙ වැටෙන්න සිද්දවෙනවා.

නමුත් අපට වැඩකරන්න ඕන විදිය කියාදෙන්න දන්න එක මිනිහෙක් ඉන්නවා. ඒ මිනිහා අපට වැඩියෙ දුප්පත්. ඒ මිනිහාට අපට වඩියෙ කරදර තියෙනවා. ඒ මිනිහා කරන කරන එක වරදිනවා. නමුත් අපට වැඩ කරන්න ඕන විදිය කියන්න නම් ඒ මිනිහා හපනා. ඒ කවුද දන්නවා ද? ඒ තමයි සාස්තරකාරයා.

ගස් යට වාඩිවෙලා පලාපල කියන සාස්තරකාරයො ඔහෙ දැකලා ඇති. තමන්ට ජීවත්වෙන්න ඕන විදියක් සොයාගන්න බැරිඋනත් අනුන්ට ජීවත්වෙන විදිය කියාදෙන්න දන්න මේ මිනිස්සුන්ට හුඟක් දෙනා රැවටෙනවා. දුප්පත් මෝඩ මිනිස්සුන්ගෙ කල්පනාව සාස්තරකාරයා ලොකු විද්‍යාඥයෙක් කියලායි. ඒක නිසා බොහොම අමාරුවෙන් හම්බ කරපු සල්ලි ටික ඒ හාදයන්ට දීලා බොරු අහගන්නවා. ඊගොල්ල කියන විදියට වැඩ කරන්න ගිහිල්ලා තවත් අමාරුවෙ වැටෙන්න වෙනවා.

ගමේ ගෙදරක දරුවෙක් උපන්නාම උපන් වෙලාව සාස්තරකාරයාට දෙනවා. සාස්තරකාරයා එතකොට කේන්දරේ හදනවා. කේන්දරේ බලාලා දරුවා ලොකුඋනාම කරන්න යන්නෙ මොකක්ද කියලා දැනගන්න පුලුවනි. දරුවාට නම තියන්නෙත් සාස්තර කාරයා කියන හැටියට. කසාදයක් බඳින්න ඕන උනාම ගෑනිගෙයි මිනිහාගෙයි කේන්දර දෙක සාස්තරකාරයාට දෙනවා. මංගල්ලෙ හරි යනවා ද නැද්ද කියලා සාස්තරකාරයා දන්නවා! කොටින් කියනවා නම් සාස්තරකාරයා නොදන්න දෙයක් නෑ.

අත බලාලත් සාස්තර කියන්න පුලුවනි. පාර අයිනෙ ඉඳගන සාස්තර කියන වැඩි දෙනා අත බලාලා සාස්තර කියන අය. සත විසිපහක් දුන්නාම අත බලාලා අනාගතේ ගැන නොයෙක් දේවල් කියනවා. සාස්තරකාරයා ලඟ නොයෙක් තෙල් ජාතින් තියෙනවා.

ඔහේගෙ අනාගතේ අපල නම් සාස්තරකාරයා තෙල් ටිකක් දේවි. ඒ තෙල බොහොම වටින තෙලක්! උදේට උදේට ඒකෙන් බිංදුවක් නලලෙ ගාන්න - සේරම අපල ඒකෙන් දුරුවෙනවා.

ඔහේට මතකද මේ ලඟදි ඉන්දියාවෙ සාස්තරකාරයො ලෝකෙ විනාසවෙන්න එනවායි කියාපු හැටි? දෙයියන්ට පින් සිද්දවෙන්න, ලෝකෙ නම් තාම විනාසවෙලා නෑ. නමුත් ලෝකෙ විනාස උනේ නැත්තෙත් සාස්තරකාරයා හන්දා! සාස්තරකාරයො ග්‍රහයො සතුටුකරන්න උදේ සවස යාතිකා කල නිසා තේ ලෝකෙ විනාස නුනෙ!

අත බලනවා to read palm

අනාගතේ future

අපල ill luck, misfortune

අහගන්නවා to get explained, listen

ඇතිකරගන්නවා to cherish

කනගාටුව misery

කරදරේ වැටෙනවා to fall into difficulty

කල්පනාව idea, thought

කවුද who

කේන්දරේ horoscope

ගරුබුහුමන් respect

ගාගන්නවා apply on oneself

ග්‍රහයා planet

තෙල් oil

දුරුවෙනවා to disappear

දෙයියන්ට පින් සිද්දවෙන්න 'thanks to gods'

දෙයියො god

නලල forehead

පත්වෙනවා to get into

පලාපල forecast of good and bad



බිංදුව drop

මංගල්ලෙ wedding

යාතිකා කරනවා to chant

රැවටෙනවා to be deceived

ලබනවා to get

වටින valuable

වරදිනවා to go wrong

වැඩිවැඩියෙ more and more

විද්‍යාඥයා scientist

විනාසවෙනවා to be destroyed

වෙන්න තියෙනවා to have to happen (by fate)

වෙලාව time

සාස්තරකාරයා astrologer

හන්දා because

හපනා clever fellow

හරියනවා to become right

හාදයා chap

## ３０. වැඩියෙ හොඳ සල්ලි ද? උගත්කම ද?

උගත්තු සාමාන්‍යයෙන් දුප්පත් අය නේද? පොත් කියවාලා පෝසත් උනේ කවුද? විශ්වවිද්‍යාලවල මහාචාර්යවරු කොච්චර අමාරුවෙන් වැඩ කෙරුවත් තෙල් කොම්පැනි කාරයෙක් මාසෙකදි හම්බකරන සල්ලි අවුරුද්දකින් වත් හම්බකරන්න බෑ. මිනිස්සු ජීවත් වෙන්නෙ දුප්පත් වෙන්න ද? නෑ. එහෙනම් මහන්සි වෙලා ඉගනගන දුප්පත් ජීවිතයක් ගතකරන්නෙ මොකෝ?

ඉගනගන්න කොච්චර සල්ලි ඕන ද! ඉස්කෝලෙ යනකොට ඉස්කෝල කාසි ඕන. පොත් ගන්න ඕන. ඇඳුම් පැලඳුම් ගන්න ඕන. මේවාට සල්ලි ගස්වලින් කඩනවා ද? දෙමව්පියො මහන්සි වෙලා හම්බකරන සල්ලි අපි ඉස්කෝලවලට වියදම් කරනවා. එහෙම වියදම් කර කර මහන්සි වෙනවා. එයින් බාගයක් වත් වියදම් කරන්නෙ නැති අය ලක්ෂපතියො වෙනවා.

නමුත් ජීවිතෙයි කියන්නෙ සල්ලි නෙවි. සල්ලි විතරක් තිඋනාට මදි. මොළේ නැත්තං ඒ සල්ලි හරි හැටියට පාවිච්චි කරන්න බැරිවෙනවා. වාසනාව කියන්නෙ සල්ලි නම්, සල්ලි තියෙන මිනිස්සු වාසනාවන්තයො වෙන්න ඕන. නමුත් සල්ලි තියෙන කීදෙනෙක් කනගාටුවෙන් ජීවත් වෙනවා ද! තමන්ගෙ පවුලෙ කරදර; වතුප්පිටිවල කරදර! ඒවා විසඳාගන්න ඒ මිනිස්සුන්ට ඥානයක් නෑ.

උගත්තු යම් යම් දේවල් ගැන හරි හැටි කල්පනා කරන්න දන්නවා. ලෝකෙ හොඳ නරක දන්නවා. ඒක නිසා අනුන්ගෙ හිත් රිද්දන්නෙ නැතුව වැඩකරන්න දන්නවා. සිහි-බුද්ධියෙන් වැඩකරන්න දන්නවා. ඒක නිසා උගතාට හිතේ බරක් නෑ; කනගාටු අඩුයි; කරදර අඩුයි; තන්හාව අඩුයි. උගත්තු නිතරම මහන්සි ගන්නෙ මිනිස්සුන්ට සේවයක් කරන්න, තමන්ගෙ මල්ල තර කරගන්න නෙවි. උගතා පොතක් ලියලා විඳින ප්‍රීතිය තෙල් කොම්පැනිකාරයා මුලු ජීවිතේ ම විඳින්නෙ නෑ. උගතා අනුන්ට යමක්කමක් වටහාදෙන්න දන්නවා. කරදරේකදි ආපදාවකදි අවවාදයක් දෙන්න දන්නවා.

ලෝකෙ දියුනුවෙන්නෙ උගත්තු නිසා. දැන් මිනිස්සු හඳට යනවා. ලෝකෙ වටේ මිනිත්තු කීපෙකින් ගිහින් එන්න පුලුවන් වූ. මූදෙන් ලුනු වතුර අරගන බොන වතුර හදන්න හදනවා. මනුස්සයාට ඕන සැපපහසුකම් ගැන කල්පනාකරලා ඒවා ලබා දෙන්න

මහන්සි වෙන්නෙ උගත්තු. ඒ අය ඉගෙනගන්නෙ නැත්නං මේ විදියෙ වැඩකරන්නෙ කොහොමද? හැබැයි, මේ වගේ වැඩ වැඩි දියුණු කරන්න සල්ලිත් ඕන. සල්ලි නැතුව මොකුත් කරන්න බෑ. ඒක නිසා ලෝකෙට සල්ලිකාරයන්ගෙනුත් ප්‍රයෝජනයක් තියෙනවා. ඒක වැරැද්දක් තියෙනවා: සමහර උගත්තු සල්ලිකාරයන්ට කැමති නෑ; සමහර සල්ලි කාරයො උගත්තුන්ට කැමති නෑ. මේ දෙගොල්ල එකතු උනොත් කොච්චර වැඩ කරන්න පුළුවන් ද කියලා උගත්තුයි සල්ලිකාරයොයි දන්නෙ නෑ.

ආපදාව danger

උගතා learned man

කාසි cash, money, fees

ඥානෙ wisdom, knowledge

තන්හාව greed, craving

තරකරගන්නවා to increase (one's own possessions)

ප්‍රීතිය satisfaction

මල්ල bag

මහාචාර්යවරයා professor

මොකෝ why

යමක් කමක් something of value

යම් යම් දේවල් various things

රැකිරස්සාවල් occupations

රිද්දනවා to hurt (trans)

ලස්සපතියා millionaire

වටහා දෙනවා to explain

වටේ around

වතුප්පිටි land and property

වාසනාව fortune

වාසනාවන්තයා fortunate man

වැඩි දියුණු කරනවා to develop (trans)



වැරැද්ද mistake

විඳිනවා to experience

විසඳාගන්නවා to settle by one's own self

සල්ලිකාරයා rich man

සැපපහසුකම් comforts

සිහිබුද්දිය wisdom

සේවෙ service

හඳ moon

## 31. දුර්ජනයො

දුර්ජනයො හරියට නයි පොළොංගු වගෙයි. කවදාවත් විශ්වාස කරන්න බෑ. ඒ මිනිස්සුන්ගෙ හිත්වල අනුන් ගැන කැක්කුමක් නෑ. ඒක නිසා ඒ අයට කරන්න බැරි වැඩක් නෑ. ඒ ගොල්ල මිනිස්සුත් එක්ක ආශ්‍රයේ කරලා ටික දවසක් ගියාම ඒ මිනිස්සු අමාරුවෙ වැටෙන හැටි දැනෙනවා. 'සත්පුරුෂයන්ගෙන් ඈත්වෙන එක දුකක්. නමුත් අසත්පුරුෂයොත් එක්ක ආශ්‍රයේට වැටෙන එක ඊටත් වැඩියෙ දුකක්.' කියලා සංස්කෘත කිමක් තියෙනවා. ඒක සම්පූර්ණ ඇත්ත.

සත්පුරුෂයො අනුන්ගෙ දුක දන්නවා. ඒ ගොල්ලන්ට අනුන්ගෙ දුක දැක්කාම අනුකම්පා හිතෙනවා. අනුන්ගෙ දුකේදි ඒ ගොල්ල කවදාවත් පිටුපාලා යන්නෙ නෑ. තමන්ට දුක් විඳින්න උනත් අනුන් දුකෙන් බේරාගන්න ඒ ගොල්ල නිතරම උත්සාහ ගන්නවා. සත්පුරුෂයා දුකේදියි සැපේදියි දෙකේදිම වෙනසක් නැතුව මිත්‍රවෙලා ඉන්නවා. නමුත් අසත්පුරුෂයො සැපේදි මිත්‍ර වෙනවා, දුකේදි මොකක් හරි බොරුවක් කියලා අයින් වෙනවා. 'දුකේදියි සැපේදියි දෙකේදිම හොඳින් ඉන්න යහපත් මිත්‍රයො බිත්තියෙ ඇඳපු සිත්තමක් වගේ කවදාවත් පිටුපාන්නෙ නෑ.' කියලා සිංහල කවියක ත්යෙනවා මට මතකයි. ඒකත් සම්පූර්ණ ඇත්ත.

දුර්ජනයො මහ කපටි. කපටියා නිතරම බලන්නෙ තමන්ගෙ වාසියට අනුන්ට උගුල් අදින්නයි. අනුන්ට උගුල් අදින එක හොඳ වැඩක් නෙවි. අහිංසක මිනිස්සු අමාරුවෙ දාන්න හොඳ නෑ. නමුත් දුර්ජනයා එහෙම කල්පනා කරන්නෙ නෑ. බටහිර රටවල්වල නරියා ගැන තියෙන කතාවල් අහලා තියෙනවා නේ? ඒ කතාවල්වල නරියා පෙන්නුම් කරලා තියෙන්නෙ අලි කපටියෙක් හැටියට නේ? අන්න, දුර්ජනයාත් ඒ නරියා වගෙයි. අනුන් වාටුවෙන් රවට්ටන්න ඒගොල්ල හරි හපන්නු. අහලා තියෙනවා ද නරියා දවසක් කාක්කෙක් රවට්ටාපු හැටි?

දවසක් කාක්කෙකුට කේජු කෑල්ලක් හම්බඋනා. ඌ ඒක බොහොම සන්තෝසෙන් ගහක් උඩට ගෙනිහිල්ලා කන්න ලෑස්තිඋනා. ඔය වෙලාවෙදි නරියා එතනින් යනවා. නරියා දැක්කා කාක්කා ලඟ කේජු කෑල්ලක් තියෙනවා. මිනිහා කල්පනා කලා ඒක ගන්න උපායක්. කපටින්ට හොඳට නුවන තියෙනවා! නරියා ගහ යටට ගිහිල්ලා කාක්කා වාටු

තරන්න පටන්ගත්තා. 'අනේ, ඔහේ කොච්චර ලස්සන ද! ඔහේගෙ හොටේ වගේ හොටයක් මටත් තියෙනවා නම් කොච්චර හොඳ ද! ඔහේගෙ ඇඟ ඔච්චර දිලිසෙන්නෙ කොහොම ද? ඔහේගෙ පිහාටු හදලා තියෙන්නෙ මැණික්ගල්වලින් ද? ඔහේගෙ ඇඟ ඔච්චර ලස්සන නම් ඔහේ සිංදු කියන කොට කොච්චර ලස්සන ඇත්ද!'

නරියා මෙහෙම කියන කොට කාක්කා රැවටුනා. රැවටිලා සිංදුවක් කියන්න කට ඇරියා. අනේ, එතකොට කටේ තිබුනු කේජු කෑල්ල එක පාරටම බිම වැටුනා. නරියා 'ඒයි, කාක්කො, තමුසෙ හරි පල් මෝඩයා, නේද?' කිය කිය කේජු කෑල්ලත් අරගන යන්න ගියා. මෝඩ කාක්කාට බඩගින්නෙ ඉන්න උනා.

දුර්ජනයොත් මිනිස්සු අමාරුවෙ දාන්නෙ මෙහෙමයි. තමන්ගෙ මල්ල තර කරගන්න එක මිසක් අනිත් කිසි දෙයක් ගැන ඒගොල්ල කල්පනා කරන්නෙ නෑ. දුර්ජනයො යාලුවො ඇතිකරගන්නෙ තමන්ගෙ වැඩ කරවාගන්න. සත්පුරුෂයො යාලුවො ඇතිකර ගන්නෙ ඒගොල්ලන්ට වැඩ කරලා දෙන්න. මේක තමයි දුර්ජනයායි සත්පුරුෂයායි අතරෙ තියෙන වෙනස.

අනුකම්පාව sympathy

අන්න there you are

අයින්වෙනවා to get to a side

අලි big

අහිංසක innocent

අසත්පුරුෂයා wicked person

අසප්පුරුෂයා wicked person

ආස්සරේ association, friendship

ආස්සරේ කරනවා to associate

ඈත්වෙනවා to get away

උගුල trick

උගුල් අදිනවා to play tricks

උපාය plot, device

එක පාරටම at once



ඒයි Say!

කපටියා cunning fellow

කවිය poem, verse

කාක්කා crow

කැක්කුම feeling

කීම saying

කේජු cheese

චාටුකරනවා to flatter

චාටුව flattery

දුර්ජනයා wicked man

නයා cobra

නයි පොළොංගු වගේ like cobras and vipers

නරියා fox

නුවන intelligence

පල් මෝඩයා big fool

පිටුපානවා to turn back, ignore

පිහාට්ට feather

පෙන්නුම් කරනවා to depict

පොලඟා viper

බිත්තිය wall (of house)

මැණික්ගල precious stone

මිත්‍රයා friend

මිත්‍රවෙනවා to become friendly

මිසක් except

යාලුවා friend

ලෑස්තිවෙනවා to get ready

වාසිය profit

විස්වාස කරනවා to trust

සත්පුරුසයා gentleman, good person

සප්පුරුසයා gentleman, good person

සම්පූර්න complete

සැපේ comfort

සිත්තම painting

සිංදු කියනවා to sing songs

සිංදුව song

හොටේ beak



32. ලංකාව ආංඩුකරන හැටි

ලංකාව පොදුරාජ්‍යමංඩලේට අයිති රටක්. ඩොමීනියන් එකක් නිසා අපි එංගලන්තෙ මහ රැජින අපේ මහ රැජින හැටියට සලකනවා. ඉන්දියාවත් පොදුරාජ්‍යමංඩලේට අයිතියි. නමුත් ඩොමීනියන් එකක් නෙවි. ඉන්දියාව සමූහාංඩුවක්. පකිස්තානෙත් සමූහාංඩුවක්. කැනඩාවයි ඕස්ට්‍රේලියාවයි දෙක පොදුරාජ්‍යමංඩලේ තියෙන ඩොමීනියන් දෙකක්. ලංකාව ලඟදි සමූහාංඩුවක් කරන්න කටයුතු යොදාගන යනවා.

ලංකාව ආංඩුකරන්න පාර්ලිමේන්තුවක් තියෙනවා. ලංකාවෙ පාර්ලිමේන්තුව එංගලන්තෙ පාර්ලිමේන්තුවට සමානයි. මන්ත්‍රීවරු පත්කරන්නෙ මහජනයා. රට පාර්ලිමේන්තු කොට්ඨාස ගනනකට බෙදලා තියෙනවා. ඒ ඒ කොට්ඨාසෙ මහජනයා තමන් කැමති පක්ෂෙන් නියෝජිතයන් තෝරනවා. ඒ තෝරන්නෙ රහස් ඡන්දෙන්. ඡන්දෙ දෙන්නෙ ඡන්දපලට ගිහිල්ලා ඡන්දපත්‍රිකාවෙ තමන් කැමති මිනිහාගෙ නම ඉස්සරහින් කතිරයක් ගහලා. දැනට ලංකාවෙ දේසපාලන පක්ෂ කීපයක් තියෙනවා. ලංකාවට නිදහස හම්බ උනු හැටියෙ වැඩි ඡන්ද ගානක් හම්බඋනේ එක්සත්ජාතික පක්ෂෙට. දැන් ආංඩුව සිරි ලංකා නිදහස් පක්ෂෙ යි. ලංකා සමසමාජ පක්ෂෙයි කොමියුනිස්ට් පක්ෂෙයි ඒ පක්ෂෙට සම්බන්දයි. ඇත්ත වසයෙන් ලංකාවෙ දැන් තියෙන්නෙ පක්ෂ දෙකේ ආංඩු ක්‍රමයක්. ලංකා පාර්ලිමේන්තුවෙ විදේස කටයුතුයි රටේ ආරස්සාව පිළිබඳ කටයුතුයි බාර අගමැතිතුමාට. මුදල්, අද්‍යාපනේ, ස්වදේස කටයුතු ආදිය බාරව වෙන වෙන ඇමතිවරු ඉන්නවා. හැම ඇමතිකෙනෙකුටම උප ඇමතිකෙනෙක් ඉන්නවා. උප ඇමතිට පාර්ලිමේන්තු ලේකම් කියලාත් කියනවා. හැම දෙපාර්තමේන්තුවකම ඉස්තිර ලේකම්කෙනෙක් ඉන්නවා. ඩිරෙක්ටර් කෙනෙකුත් ඉන්නවා. ඩිරෙක්ටර් යටතෙ තව හුඟක් නිලදාරි ඉන්නවා. ඉස්තිර ලේකම්ලායි ඩිරෙක්ටර්ලායි අනිත් නිලදාරියි ආංඩුවෙ සේවකයො. ආංඩුවෙ සේවකයන්ට දේසපාලන පක්ෂවලට බැඳිලා කටයුතුකරන්න තහනම්. ඒගොල්ලන්ට ඡන්දෙ දෙන්න තහනමක් නෑ.

මහ ආංඩුවෙන් තමයි සේරම වැදගත් වැඩ කරන්නෙ. කොළඹ, මහනුවර වගේ වැදගත් නගරවල නගරසබා තියෙනවා. නගරසබාවලින් කරන්නෙ නගරෙ දියුනු කිරීමෙ වැඩ. පුංචි නගරවල සුළු නගර සබා කියලා සබා ජාතියක් තියෙනවා. ගම්වල ගම්සබා

තියෙනවා. දැන් නගරසබාවලයි සුළු නගරසබාවලයි ගම්සබාවලයි සාමාජිකයො තෝරන්-
නෙත් දේසපාලන පක්සවලින්. ඒක නිසා දැන් ලංකාවෙ පක්ස ආංඩුක්‍රමේ පැළපදියම්
වෙලා තියෙනවා.

අද්‍යාපනේ   education

ආරස්සාව   protection

ආංඩුකරනවා   to rule, govern

ඇමති වරයා   minister

ඇත්ත වසයෙන්   strictly speaking, really

උප ඇමති   junior minister

ඒ ඒ   various

ඕස්ට්‍රේලියාව   Australia

කටයුතු   activities

කතිරෙ   cross

කැනඩාව   Canada

කොට්ඨාසෙ   district, electorate

ගනන   number

චන්ද පත්‍රිකාව   ballot paper

චන්ද පල   polling booth

චන්දෙ   vote, election

චන්දෙ දෙනවා   to give vote

ඩිරෙක්ටර්   director

ඩොමීනියන් එක   Dominion

නගරසබාව   city council

නිදහස   freedom, independence

නියෝජිතයා   representative

නිලදාරියා   officer

පකිස්තානෙ   Pakistan



පක්ස ආංඩුක්‍රමේ   party politics

පත්කරනවා   to appoint

පාර්ලිමේන්තු ලේකම්   parliamentary secretary

පැළපදියම්වෙනවා   to be established

පොදුරාජ්‍යමංඩලේ   commonwealth

බාරව   in charge

බැඳෙනවා   to be bound

බෙදනවා   to divide

මන්ත්‍රීවරයා   member of parliament

මහ ආංඩුව   central government

මහ රැජින   queen

යටතෙ   under

රහස් චන්දෙ   secret ballot

ලංකා සමසමාජ පක්සෙ   Lanka Samasamaja Party

ලේකම්   secretary

විදේස කටයුතු   foreign affairs

සිරි ලංකා නිදහස් පක්සෙ   Sri Lanka Freedom Party

සමූහාංඩුව   republic

සාමාජිකයා   member

සුළු නගරසබා   minor city councils

සේවකයා   servant

ස්තිර, ඉස්තිර   permanent

ස්තිර ලේකම්   permanent secretary

ස්වදේස කටයුතු   home affairs

## ३३. කවිකොලකාරයා

කවිකොලකාරයො බලන්න නම් කොලඹට යන්න ඕන. කොලඹ බස් නවත්තන තැන බෝගහක් තියෙනවා. ඒ බෝගහ යට හැමදාම කවිකොලකාරයො දෙතුන්දෙනෙක් ඉන්නවා. රටේ මොකක් හරි සිද්ද උනොත් ඒක ගැන කවි හදලා කවිකොල අච්චුගහන මිනිස්සු ජාතියක් ඉන්නවා. ගමක ගෑනියෙකුට නිඹුල්ලු තුන්දෙනෙක් හම්බඋනොත් ඒක පුදුම සිද්දියක්. කවිකොලකාරයො ඒක ගැන එක පාරටම කවිකොලයක් අච්චු ගහනවා. ගෑනියෙක් හොරෙන් පැනලා ගියොත්, වැදගත් කෙනෙක් මැරුනොත්, ලොකු හොරකමක් කෙරුනොත්, නැත්තං වැදගත් කෙනෙකුට අසනීපයක් හැදුනොත්, ගින්නක් ඇතිඋනොත් කවිකොලකාරයාට හරි වාසියි. කවිකොලයක් ගහන්න වැඩි වෙලාවක් ගතවෙන්නෙ නෑ. සිද්දිය උනේ අද හවස නම් හෙට උදේ වෙනකොට කවිකොලේ ලෑස්තියි. කවිකොල අච්චුගහන මිනිස්සු ඒ ඒ පලාත්වලට කවිකොල යවනවා. කවිකොලකාරයො බස් නවත්තන තැන්වල, ලොකු හන්දි කිට්ටුව, සාමාන්‍යයෙන් මිනිස්සු ගැවසෙන තැන්වල ඉඳගන මේ කවිකොල කියවනවා. කවිකොලකාරයාට බොහොම සද්දෙන් තාලෙට කියවන්න පුලුවන්. මිනිස්සු සත පහ පහ දීලා කවිකොල අරගන්නවා.

කවිකොලවල කවි හදන්නෙ එකම තාලෙකටයි. ඒ තාලෙට කවිකොල තාලෙයි කියලා කියන්න පුලුවන්. ඒ තාලෙ නිසා කවිකොලයක්ද නැද්ද කියලා දුරදිම අඳුනගන්නහැකියි. මිනිහා උගුර කඩාගන කෑගහන සද්දෙ හුඟක් දුරට ඇහෙනවා. කවිකොලකාරයා කවිකොල විතරක් නෙවි, නොයෙක් පොත් ජාතිත් විකුනනවා. ඒ පොත් වැදගත් පොත් නෙවි; නමුත් මහජනයා ඒවා සල්ලි දීලා ගන්නවා. සාමාන්‍යයෙන් ඒ පොත් එකක් සත අගේකට වැඩි වෙන්නෙ නෑ. මේ වෙළඳාමෙන් මිනිහාට ලොකු ලාබයක් ගන්න බෑ. සමහරවිට හවස් වෙනකොට රුපියල් දෙකක් තුනක් හම්බවෙනවා. සමහරදාට සත පනහකට වැඩියෙ හම්බකරන්න බෑ. මිනිහාට පවුලට කන්න දෙන්න ඒ සල්ලි මදියි. හත් අට දෙනෙකුට සත පනහකින් කන්න පුලුවන් ද? ඒක නිසා සමහර කවිකොලකාරයො තවත් සුලු සුලු බිස්නස් කරනවා. සමහරු පත්තර විකුනනවා. සමහරු තෙල් බේත් ජාති විකුනනවා. සමහර කවිකොලකාරයො ලඟ ඕනම ලෙඩකට හොඳ තෙලක් තියෙනවා. කෙස්ස යනවා නම් ඒ තෙල දවසට දෙසැරයක් ඔලුවෙ ගාන්න. කොන්ද කකියනවා නම් කොන්දෙ ගාලා

අතගාන්න. බඩ යනවා හොර නම් මේ තෙලෙන් බිංදු කීපයක් බොන්න. බඩ රිදෙනවා නම් තෙල් බිංදු දෙකක් බඩේ ගාන්න. මේ තෙල අපේ වෙදමහත්තයාගෙ බේත් ගුලිය වගෙයි නේද? කවිකොලකාරයා ඉංගිරිසි බේතුත් විකුනනවා. පිටරටින් ගෙන්නාපු බේත් කියලා නොයෙක් ජාතිවල පුංචි පුංචි බෝතල මිනිහා ළඟ තියෙනවා. ඒ බේත් හැබෑ බේත් ද නැද්ද කියලා කවුරුවත් දන්නෙ නෑ. නමුත් ගොඩක් දෙනා ඒවා සල්ලිවලට ගන්නවා. හදිස්සියකට පනාවක්, ලේන්සුවක්, පෑනක් එහෙම ගන්න ඕන උනොත් කවිකොල කාරයාගෙන් ගන්න පුලුවනි.

අච්චු ගහනවා   to print

අරගන්නවා   to buy

ඇතිවෙනවා   to take place

උගුර   throat

උගුර කඩාගන   'at the top of his voice'

කකියනවා   to ache

කවිකොලකාරයා   person selling leaflets written in verse

කවිකොල ගහනවා   to print leaflets in verse

කවිකොලේ   leaflet composed in verse

කවි හදනවා   to compose poetry

කෑ ගහනවා   to shout

කෙරෙනවා   to be done

කෙස්ස   hair on head

ගානවා   to apply

ගැවසෙනවා   to throng together

ගින්න   fire

තාලෙ   rhythm

තෙල් බේත් ජාති   oils and medicines

දුරදිම   at a distance

නිඹුල්ලු   twins, triplets, etc.



පනාව   comb

පැනලා යනවා   to run away

පෑන   pen

බඩ යනවා   to move bowels

බඩ යනවා හොරයි   to be constipated

බිස්නස් එක   business

මැරෙනවා   to die

ලෑස්ති   ready

ලේන්සුව   handkerchief

සද්දෙ   noise

සිද්දිය   incident

සුලු   small, unimportant

හදිස්සිය   emergency

හැබෑ   true

හොරෙන් පැනලා යනවා. to elope

## 34. ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බංඩාරනායක තුමා

1948 දි ලංකාවට නිදහස හම්බඋනාට පස්සෙ පිහිටෙව් ආංඩුවෙ සබානායක වෙලා හිටියෙ බංඩාරනායක මහත්මයා. උන්නැහෙ එතකොට පලාත් පාලනේ පිලිබඳ ඇමතිකමත් ඉසුලුවා. උන්නැහෙ දුප්පතාට බොහොම හිතවත් අවංක පුද්ගලයෙක්. උන්නැහෙගෙ පියා බටහිර පන්නෙට ජීවත්උනු බොහොම පෝසත් කෙනෙක්. ඒක නිසා බංඩාරනායක තුමා පුංචි කාලෙ ඉඳලාම බටහිර විදියට ජීවත්වෙන්න පුරුදුඋනා. උන්නැහෙ ඉගනගත්තෙ ඔක්ස්පර්ඩ් විස්වවිද්‍යාලෙ. නමුත් ආපහු ලංකාවට ආවාට පස්සෙ එතුමා රදල විදියට ජීවත්වීම අත ඇරලා දුප්පත් මිනිස්සුන්ගෙ දියුනුවට වැඩකරන්න පටන් ගත්තා. වාං විදියට ජීවත්වෙන්න පුරුදුඋනා. උන්නැහෙ පොඩි කාලෙ උන්නැහෙට ඇඳුම් මැහුවෙ එංගලන්තෙ ටේලර්ලා ලු. නමුත් උන්නැහෙ ඒ විහිලු අත ඇරලා ලංකාවෙ වියන රෙදි අඳින්න පටන්ගත්තා. අවංක පුද්ගලයෙක් නිසා උන්නැහෙට මහජනයා බොහොම ආදරේ කරන්න පටන්ගත්තා. බංඩාරනායක මහත්මයා බොහොම දක්ස කතිකයෙක්. උන්නැහෙ කතාකරන කොට අහගන ඉන්න ලස්සනයි. සිංහල ඉංගිරිසි දෙකෙන්ම එකවගේ ලස්සනට කතාකරන්න පුලුවනි.

1952 දි විතර උන්නැහෙ අලුත් දේසපාලන පක්සයක් පිහිටෙව්වා සිරි ලංකා නිදහස් පක්සෙයි කියලා. උන්නැහෙගෙ වස්තුව හුඟක් දුරට දේසපාලන කටයුතුවලටයි යෙදෙව්වෙ. 1956දි උන්නැහෙගෙ පක්සෙට ජය ලැබුනා. ඒකනිසා උන්නැහෙ ලංකාවෙ අගමැති උනා. උන්නැහෙ අගමැති උනු හින්දා මිනිස්සු උත්සව පවත්ත පවත්ත සන්තෝස උනා. උන්නැහෙ අගමැති වෙලා හිටිය කාලෙ රටේ හුඟක් කලබල ත්උනා. ඒකනිසා උන්නැහෙට තමන්ගෙ හිතේ හැටියට ආංඩුකරන්න ඉඩක් හම්බඋනේ නෑ. නමුත් උන්නැහෙ රටේ අමාරු ප්‍රස්න සේරම ඉස්මතුකරලා මහජනයා ඉදිරියෙ තිව්වා. මේ කාලෙදි සමහරු උන්නැහෙට හතුරුකම් කරන්න පටන්ගත්තා. ඔයින් මෙයින්, කවුද මෝඩ මිනිහෙක් උන්නැහෙට වෙඩි තිව්වා. වෙඩි කෑ දාට පස්සෙන්දා උන්නැහෙ අන්තරා උනා. අන්තරා වෙන්න ඉස්සෙල්ලා උන්නැහෙ කිව් එක දන්නවා ද? 'කවුද මෝඩ මනුස්සයෙක් මට වෙඩි තිව්වා. නමුත් ඒ මනුස්සයාට හිරිහැර කරන්න එපා. මයිත්රී කරන්න. මට සනීප වේවි. එතකොට මම ආයෙත් තමුන්නාන්සෙලාට සේවය කරන්න එන්නම්.' කියලා කිව්වා.

## 34. ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බංඩාරනායක තුමා

1948 දි ලංකාවට නිදහස හම්බඋනාට පස්සෙ පිහිටෙව් ආංඩුවෙ සබානායක වෙලා හිටියෙ බංඩාරනායක මහත්මයා. උන්නැහෙ එතකොට පලාත් පාලනේ පිලිබඳ ඇමතිකමත් ඉසුලුවා. උන්නැහෙ දුප්පතාට බොහොම හිතවත් අවංක පුද්ගලයෙක්. උන්නැහෙගෙ පියා බටහිර පන්නෙට ජීවත්උනු බොහොම පෝසත් කෙනෙක්. ඒක නිසා බංඩාරනායක තුමා පුංචි කාලෙ ඉඳලාම බටහිර විදියට ජීවත්වෙන්න පුරුදුඋනා. උන්නැහෙ ඉගනගත්තෙ ඔක්ස්පර්ඩ් විස්වවිද්‍යාලෙ. නමුත් ආපහු ලංකාවට ආවාට පස්සෙ එතුමා රදල විදියට ජීවත්වීම අත ඇරලා දුප්පත් මිනිස්සුන්ගෙ දියුනුවට වැඩකරන්න පටන් ගත්තා. චාං විදියට ජ්වත්වෙන්න පුරුදුඋනා. උන්නැහෙ පොඩි කාලෙ උන්නැහෙට ඇඳුම් මැහුවෙ චංගලන්තෙ ටේලර්ලා ලු. නමුත් උන්නැහෙ ඒ විහිලු අත ඇරලා ලංකාවෙ වියන රෙදි අඳින්න පටුන්ගත්තා. අවංක පුද්ගලයෙක් නිසා උන්නැහෙට මහජනයා බොහොම ආදරේ කරන්න පටන්ගත්තා. බංඩාරනායක මහත්මයා බොහොම දක්ස කතිකයෙක්. උන්නැහෙ කතාකරන කොට අහගන ඉන්න ලස්සනයි. සිංහල ඉංගිරිසි දෙකෙන්ම එකවගේ ලස්සනට කතාකරන්න පුලුවනි.

1952 දි විතර උන්නැහෙ අලුත් දේසපාලන පක්සයක් ප්හිටෙව්වා සිරි ලංකා නිදහස් පක්සෙයි කියලා. උන්ැහෙගෙ වස්තුව හුඟක් දුරට දේසපාලන කටයුතුවලටයි යෙදෙව්වෙ. 1956දි උන්නැහෙගෙ පක්සෙට ජය ලැබුනා. ඒකනිසා උන්නැහෙ ලංකාවෙ අගමැති උනා. උන්නැහෙ අගමැති උනු හින්දා මිනිස්සු උත්සව පවත්ත පවත්ත සන්තෝස උනා. උන්නැහෙ අගමැති වෙලා හිටිය කාලෙ රටේ හුඟක් කලබල ත්උනා. ඒකනිසා උන්නැහෙට තමන්ගෙ හිතේ හැටියට ආංඩුකරන්න ඉඩක් හම්බඋනේ නෑ. නමුත් උන්නැහෙ රටේ අමාරු ප්‍රස්න සේරම ඉස්මතුකරලා මහජනයා ඉදිරියෙ තිව්වා. මේ කාලෙදි සමහරු උන්නැහෙට හතුරුකම් කරන්න පටන්ගත්තා. ඔයින් මෙයින්, කවුද මෝඩ මිනිහෙක් උන්නැහෙට වෙඩි තිව්වා. වෙඩි කෑ දාට පස්සසෙන්දා උන්නැහෙ අන්තරා උනා. අන්තරා වෙන්න ඉස්සෙල්ලා උන්නැහෙ කිව් එක දන්නවා ද? 'කවුද මෝඩ මනුස්සයෙක් මට වෙඩි තිව්වා. නමුත් ඒ මනුස්සයාට හිරිහැර කරන්න එපා. මයිත්රි කරන්න. මට සනීප වේවි. එතකොට මම ආයෙත් තමුන්නාන්සෙලාට සේවය කරන්න එන්නම්.' කියලා තිව්වා.

කොච්චර හොඳ කියමනක් ද! උන්නැහෙගෙ මරනෙ ආරංචි උනු හැටියෙ මහජනයා බොහොම කනගාටුවට පත්උනා. උන්නැහෙගෙ ආදාහනේ බොහොම ජයට පැවැත්තුවා. දැන් මිනිස්සු උන්නැහෙගෙ නමට දෙවියකුට වගේ සලකනවා.

අතඅරිනවා to give up

අන්තරා වෙනවා to pass, away

ආදරේ කරනවා to love

ආදාහනේ cremation

ආරංචි වෙනවා to get to know

ඉඩ space, room

ඉදිරියෙ in front

ඉස්මතු කරනවා to raise (problems etc.)

උසුලනවා to hold (a position)

ඔයින් මෙයින් in this manner

කතිකයා orator

කවුද some (one)

කවුද මිනිහෙක් some man

කියමන saying

චාං විදිය simple way

ජය victory

ජයට in a grand manner

ටේලර් tailor

තමුන්නාන්සෙ you (honorific)

දෙවියා god

පත්වෙනවා to get into, be appointed

පලාත්පාලනේ local administration

පස්සෙන්දා the following day

පියා father



පුද්ගලයා individual

ප්‍රශ්නෙ question, problem

බටහිර පන්නෙ western fashion

මෛත්‍රී කරනවා to love, show kindness

මරනෙ death

මහනවා to sew, stitch

යොදවනවා to utilize

රදළ විදිය aristocratic way

රෙද්ද cloth

වස්තුව wealth

වියනවා to weave

වෙඩි කනවා to be shot

වෙඩි තියනවා to shoot

සභානායක leader of the house of parliament

සේවය කරනවා to serve

හතුරුකම emnity

හැටියෙ as soon as

හින්දා because

## 35. වට්ටිඅම්මා

ආදායම මදි පවුල්වල පිරිමි විතරක් නෙවි, ගෑනුත් රස්සාව කරන්න ඕන. ආදායම හොඳ පවුල්වලත් ගෑනු රස්සාව කරනවා: නමුත් ඒ කරන්නෙ ඉගැන්නිම වගේ රස්සාවල්. දුප්පත් පවුල්වල ගෑනු නොයෙක් විදියෙ කුලී වැඩට යනවා. වතු උදලු ගෑම, ගොයම් කපන්න යෑම, ගෙවල්වල වැඩකාරකම් කරන්න යෑම වගේ රස්සාවල් තමයි දුප්පත් ගෑනු සාමාන්‍යයෙන් කරන්නෙ. අනුන් යටතෙ වැඩ කරන්න අකමැති සමහර ගෑනු එළෝලු වෙළඳාම පටන්ගන්නවා. එහෙම වෙළඳාම් කරන හුඟක් අය වට්ටිඅම්මාලා. වට්ටිඅම්මාලා කියන්නෙ එළෝලු වට්ටි ඔලුව උඩ තියාගත තැනින් තැන ගිහිල්ලා වෙළඳාම් කරන ගෑනු. ඒගොල්ල උදේ පාන්දරින් ගිහිල්ලා එළෝලු එකතු කරගත වෙළඳාමට යනවා. දවල් දහේට එකොලහට වෙන කොට වෙළඳාම ඉවර කරනවා. කොලඹ කිට්ටුව ඉන්න වට්ටි අම්මාලා උදේ පහට විතර බස්වලින් කොලඹට ගිහිල්ලා කොලඹ මාර්කට් එකෙන් එළෝලු තෝරාගන්නවා. උදෙන් ගියාම ලාබ ලාබ එළෝලු තෝරාගන්න පුලුවනි. ඒකයි එච්චර උදෙන් යන්නෙ. වට්ටිඅම්මාලාගෙන් එළෝලු ගන්නෙ දුප්පත් අය. ඒ අයට මිල වැඩි එළෝලු විකුනන්න බෑ. සමහර වට්ටිඅම්මාලා පෝසත් ගෙවල්වලට ගිහිල්ලාත් පලා ජාති විකුනනවා. පෝසත් අය වට්ටිඅම්මාලා ළඟට ඇවිල්ලා එළෝලු ගන්නෙ කලාතුරකින්.

කොලඹ පලාතෙ වට්ටිඅම්මාලා සාමාන්‍යයෙන් චංඩි ගෑනු. ඒගොල්ලත් එක්ක වාද කරන්න බෑ. වාදකෙරුවොත් බැනුම් අහන්න වෙනවා. ඒගොල්ලත් එක්ක හෙට්ටු කරන්න අමාරුයි. නමුත් වට්ටිඅම්මාලාගෙ එළෝලු වෙන මුදලාලිලාගෙ එළෝලුවලට වැඩියෙ ලාබයි. වට්ටිඅම්මාලා සාමාන්‍යයෙන් විකුනන්නෙ වම්බටු, මිරිස්, බොංචි, මුරුංගා, පලා ජාති වගේ ගමේ උපදින එළෝලු. ඒගොල්ලන්ට ගමේ ඇවිදලා ඒවා ලාබෙට සොයාගන්න පුලුවනි. එක කාලයක් මට හැමදාම උදේ කොලඹ ඉඳලා නුවරට බස් එකෙන් යන්න තිඋනා. මම උන්නෙ කොලඹින් හැතැප්ම හයක් එහා. මම ඒ දවස්වල උදේ පහට විතර බස් එකකින් කොලඹට ගිහිල්ලා කොලඹින් නුවර බස් එක ගත්තා. මම කොලඹ ගිය බස් එකේ තමයි වට්ටිඅම්මාලා ගියේ. සමහර ඩ්‍රයිවර්ලා බස් එකෙන් වට්ටිඅම්මාලා එක්ක යන්න කම්මැලියි. වට්ටි ගෙනිච්චාම බස් අපිරිසිදු වෙනවායි කියලා ඒ මිනිස්සු වට්ටිඅම්මාලා එක්ක තරහයි. නමුත් වට්ටිඅම්මාලා කවදාවත් නොගිහින් ඇරියෙ නෑ.

කොහොම හරි බස් එකේ එල්ලිලා වත් යනවා යනවා මයි. ඩ්‍රයිවර්ලාට වට්ටිඅම්මාලා ගෙන් ජයගන්න එක ලේසි නෑ.

අනුන් යටතෙ under others

අපිරිසිදු unclean

අපිරිසිදු වෙනවා to become dirty

ඉගැන්නීම teaching

උදෙන් early morning

උදේ පාන්දර early morning

උපදිනවා to be born

එකතුකරගන්නවා to collect (for oneself)

එල්ලෙනවා to hang (intr)

කම්මැලි lazy, disinclined, disinterested

චංඩි brave, rough

තරහ angry

නොගිහින් අරිනවා to give up going

පලා green leaves

බැනුම scolding

බැනුම් අහනවා to be scolded

බෝංචි beans

මාර්කැට් එක market

මිල වැඩි too expensive

මුරුංගා a kind of vegetable (drumsticks)

වට්ටිඅම්මා woman selling vegetables in a basket

වට්ටිය basket

වම්බටු egg plant

වාදකරනවා to argue

හෙට්ටුකරනවා to bargain



## 36. මගුල් ගෙදර

අද ගුනපාල උන්නැහෙගෙ දුව දෙන මංගල්ලෙ. ගුනපාල උන්නැහෙ දුවට මැණිකකට වගේ සලකනවා. දැන් අවුරුදු තුන හතරක් තිස්සෙ සොයලා සොයලා යන්තං මිනිහාට හිතට අල්ලන ඉලන්දාරියෙක් සොයාගන තියෙනවා. මම ඒ හාදයා දැකලා නෑ. නමුත් ගුනපාල උන්නැහෙගෙ කතාවෙ හැටියට මිනිහා යමක් කමක් තියෙන කෙනෙක් වෙන්න ඕන. ගුනපාල උන්නැහෙ බලාපොරොත්තු උනේ නම් දුවට බී.ඒ. කාරයෙක් සොයලා දෙන්නයි. ඒත් ඒ දරිවිට වැඩි ඉගනීමක් නැති නිසා බී.ඒ. කාරයො කවුරුවත් කැමති උනේ නැති ලූ. මිනිහා සොයාගන තියෙන බෑනා ට්‍රේනිං ගුරුවරයෙක් ලූ. ඊයෙ අපේ මාමා හම්බ වෙන්න ආ වෙලාවෙ ගුනපාල උන්නැහෙ බෑනා ගැන ලොකු වර්ණනාවක් කරනවා මට ඇහුනා. මාමායි ගුනපාල උන්නැහෙයි හවුලෙ බිස්නස් එකක් කරනවා මේ දවස්වල.

ගුනපාල උන්නැහෙගෙ දුව මාත් දැකලා තියෙනවා. ඒකි ඒ තරම් ලස්සනක් නෑ. බොහොම මහතයි. පාට නම් වරදක් නෑ. නමුත් කන්නාඩි දානවා. පොඩි කාලෙ ඉඳලා ම ඒකිට ඇස් අමාරුවක් තිඋනා ලූ. ගුනපාල උන්නැහෙ කවදාවත් ඒකිට වෙන ගෑනු ළමයිත් එක්ක සෙල්ලම් කරන්න යන්න දුන්නෙ නැති ලූ. ගුනපාල උන්නැහෙගෙ සල්ලිවලට ලෝබ මිනිහෙක් මිසක් වෙන කෙනෙක් ඒ කෙල්ල කසාද බඳින්න කැමතිවෙන්නෙ නෑ.

ගුනපාල උන්නැහෙ මංගල්ලෙට හුඟක් වියදම් කරලා තියෙනවා. දැවැද්දට දෙන බඩු සේරම හදවාලා තියෙන්නෙ අලුතෙන්. කන කර බඩුවලට විතරක් රුපියල් එක්දාස් පන්සීයක් විතර වියදම් උනා ලූ. දැවැද්දට තේ වත්තකුත් දෙන්න යනවායි කියලා කතා-වකුත් තියෙනවා. එහෙම දුන්නත් නැතත් උන්නැහෙගෙ බූදලේ සේරම අයිතිවෙන්නෙ දුවට නේ. මිනිහාට ඉන්නෙ ඔය දුව විතරයි.

අද ඒගොල්ලන්ගෙ ගෙදර මාලිගාවක් වගෙයි. නොයෙක් සැරසිලි! ඉලෙක්ට්‍රික්බෝල්ස් ගෙනැල්ලා මුලු වත්තෙම ලයිට් දාලා. දැන් මාසයක් විතරම මිනිස්සු දහ දොළොස් දෙනෙක් ඒ ගෙදර වැඩ. මනමාලිට ඇඳුම් අන්දවන්න කොළඹින් ගෑනියෙක් එක්ක ඇවිල්ලා තියෙනවා ලූ. මනමාලයා දීපු ඇඳුම් හොඳ නෑ කියලා ගුනපාල උන්නැහෙ අමුතුවෙන් ඇඳුම් සැට් එකක් අරන් තියෙනවායි කියලා මාමා කිව්වා. ඒක ගැන ඒ හාදයා හුඟක් අමනාප වෙන්න ඇති.

ජයට මංගල්ලයක් දෙන එක ලේසි වැඩක් නෙවි. දෙතුන් සීයකට කන්න දෙන්න ලේසි නෑ. කොච්චර ඕන ද! මිනිහාගෙ කාඩ් අච්චු ගහලා තියෙන්නෙ කොළඹ. කාඩ් හාරසීයක් යවලා තියෙනවා ලු. ඒකයි මිනිහා අමුතුවෙන් මඟුල් මඩුවක් හදලා තියෙන්නෙ. ඒ මඩුව බොහොම විසාලයි. හාරසීයක් නෙවි, පන්සීයක් උනත් වාඩිකරන්න පුළුවනි. ගුනපාල උන්නැහෙ ගම්සබාපති හින්දා ගමේ කවුරුත් එවි. ගමේ අයට මඟුල් කියලා තියෙන්නෙ කටින්. කාඩ් යවාලා තියෙන්නෙ ගමෙන් පිට අයට විතරයි. ගුනපාල උන්නැහෙට මිසක් මෙහෙම මංගල්ලයක් දෙන්න එසේ මෙසේ කෙනෙකුට බෑ.

අන්දවනවා to dress (trans)

අමනාපවෙනවා to be disappointed

අයිතිවෙනවා to come into possession

ඇස්අමාරුව eye trouble

ඉලන්දාරියා youth

එසේ මෙසේ කෙනෙක් an ordinary person

ඒකි that girl

කටින් by word of mouth

කන කර බඩු ornaments, jewelry

කන්නාඩි දානවා to wear glasses

කන්නාඩිය eye glasses

කාඩ් එක card

ගම්සබාපති chairman of village council

ගෑනු ළමයා girl

ගුනපාල Gunapala

ජයට පහට in a grand scale

ට්‍රේනිං ගුරුවරයා trained teacher

දරිවි girl

දෑවැද්ද dowry

දුව දෙනවා to give daughter in marriage



පිට outside

බෑනා son-in-law

බූදලේ property

මඟුල් ගෙදර wedding house

මඟුල් කියනවා to invite for wedding

මඟුල් මඩුව pavillion built for wedding feast

මනමාලයා bridegroom

මනමාලි bride

මංගල්ලෙ wedding

මාලිගාව palace

මැණික gem

යන්න දෙනවා to let go

ලයිට් එක electric light

ලයිට්දානවා to switch on light

ලෝබ greedy

වර්නනාව description of virtues

සෙට් එක set

හවුලෙ together, as partners

හිතට අල්ලනවා to take liking towards

## 37. නිදහස් අද්‍යාපනේ

ඉස්සර ලංකාවෙ ළමයකුට ඉගනගන්න ඕන නම් දෙමව්පියො බොහොම දනවත් අය වෙන්න ඕන. මාස් පතා ඉස්කෝල කාසි ගෙවන්නයි පොත්පත් ගන්නයි තවත් අමතර වියදම්වලට දෙන්නයි මාසෙකට රුපියල් සීයක් දෙසීයක් නැතුව බෑ. ඉස්කෝල ගාස්තු හැටියට මාසෙකට රුපියල් සීයක් දෙසීයක් වියදම් කරන්න පුලුවන් කීදෙනෙකුගෙන් කී දෙනෙකුටද? ලංකාවෙ දනවත් මිනිස්සු අඩුයි. ඒක නිසා සල්ලි අයකරලා උගන්නනකොට වැඩි දෙනෙකුට ඉගනගන්න බැරිවෙනවා. මේ කාරනාව නිසා අද්‍යාපන ක්‍රමේ වෙනස් කරන්න ඕනඋනා. අයකරන්නෙ නැතුව දෙන අද්‍යාපනේට කියන්නෙ නිදහස් අද්‍යාපනේ. නොමිලෙ උගන්නන කොට ආංඩුවට බර ගානක් වියදම් කරන්න වෙනවා. නමුත් ඒක නොතකා මුලු රටේම නිදහස් අද්‍යාපනේ පිහිටවන්න ඕන කියලා 1944දි නීතියක් පැනෙව්වා. එතකොට උන්නු අද්‍යාපන ඇමති තුමාගෙ නම සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්-නංගර මහත්මයා. ඒ නීතිය නිසා දැන් ලංකාවෙ ඕනම ඉස්කෝලෙකින් සල්ලි ගෙවන්නෙ නැතුව ඉගනගන්න පුලුවනි. හැබැයි, පොත්පත් ආදිය තමන්ගෙ සල්ලිවලින් ගන්න ඕන.

නිදහස් අද්‍යාපනේ ආරම්බ කෙරුවාට පස්සෙ මද්‍යවිද්‍යාල කියලා විද්‍යාල ජාතියක් පටන්ගත්තා. ඒවායින් වැඩි හරිය පිහිටෙව්වෙ ගම්බදව; නැත්තං දුප්පත් පලාත්වල. මුලදි ලංකාව පලාත් විසිතුනකට බෙදලා එක පලාතක එක බැගින් මද්‍යවිද්‍යාල විසිතුනක් පිහිටෙව්වා. ගමේ පොඩි පොඩි ඉස්කෝලවලට ගිය මොලේ තියෙන ළමයි තෝරලා මේ මද්‍යවිද්‍යාලවලට යන්න සිසයත්ව දුන්නා. මේ විද්‍යාල නිසා ගම්බද හුගක් දෙනෙකුට රටේ වැදගත් රස්සාවල් ලැබිලා තියෙනවා. දුප්පත් මිනිස්සුන්ට මේ විද්‍යෙ සඟනයක් ලබාදීම ගැන කවුරුත් කන්නංගර උන්නැහෙට ගරුකරන්න ඕන. දුප්පත් රටවල්වල අද්‍යාපනේ, ඉස්පිරිතාල ආදිය අයකරලා කරන්න හොඳ දේවල් නෙවි. අයකරන කොට සල්ලි ඕන. සල්ලිනැති අයට මොකද වෙන්නෙ? ලංකාවෙ අද්‍යාපනේ විතරක් නෙවි, ඉස්පිරිතාලත් නොමිලෙ. ඒත් ගෙවලා බේත්ගන්න පුලුවන් නර්සිංහෝම් වගේ තැනුත් තියෙනවා. ඒවාදුප්පතාට ප්‍රයෝජනයක් ඇති තැන් නෙවි.

මද්‍යවිද්‍යාල පිහිටෙව්වි අවස්වල සමහරු ඒවාට හිනහ උනා. ඒ හිනහ උනේ රටේ දියුනුව ගැන හිතලා නෙවි: ඉරිසියාව නිසා. දුප්පත් දරුවොත් තමන්ගෙ පෝසත් දරුවො

තරමට ඉගනගත්තාම තමන්ගෙ මාන්නෙට හොඳ මදි නේ. ඒකයි හිනහ උනේ. නමුත් ලංකාවෙ ජාතික බාසාව සිංහල උනාට පස්සෙ මද්‍යවිද්‍යාලවල සිසයයො ලොකු ඉස්කෝලවල සිසයයන්ට වැඩියෙ හොඳින් ඉගනගන්න වග පේන්න තියෙනවා.

අධ්‍යාපන ඇමතිතුමා   minister of education

අමතර   extra

ආරම්බකරනවා   to start

ඉරිසියාව   jealousy

ඉස්කෝල ගාස්තුව   school fees

ඕනම   any

කාරනාව   fact

කීදෙනෙකුගෙන් කීදෙනෙක්   how many out of how many, i.e. what a small number

ගම්බදව   in village areas

දනවත්   rich

නීතිය   law

නොතකා   not withstanding

නොමිලෙ   free of charge

පනවනවා   to enforce (rule)

මද්‍යවිද්‍යාලෙ   central college

මාන්නෙ   pride, conceit

මුලදී   in the beginning

මොළේ තියෙන   intelligent

යහමින්   in plenty

වෙනස් කරනවා   to change

සම්බන්දෙ   connection

සහනෙ   consolation

සිසයත්වෙ   scholarship grant

සිසයා   student



## 38. දේසපාලනේ

රටක් පාලනේ කරන මිනිහාගෙ ඔලුවට කවදාවත් නිස්කලංකයක් නෑ. හිටිහැටියෙ නොයෙක් ප්‍රස්න මතුවෙනවා. ඒවායින් සමහරක් බොහොම බැරෑරුම් ප්‍රස්න. සමහර ප්‍රස්න විසඳන්න කෙලවරක් නැතුව කල්පනාකරන්න ඕන. දේසපාලනඥයා ඥානවන්තයෙක් නෙවි නම්කොච්චර කල්පනාකලත් බැරෑරුම් ප්‍රස්න විසඳන්න බෑ. හතුරො වැඩිකරගන්න ඕන නම් හොඳම වැඩේ දේසපාලනේට බහින එක තමයි. එක විදියකට වැඩකරන්න ගියාම එක කොටසක් හතුරුවෙනවා. වෙන විදියකට වැඩකරන්න ගියාම තව කොටසක් හතුරුවෙනවා. කාගෙන්වත් අහන්නෙ නැතුව තමන් කැමති විදියට වැඩකරන්න ගියාම හැමෝම හතුරු වෙනවා. හතුරො ඇතිවෙනවාට බය නම් කවදාවක් දේසපාලනේට බහින්න එපා. දේස පාලනේට බැහැලා ගාන්දිට උනේ මොකෝ? බුරුමෙ ඇමති මංඩලයක් එක පාරටම විනාස කරපු හැටි දන්නවා නේ. ලංකාවෙ බංඩාරනායක උන්නැහෙට උනේ මොකෝ? කීදෙනෙක් දේසපාලනේට බැහැලා ජීවිතේ පූජාකරලා තියෙනවා ද! මනුස්සයො කාගෙත් දුර්වලකම් තියෙනවා. හතුරො නිතරම බලන්නෙ ඒ දුර්වලකම්වලින් ප්‍රයෝජන ගන්න. සමහරු තමන්ගෙ පුද්ගලික වැඩ කරවාගන්න බැරිඋනාම දේසපාලනඥයන්ගෙ වැරදි සොයන්න පටන්ගන්නවා. මම අහලා තියෙනවා සමහරු වේදිකාවලට නැගලා මහජනයා ඉදිරිපිට ඉඳගන දේසපාලනඥයන්ට බල්ලන්ට වගේ බනින හැටි. ඉතින් මේ සේරම ඉවසාගන කිසි දෙයක් ගානට ගන්නෙ නැතුව මහජනයාගෙ සුබසිද්දියට වැඩකරන්න පුලුවන් නම් ඒක කොච්චර හොඳ වැඩක් ද! ඒ අතින් බලන කොට සමහර දේසපාලනඥයො බොහොම උතුම් පුද්ගලයො.

නියම දේසපාලනඥයා රටට යහපතක් කරන්න මිසක් තමන්ට යහපතක් කරන්න බලන මිනිහෙක් නෙවි. ගාන්දි තුමා නියම දේසපාලනඥයෙක්. අවංක දේසපාලනඥයන්ට මහ ජනයා ගරුකරනවා. අද ඉන්දියාවෙ මිනිස්සු ගාන්දි තුමාට දෙවියකුට වගේ සලකන්නෙ උන්නැහෙ තමන් ගැන නොතකා රට ගැන විතරක් තැකූ හින්දායි.

ඈත් කාලෙ දේසපාලනඥයො කතාවට දක්ස අය වෙන්න ඕන. චන්දයක් දිනන්න ඕන නම් මහජනයා ඉස්සරහට ගිහිල්ලා තමන්ගෙයි තමන්ගෙ පක්සෙයි සුදුසුකම් කියන්න ඕන. මිනිස්සුන්ට ඒත්තු යන විදියට කාරනා කියන එක ලේසි වැඩක් නෙවි. සමහර බොහොම

හොඳ දේශපාලනඥයො මහජනයා ඉස්සරහදි නොබින විදියට කතාකරලා පරාදවෙලා තියෙනවා. ඒ වගේම කතාවට දක්ස සමහරු කොහොම හරි චන්දෙ දිනාගන්නවා. සමහර උදවිය චන්දයක් කිට්ටුඋනාම මිනිස්සුත් එක්ක පුලුවන් තරම් යාලුවෙනවා. දුප්පත් පැල්වලට ගිහිල්ලා ඒ මිනිස්සුත් එක්ක එකට කෑම කනවා. ඒ මිනිස්සුන්ට අයියා, අක්කා, නංගි, මල්ලි කියලා කතාකරනවා. පුංචි ලමයි උස්සාගන ඉඹලා ආදරේකරනවා. මෙහෙම නොයෙක් කපටිකම්කරලා චන්දෙ දිනාගත්තාම අර මිනිස්සු අඳුනන්නෙ වත් නෑ! ඒ මිනිස්සු ඇවිල්ලා දුක්ගැනවිල්ලක් කියන්න පටන්ගත්තොත් එලවාගන්නවා. ආයෙත් ඒ මිනිස්සු ගැන සොයන්නෙ ඊ ළඟ චන්දෙ කිට්ටුවෙනකොට තමයි. පුදුමෙ ඒක නෙවි: මෝඩ දුප්පත්තු ආයෙත් ඒ මිනිහාට ම චන්දෙ දෙන එකයි පුදුමෙ!

අඳුනනවා to know (a person)
ඉදිරිපිට in the presence of, before
ඉඹිනවා to kiss
ඉවසාගන්නවා to endure
උතුම් noble
උස්සාගන්නවා to lift up
ඒත්තුයනවා to realize, to appeal to
එලවාගන්නවා to drive away
කපටිකම craftiness
කෙලවරක් නැතුව with no end
කොටස section
ගානට ගන්නවා to take into account
ගාන්දි Gandhi
ඥානවන්තයා wise man
තකනවා to consider
දිනනවා to win
දුක්ගැනවිල්ල complaint of worries and miseries
දුර්වලකම weakness
දේශපාලනඥයා politician



දේශපාලනේ politics
නිස්කලංක peaceful
නොබින improper
පාලනේ කරනවා to rule
පැල්පත hut
පුදුමෙ wonder
පූජාකරනවා to offer, sacrifice
බනිනවා to scold
බැරෑරුම් difficult
බුරුමෙ Burma
මතුවෙනවා to rise, come up
මොකෝ why
යාලුවෙනවා to become friendly
වැඩිකරගන්නවා to increase (one's own lot)
විනාසකරනවා to destroy
වේදිකාව platform
සුබසිද්දිය welfare
සතුරා enemy
හැමෝම everyone

## 39. තේ කෝප්පයක් හදන හැටි

නොයෙක් රටවල්වල නොයෙක් දෙනා නොයෙක් විදියට තේ හදනවා. නමුත් නියම විදියට තේ හදන්නෙ බොහොම ටික දෙනායි. වතුර හොඳට නැටුවෙ නැත්තං තේ එක හරියන්නෙ නෑ. ඒක නිසා පේරටම ඉස්සෙල්ලා වතුර කේතලයක් නටවන්න ඕන. ඒ අතරෙදි පෝච්චිය හෝදලා ලෑස්තිකරගන්න. වතුර නැටුවාම එයින් ටිකක් පෝච්චි-යට වක්කරලා පොච්චිය සෝදන්න. නටන වතුරෙන් සේදුවාම පෝච්චය රත්වෙනවා. තේ හදන්න ඉස්සෙල්ලා පෝච්චිය රත්කරන්න ඕන මයි.

තේ කොල ඇබිත්තකට වතුර පෝච්චියක් වක්කරලා හොඳ තේ එකක් හදාගන්න බෑ. තේ කොලවලට ලෝබවෙන්න එපා. පෝච්චිය රත්කරලා ඒකට එක කෝප්පෙකට එක තේ හැන්ද බැගිනුයි වඩිපුර තේ හැන්දකුයි තේ කොල දාන්න. තේ කොල දාලා තියෙන්න අරින්න එපා. එක පාරටම ඕනගානට වතුර වක්කරන්න. තේ කෝප්ප දෙකක් ඕන නම් තේ කොල තේ හැඳි තුනක් දාලා වතුර කෝප්ප දෙකහමාරක් වක්කරන්න. තේ කෝප්ප හතරක් ඕන නම් තේ කොල තේ හැඳි පහක් දාලා වතුර කෝප්ප පහක් වක්කරන්න. ඒ කියන්නෙ, කෝප්ප ගානට වැඩියෙ ටිකක් වතුර වක්කරන්න ඕන.

ඊගාවට පෝච්චිය වහලා මිනිත්තු තුනක් තියෙන්න අරින්න ඕන. ඊට පස්සෙ පෝච්චිය ඇරලා හැන්දකින් ටිකක් කලත්තාලා ආයෙත් වහලා මිනිත්තු දෙකක් තියෙන්න අරින්න. දැන් තේ පෝච්චිය ලෑස්තියි. දැන් කරන්න තියෙන්නෙ බොන එකයි. ඒක නිසා තේ කෝප්පවලට වක්කරලා සෑහෙන තරම් සීනියි, කිරි ඕන නම් කිරියි දාලා බොන්න. මෙහෙම තේ හදන කොට හොඳ පිරිසිදු තේ පාවිච්චි කරන්න ඕන. නැත්තං බොන්න බැරිවෙනවා. සමහර තේ ජාති කොච්චර අඩුවෙන් දැම්මත් කසාය වගෙයි. ඒක නිසා හොඳ තේ කොල තෝරාගන්න එක පරිස්සමින් කරන්න ඕන.

සමහරු වෙන ක්‍රමවලටත් තේ හදනවා. සමහර මිනිස්සු තේ පෝච්චියට හරි කේතලේට හරි තේ කොල දාලා වතුර වක්කරලා ඒක ලිපේ තියනවා. මෙහෙම පැලීබුවාම ඒක තේ වතුර නෙවි, තේකොල කසාය! තේ බොනවායි කියලා කසාය බොන්න පුලුවන් ද! සමහර රටවල්වල තේකොල මුල් තියෙනවා. කෝප්පෙකට වතුර වක්කරලා ඒ මුලක් දානවා. වතුර ටික සෑහෙන්න පාටඋනාට පස්සෙ මුල පැත්තකට

විසිකරනවා. ඒක බොහොම ලේසියි. නමුත් ඒකෙ තියෙන්නෙ තේකොල ද නැද්ද කියලා දන්නෙ කොහොමද? සමහර තේකොල මුල්වලින් හදන තේවල අමුතු රසක් තියෙනවා.

කෝපි බොන රටවල්වල මිනිස්සු තේ බොනවා අඩුයි. ඒත්, තේ කෝප්පෙකට දෙහි ඇඹුල් ටිකක් දාලා ගත්තාම කෝපි කෝප්ප දෙකක් පරාදයි. ලංකාවෙ මිනිස්සු දවසට කීප පාරක් තේ බොනවා. ඇමෙරිකාවෙ මිනිස්සු කෝපි බොනවා වගේ සමහරු දවසට හත් අටපාරක් තේ බොනවා. තේ වෙළඳාමට වෙනම සමාගමක් තියෙනවා ලංකාවෙ. ඒකට කියන්නෙ තේ ප්‍රචාරක සබාව කියලා. ඒකෙන් මිනිස්සුන්ට දෙන උපදේසෙ තමයි 'වැඩි සැපේට තේ වැඩි වැඩියෙන් බොන්න.' කියන එක!

අඩුවෙන් less

අමුතු strange

ඇබිත්ත little bit, drop

ඇඹුල් sour

ඊගාවට next

උපදේසෙ instruction

ඒ කියන්නෙ 'that is to say'

ඕන ගානට as necessary

කලත්තනවා to stir

කේතලේ tea kettle

කෝපි coffee

කෝපි කෝප්ප දෙකක් පරාදයි 'Even better than two cups of coffee'

ක්‍රමේ method

තම්බනවා to boil

තියෙන්න අරිනවා to let remain

තේ ප්‍රචාරක සබාව tea propaganda board

දෙහි lime, lemon

දෙහි ඇඹුල් lime juice, lemon juice

නටනවා to boil (intr)



නටවනවා to boil (trans)

පරිස්සමෙන් carefully

පාටවෙනවා to become coloured

පෝච්චිය tea pot

මුල bag

රත්වෙනවා to become warm

ලිප stove

ලෝබවෙනවා to become greedy, to be stingy

වක්කරනවා to pour

වහනවා to close

විසිකරනවා to throw away

සෝදනවා to wash

හෝදනවා to wash

## 40. සිංහල හෝඩිය

සිංහල බාසාවට හෝඩි දෙකක් තියෙනවා. එකක් සුද්ද සිංහල හෝඩිය, අනිත් එක මිස්‍ර සිංහල හෝඩිය. පුරාන කාලෙ සිංහල කවි ලිවීමට පාවිච්චි කලේ සුද්ද සිංහල හෝඩිය; දැනුත් හුඟක් දෙනා කවි ලියන්නෙ ඒ හෝඩියෙන්. කවි ලියන බාසාවෙ සාමාන්‍යයෙන් සංස්කෘත වචන එහෙම නෑ. ඒක නිසා මහාප්‍රාන අකුරු එහෙම ඕන කරන්නෙ නෑ. සුද්ද සිංහල හෝඩියෙ තියෙන්නෙ අකුරු තිස්දෙකයි: අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ ං.

මේ හෝඩියෙ වයන්නක් නෑ. ඒක අඩුපාඩුවක්. කවි ලියන බාසාවෙත් වයන්න තියෙනවා. ඒක නිසා ඒ හෝඩිය සම්පූර්න කරන්න වයන්න එකතුකරන්න ඕන. ණ ළ කියන අකුරු දෙක සද්ද කරන්නෙ න ල කියන අකුරු දෙක වගෙයි. නමුත් සමහර වචනවල න ල දෙක වෙනුවට ණ ළ දෙක පාවිච්චිකරනවා. වයන්න එකතු කලාම මේ හෝඩියෙ අකුරු ගාන තිස්තුනක් වෙනවා.

මිස්‍ර සිංහල හෝඩියෙ අකුරු පනස් හතරක් තියෙනවා. ඒ වැඩි විසිඑක සංස්කෘත වචන ලියන්න ඕන කරන අකුරු. මිස්‍ර සිංහල හෝඩිය පාවිච්චි කරන්නෙ ගද්‍ය බාසාව ලියන්න. ඒ අකුරු පනස් හතර ඕනම හෝඩි පොතකින් බලාගන්න පුලුවනි. කතාකරන බාසාව ලියන්න ඒවා ඕනකරන්නෙ නෑ. කතාකරන බාසාවට අකුරු තිස්දෙකක් විතර ඕන: සුද්ද සිංහල හෝඩියෙ ණ ළ දෙක අස්කරලා ශ යන්න එකතු කලාම හරි.

ක්‍රිස්තුවර්සෙන් ඉස්සර හතරවෙනි සතවර්සෙ හරියෙ ඉන්දියාවෙ බ්‍රාහ්මී කියලා හෝඩියක් තිඋනා. සිංහල හෝඩිය පැවතෙන්නෙ ඒ බ්‍රාහ්මී හෝඩියෙන්. දර්මාසෝක රජ්ජුරුවන්ගෙ සෙල්ලිපි ලියලා තියෙන්නෙ බ්‍රාහ්මී අකුරුවලින්. පරන සිංහල සෙල්ලිපි ලියලා තියෙන්නෙත් බ්‍රාහ්මී අකුරුවලින්. ලංකාවෙදි මේ අකුරු ටිකින් ටික වෙනස්වෙන්න පටන් අරගන රවුම්වෙන්න පටන්ගත්තා. හයවෙනි සතවර්සෙ හරියෙදි ඉන්දියාවෙ වට්ටලුත්තු කියලා කියන ද්‍රවිඩ හෝඩියෙනුත් සිංහල හෝඩියට අකුරු කීපයක් එකතුඋනා. මේ කාරනා නිසා සිංහල හෝඩිය දැන් ඉන්දියාවෙ පාවිච්චිකරන හෝඩිවලට වඩියෙ වෙනස්.

ඉංගිරිසි බාසාව ලියන්න පාවිච්චිකරන අකුරු තවත් නොයෙක් බාසාවල් ලියන්න පාවිච්චි කරනවා. නාගරී අකුරුත් ඉන්දියාවෙ නොයෙක් බාසාවල් ලියන්න පාවිච්චි කරනවා. නමුත් සිංහල අකුරු පාවිච්චිකරන්නෙ සිංහල ලියන්න විතරයි. ලංකාවෙ පාලි බාසාව ලියන්නෙත් සිංහල අකුරුවලින්, නමුත් ඉන්දියාවෙ නාගරී අකුරුවලින්. සිංහල අකුරු ලෝකෙ තියෙන ලස්සන අකුරු ජාතිවලින් එකක්. ලස්සනට ලිව්වාම සිංහල අකුරු මුතු ඇට පේළි වගෙයි. සිංහලයො වෙනම ඉලක්කම් ජාතියක් පාවිච්චිකරන්නෙ නෑ. සිංහලෙන් ලියන කොට පාවිච්චි කරන්නෙ අරාබි ඉලක්කම්. නාගරී ලියනකොට නම් වෙනම ඉලක්කම් ජාතියක් පාවිච්චිකරනවා.

අඩුපාඩුව shortage, shortcoming

අරාබි Arabic

අස්කරනවා to remove

ඉලක්කම numeral figure

එකතුකරනවා to add

එකතුවෙනවා to be added

ගද්‍ය prose

ච යන්න the letter ca

දර්මාසෝක Dharmasoka

ද්‍රවිඩ Dravidian

නාගරී Nagari

බ්‍රාහ්මී Brahmi

බ්‍රාහ්මී අකුරු Brahmi script

බ්‍රාහ්මී හෝඩිය Brahmi alphabet

මහාප්‍රාන aspirated

මිස්ර, මිශ්‍ර mixed

මිශ්‍ර සිංහල Mixed Sinhalese

රවුම් වෙනවා to become circular in shape

වට්ටලුත්තු Vattaluttu



වෙනුවට in place of

ෂ යන්න the letter ša

සම්පූර්න කරනවා to complete

සුද්ද සිංහල Pure Sinhalese

හරි all right

හෝඩි පොත primer

හෝඩිය alphabet

## 41. වැද්දො

ඔයේ සමහරවිට වැද්දො ගැන අහලා ඇති. මානව විද්‍යාඥයො වැද්දො ගැන පර්යේසනේ කරන්න ඉඳ හිට ලංකාවට එනවා. වැද්දො බොහොම පුරාන කාලෙ ඉඳලා ලංකාවෙ ජීවත්වෙන මිනිස්සු ජාතියක්. ලංකාවෙ වැද්දො ඕස්ට්‍රේලියාවෙ මුල් පදිංචිකාරයන්ට සමානයි කියලා මානවවිද්‍යාව හදාරන අය කියනවා මම අහලා තියෙනවා. 1946 ජනලේකනේ හැටියට ලංකාවෙ වැද්දො දෙදාස් ගානක් ඉඳලා තියෙනවා. නමුත් දැන් පන්සියකට වැඩියෙ නැතුව ඇති. ආංඩුවෙන් ඒ මිනිස්සුන්ගෙන් වැඩිහරියකට සිංහල හරි දෙමල හරි උගන්නාලා ගම්වල පදිංචි කරවාලා තියෙනවා. හුඟක් දෙනා කිට්ටුවපාත ඉන්න සිංහල මිනිස්සුන්ගෙන් හරි දෙමල මිනිස්සුන්ගෙන් හරි කසාද බැඳගන ඉන්නවා. මේ කාරනා නිසා දවසින් දවස වැද්දො ගාන අඩුවෙනවා.

වැද්දො සාමාන්‍යයෙන් ඉන්නෙ නැගෙනහිර පලාතෙයි ඌව පලාතෙයි. ඉස්සර කාලෙ වැද්දො ඉඳලා තියෙන්නෙ ගල් ගුහාවල්වල. කැලේ සත්තු දඩයම් කරගන තමයි ඒගොල්ල ජීවත්උනේ. නමුත් දැන් වැද්දන්ගෙන් වැඩි හරියකට පුංචි ගෙවල් තියෙනවා. ආංඩුවෙන් බලකරලා ඒ මිනිස්සු ගම්වල පදිංචි කරවාලා තියෙන නිසා කැලේ ඉන්න වැද්දො ගාන අඩුයි. හුඟක් වැද්දො දැන් වැදි බාසාව කතාකරන්නෙ නෑ. සිංහලයො ඉන්න පලාත්-වල ජීවත්වෙන වැද්දො කතාකරන්නෙ සිංහල. දෙමල පලාත්වල ඉන්න වැද්දො කතා කරන්නෙ දෙමල. වැදි බාසාව විතරක් කතාකරන අය ඉන්නෙ හතරපස් දෙනායි.

ඌව පලාතෙ රස්සාව කරන මහත්තුරු ඉඳලා හිටලා වැද්දෙක් කොළඹට ගේනවා. එතකොට මිනිස්සු වැද්දා වටකරගන පුදුම වෙලා බලාගන ඉන්නවා. මේ කාරනාව නිසා වැද්දො හුඟක් දෙනෙක් කට්ට මිනිස්සු වෙලා තියෙනවා. බලන්න එන මිනිස්සුන්ගෙන් සල්ලි ගන්න ඒ ගොල්ල නොයෙක් විදියට හැසිරෙනවා. මේ ශෝ බිස්නස් එක නිසා හුඟක් දෙනෙක් මුලාවෙ වැටෙනවා. වැද්දො නොවන අයත් වැද්දො වගේ ඇඳගන ඇවිල්ලා මොනවා හරි නොතේරෙන්න කියලා සල්ලි හම්බකරගන්නවා. මේක නිසා හුඟක් මිනිස්සු නියම වැද්දො වත් විස්වාස කරන්නෙ නෑ. සිංහල පුලුවන් වැද්දොත් සිංහල බැරි විදියට ඉඳගන මිනිස්සු රවට්ටනවා.

දවසක් මම වැද්දො බලන්න ගියා. මට වැදි බාසාව හොඳට පුළුවනි. එක වැදි ගමකට ගිහිල්ලා මම වැද්දන්ට පොඩි පොඩි තෑගි බෝග දීලා ඒ ගොල්ලන්ගෙ බාසා-වෙන් කතාකරන්න පටන්ගත්තා. ඒගොල්ලන්ගෙ නායකයා දන්නෙ නෑ මට වැදි බාසාව පුළුවන් බව. මම ඒ මිනිහාට කතාකරන්න පටන්ගත්තාම මිනිහා කිව්වා 'මට පුළුවන් වැදි බාසාව විතරයි. ඒනිසා මම එක්ක කතාකරන කොට තෝල්කයෙක් ඕන කරනවා. සිංහලයි වැදි බාසාවයි දෙකම කතාකරන්න දන්න කෙනෙක් සොයාගන එන්න.' කියලා. සිංහලයි වැදි බාසාවයි දෙකම දන්නෙ මම විතරයි කිව්වාම මිනිහාට අන්දුන් කුන්දුන් උනා. ටිකක් වෙලා කතා කෙරුවාමයි මට තේරුනෙ ඒ මිනිහාගෙ බාසාව නියම වැදි බාසාව නෙවි බව. මිනිහා මම රවට්ටන්න හැදූ නිසා මම ගෙනිච්ච තෑගි බෝග සේරම අනිත් අයට දීලා මිනිහාට සබන් කෑල්ලක් විතරක් දීලා ආවා.

අන්දුන්කුන්දුන් වෙනවා to be startled

ඉඳහිට occasionally

ඌව Uva, a province of Ceylon

කට්ට crafty

කැලේ forest

කෑල්ල piece

කිට්ටුවපාත in the neighbourhood

ගල්ගුහාව rock cave

තෝල්කයා interpreter

දඩයම්කරනවා to shoot for game, hunt

නායකයා leader

නොතේරෙන්න not to be understood

ජනලේඛනේ census

පරීයේසනේ කරනවා to do research

පුදුම වෙනවා to become astonished

බල කරනවා to force

බව the fact that



මානව විද්‍යාඥයා anthropologist

මානව විද්‍යාව anthropology

මුලාවෙ වැටෙනවා to be deluded

මුල් පදිංචිකාරයා first settler

වටකරගන්නවා to gather around

වැදි බාසාව the Vedda language

වැද්දා Vedda

ශෝ බිස්නස් එක show business

සබන් soap

හදාරනවා to study

හැසිරෙනවා to behave

# 42. විජය රජ්ජුරුවො

සිංහලයන්ගෙ මුල්ම රජ්ජුරුවො තමයි විජය රජ්ජුරුවො. විජය රජ්ජුරුවන්ගෙ අම්මා සිංහසීවලී, තාත්තා සිංහබාහු. ඒ දෙන්නා අයියායි නංගියි වුණ. ඒ දෙන්නාගෙ තාත්තා සිංහයෙක් වුණ. සිංහබාහු ඒ සිංහයා මරාලා සිංහසීවලීත් අරගන පැනලාගිහිල්ලා ජීවත්උනා වුණ. ඒ දෙන්නාගෙ පුතා, විජය, තරුණ කාලෙදි චංඩි රංචුවක් වටකරගන මිනිස්සුන්ට හිරිහැර කරන්න පටන්ගත්තා වුණ. තාත්තාට ඒකට කේන්ති ගිහිල්ලා ඒ කට්ටියම රටින් පිටවහල් කලා වුණ. ඒගොල්ල ආ නැව ලංකාවට සේන්දු උනා වුණ. විජයයි පිරිසයි ලංකාවට එන කොට ලංකාවෙ උන්නෙ යක්සයො වුණ. විජය කුවේනි කියන යක්ස කුමාරිකාවක් කසාද බැඳගන ලංකාවෙ රජ කරන්න පටන්ගත්තා වුණ. ඒ දෙන්නාට දීඝහත්ථ, දිසාල කියලා පුතෙකුයි දුවකුයි උපන්නා වුණ. නමුත් විජය තමන්ගෙ පවුල අත ඇරලා ඉන්දියාවෙන් කුමාරිකාවක් ගෙන්නාගන රටේ රජකරන්න පටන්ගත්තා වුණ. කුවේනියි දරුවො දෙන්නායි තමන්ගෙ නෑදෑයො ලඟට ගියාම නෑදෑයො කුවේනි මැරුවා වුණ. ඒ මැරුවෙ කුවේනි තමන්ට විරුද්දකම් කරන්න ආ විජයගෙ පැත්ත ගත්තු නිසායි. නමුත් දරුවො දෙන්නා මැරුවෙ නෑ. ඒ දෙන්නා බොහොම අමාරුවෙන් කැලේ ඇවිද ඇවිද ජීවත් උනා වුණ. දැන් වැද්දො පවතෙන්නෙ ඒ දෙන්නාගෙන් කියලා කතාවක් තියෙනවා.

විජයට දෙවෙනි බිසවගෙන් දරුවො හම්බඋනේ නෑ. ඒක නිසා විජයගෙන් පස්සෙ රටේ රජකමට ඉන්දියාවෙන් විජයගෙ බෑනාකෙනෙක් ගෙන්නාගත්තා වුණ. ඒ කුමාරයාගෙ නම තමයි පංඩුකාබය. මේ ගොල්ල කවුරුත් ලංකාවට ආවෙ බෙංගාලෙ පැත්තෙන් කියලා සමහරු කියනවා. මේගොල්ල ආවාට පස්සෙ උතුරු ඉන්දියාවෙන් මිනිස්සු දිගටම එන්න පටන්ගත්තා.

විජය රජ්ජුරුවො ලංකාවට ගොඩබැස්සෙ තම්මැන්නාව කියන තොටුපලෙන්. තම්මැන්නාව තිඋනෙ දැන් මන්නාරම තියෙන හරියෙ. ඒගොල්ලන්ගෙ නැව බොහොම අමාරුවෙන් ලංකාවට ලඟාඋනාම ඒගොල්ල ගොඩට ඇවිල්ලා අත් දෙක බිම ගහලා දෙයියන්ට පින් දුන්නා වුණ. හුඟක් වෙලා අත් දෙක බිම ගහගන උන්නු නිසා අලු තඹ පාට උනා වුණ. ඒක නිසා විජය කුමාරයා එතනට තාම්‍රපර්ණි කියලා නම තිව්වා. තාම්‍රපර්ණි කියන සංස්කෘත වචනෙ තේරුම 'තඹපාට අල්ල' කියන එකයි. ඒක පාලියෙන්

තම්බපණ්ණි, සිංහලෙන් තම්මැන්නා. තම්මැන්නාව කියන්නෙ අල්ල තබ්බාට උන තැන කියන එකයි. ඊට ටික කාලෙකට පස්සෙ මුලු දූපතටම තම්මැන්නා දූව කියලා නම තියලා තයෙනවා.

අල්ල palm of hand

කුමාරිකාව princess

ගොඩ බහිනවා to land

චණ්ඩියා ruffian

තරුන කාලෙ youth

තොටුපල ferry

දූපත island

නැව ship

පැවතෙනවා to descend, come down

පිටවහල් කරනවා to deport

පිරිස retinue

බිසව queen

බෙංගාලෙ Bengal

මන්නාරම Mannar, a place in Ceylon

යක්සයා demon

රංචුව crowd

ලඟා වෙනවා to reach

විරුද්දකම opposition

සිංහයා lion

සේන්දුවෙනවා to reach



## 43. සිරිමහබෝදිය

බුදු හාමුදුරුවො බුදු උනේ බෝගහක් යටදි. ඒක නිසා බුද්දාගම්කාරයො බෝදියට වඳිනවා. හැම පන්සලකම බෝගහක් තියෙන්නෙ බුදු හාමුදුරුවො බුදු උන තැන සිහිකරන්නයි. දර්මාසෝක රජ්ජුරුවන්ගෙ පුතා, මිහිඳු හාමුදුරුවො, ලංකාවට බුද්දාගම ගෙනාවාට පස්සෙ ලංකාවෙ ගෑනුන්ටත් මහනවෙන්න ඕනඋනා. නමුත් බුද්දාගමේ නීතියෙ හැටියට පිරිමින්ට ගෑනු මහනකරන්න තහනම්. ඒකනිසා ඒ වැඩේට ඉන්දියාවෙන් මෙහෙනින්නාන්සෙ කෙනෙක් වඩම්මන්න ඕනඋනා. ඒපාර ඒක දර්මාසෝක රජ්ජුරුවන්ට දැන්නුවාම රජ්ජුරුවො තමන්ගෙ දූව ලංකාවට එව්වා. ඒ තමයි සංගමිත්තා මෙහෙනින්නාන්සෙ. දර්මාසෝක රජ්ජුරුවන්ගෙ දූයි පුතායි දෙන්නාම මහන වෙලා හිටිය බව ඔහෙලා දන්නවා ඇති නේ. සංගමිත්තා මෙහෙනින්නාන්සෙ ලංකාවට එන කොට අර කිව් බෝදියෙ දකුනු අත්තෙන් කැල්ලක් කපාගන ආවා. ඒ බෝ අත්ත ලංකාවෙදි බොහොම ගරු නම්බු ඇතුව පූජාවක් පවත්තලා පැල කෙරුවා. ඒක පැල කෙරුවෙ අනුරාදපුරේ මහමෙව්නා කියන උයනෙ. ඒ බෝදිය උතුම් ගහක් නිසා අපි ඒකට සිරිමහ බෝදිය කියලා කියනවා. ඒ ගහ තාමත් අනුරාදපුරේ තියෙනවා. අනුරාදපුරේට යන ඕනම කෙනෙක් සිරිමහ බෝදිය බලන්න යන්න අමතක කරන්නෙ නෑ. ලංකාවෙ තියෙන පරනම ගහ සිරි මහ බෝදිය. අපි ඒකට සිරිමහ බෝදින්වහන්සෙ කියලා කියනවා ගරුකරන්න ඕන නිසා.

මේ බෝදින් වහන්සෙ කීප පාරක් අපවත්වෙන්න ගියා. ඒත් බේත්කරලා සනීපකරන්න පුලුවන්උනා. එක මුරයක් කවුද මිනිහෙක් බෝදින්වහන්සෙ කපන්න හදලා මිනිහාට පිස්සු හැදුනා ලු. මට මතකයි දැන් අවුරුදු ගනනාවකට ඉස්සර මම මේක පත්තරේක ද කවි කොලේක ද තියෙනවා දැක්කා. සිරිමහ බෝදින්වහන්සෙට හුඟක් අනුවස් තියෙනවායි කියලා හුඟක් දෙනා කල්පනා කරනවා. බෝදින් වහන්සෙට විතරක් නෙවි, ආගම සම්බන්ද කොයි ඉස්තානවලත් අනුවස් තියෙනවා ලු. ලංකාවෙ අනුවස් තියෙනවායි කියලා සලකන තැන් තමයි සිරිපාදෙ, කතරගම, අයියනායක කෝවිල, මඩු පල්ලිය වගේ තැන්. මේ තැන්වලට ගිහිල්ලා යාච්ඤා කෙරුවාම දෙයියො බලනවා ලු. සිරිපාදෙයි කතරගමයි දෙක බුද්දාගමේ තැන්. සිරිපාදෙයි අයියනායක කෝවිලයි කතරගමයි තුන්පල හින්දු ආගමේ තැන්. මඩු පල්ලිය ක්‍රිස්තියානි ආගමේ තැනක්.

අනුවස් divine power

අපවත් වෙනවා to pass away (religious)

අමතක කරනවා to forget (trans)

අයියනායක කෝවිල Ayyanayaka Temple

අවට around

ආගම religion

ඉස්තානෙ place

කතරගම Kataragama, a place in Ceylon

ගරු නම්බු ඇතුව with respect and devotion

දෙපල the two places

පා සටහන foot print

පැල කරනවා to plant

පිස්සු හැදෙනවා to go mad

පිංකම religious festival (Buddhist)

පූජාව offering

බුදු වෙනවා to become Buddha

බෝදීන්වහන්සෙ The Sacred Bodhi tree

මඩු පල්ලිය Madu church, church at a place called Madu in Ceylon

මහමෙව්නා Mahamewna, a name of a park

මුරේ occasion, instance

මෙහෙනින්නාන්සෙ Buddhist nun

යාච්ඤා කරනවා to pray

වඩම්මනවා to get down (respectful, religious)

සිරිමහ බෝදිය the Sacred Bodhi tree

සිරිපාදෙ the Sacred Foot print

සිහිකරනවා to commemorate





අකමැති dislike

අකලට unduly, at undue time

අකුර, අකුරු letter of the alphabet

අකුරෙන් අකුර letter by letter

අක්කරේ, අක්කර acre

අක්කා, අක්කාලා older sister

අගමැතිකම, අගමැතිකම් prime ministership

අගමැතිතුමා, අගමැතිතුමාලා prime minister

අඟහරුවාදා Tuesday

අගේ value

අගෝස්තු August

අඟ, අං horn (of animal)

අඟල, අඟල් inch

අච්චු ගහනවා to print

අඩිය, අඩි foot

අඩු less

අඩුපාඩුව, අඩුපාඩු shortcoming, shortage

අඩුවෙන් less

අඬ අඬ crying

අඬගහගන්නවා to call for one's own use

අඬගහනවා to call

අඬනවා to cry

අත, අත් hand

අත අරිනවා to let go, give up

අත ගානවා to rub, touch

අත බලනවා to read palms

අතර මගදි on the way

අතේ in the hands of

අත්ත, අතු branch

අද today

අදහස, අදහස් idea

අදහස් කරනවා to intend

අදිනවා to pull, draw

අදිමදි කරනවා to show reluctance
අධ්‍යාපන ඇමති තුමා minister of education
අධ්‍යාපන ක්‍රමේ, අධ්‍යාපන ක්‍රම method of education
අධ්‍යාපනේ education
අඳිනවා to wear, to draw
අඳුනනවා to know (a person)
අඳුනාගන්නවා to get to know
අණ කරනවා to order
අනාගතේ future
අනිත් other
අනුකම්පාව sympathy
අනුන් others
අනුන් යටතෙ under others
අනුරාධපුරේ Anuradhapura
අනුව according to
අනුවස් divine powers
අනේ alas!
අන්තරාවෙනවා to die
අන්තිම last
අන්දනවා to dress (trans)
අන්දවනවා to dress (trans)
අන්දරේ Andare
අන්දුන් කුන්දුන් වෙනවා to be startled
අන්න there you are
අන්නාසි pine apple
අපට to us
අපල ill luck, misfortune
අපවත් වෙනවා to die (religious)
අපිරිසිදු unclean
අපිරිසිදු වෙනවා to become dirty
අපූරු strange, wonderful
අපේ our
අප්‍රියෙල් April
අඹරනවා to grind
අමතක කරනවා to forget
අමතර extra
අමනාප වෙනවා to be disappointed



අමාරු difficult
අමාරුව, අමාරු difficulty
අමාරුවෙන් with difficulty
අමුතු strange, new
අමුතුවෙන් anew, specially
අමුත්තා, අමුත්තො stranger, guest
අම්මා, අම්මාලා mother
අය persons
අය කරනවා to charge (money)
අයිති belong
අයිති වෙනවා to come into possession
අයින, අයින් edge
අයින් වෙනවා to get to a side
අයියනායක කෝවිල Ayyanayaka Temple
අයියා, අයියාලා older brother
අයියාලා අක්කාලා older brothers and older sisters
අර කිව්ව aforementioned
අරක්කු arrack, a strong drink
අරගන taking, having bought
අරගන්නවා to take, buy
අරන් එනවා to bring
අරන් ගියා took away
අරන් දෙනවා to buy for someone else
අරන් යනවා to take away
අරාබි Arabic
අරිනවා to open, to send
අරුමෝසම් බඩුව, අරුමෝසම් බඩු toys, and small luxury goods
අල බතල yams
අලි big
අලියා, අලි elephant
අලුත් new
අලුත් අවුරුද්ද New Year
අලුතෙන් afresh
අල්මාරිය, අල්මාරි wardrobe
අල්ල, අලු palm of hand
අල්ලනවා to catch
අල්ලාගත්තා took hold of

අල්ලාගන්නවා to take hold of
අවට around
අවනම්බු කරනවා to insult
අවබෝධ වෙනවා to realize
අවවාද කරනවා to warn, instruct
අවවාදෙ, අවවාද instruction, advice
අවශ්‍ය necessary
අවංක sincere
අවුරුද්ද, අවුරුදු year
අවුරුද්ද කනවා to have a New Year feast
අවුරුද්ද දා New Year's day
අසත්පුරුෂයා, අසත්පුරුෂයො wicked person
අසප්පුරුෂයා, අසප්පුරුෂයො wicked person
අසූපහ eighty five
අසෝක Asoka, a name
අස්කරනවා to remove
අස්වකරත්තෙ, අස්වකරත්ත horse cart
අස්වයා, අස්වයො horse
අස්වයා පිට යනවා to ride a horse
අස්වැන්න harvest
අහකට away, to a side
අහගන ඉන්නවා to remain listening
අහගන්නවා to hear, get to know, find out
අහනවා ask, listen
අහස්යාත්‍රාව, අහස්යාත්‍රා aeroplane
අහිංසක innocent
අහුරනවා to pack, close
අංසකේ, අංසක degree

ආ Oh!
ආගම religion
ආගමක් දහමක් a religion or philosophy
ආච්චි, ආච්චිලා grand mother
ආදම් Adam
ආදරේ කරනවා to love
ආදායම, ආදායම් income
ආධාර කරනවා to support, help



ආධාරෙ, ආධාර support
ආදාහනේ, ආදාහන cremation
ආදිය et cetera
ආපදාව, ආපදා trouble, calamity
ආපහු back
ආයෙත් again
ආරම්භකරනවා to start
ආරස්සා කරගන්නවා to look after for one's own use
ආරස්සාකරනවා to look after, protect
ආරස්සාව protection
ආරංචි උනා got to know
ආරංචි වෙනවා to get to know
ආරාධනා කරනවා to invite
ආවා came
ආස්සරේ association, friendship
ආස්සරේ කරනවා to associate
ආහාරෙ, ආහාර food
ආංඩු කරනවා to rule, govern
ආංඩු ක්‍රමේ, ආංඩු ක්‍රම method of government
ආංඩුව, ආංඩු government

ඇක්ස්ප්‍රස් express
ඇඟ, ඇඟවල් body
ඇඟිල්ල, ඇඟිලි finger
ඇති enough, there might be
ඇති කරගන්නවා to cherish (for one's own purposes)
ඇතිකරනවා to cherish, entertain
ඇතිවෙනවා to come into being
ඇත්ත වසයෙන් strictly speaking, really
ඇදගන pulling
ඇඳුම, ඇඳුම් clothing, dress
ඇඳුම් පැළඳුම් clothings etc.
ඇබිත්ත little bit, drop
ඇඹරීම, ඇඹරීම් grinding
ඇඹුල් sour
ඇමතිකම, ඇමතිකම් ministership of government
ඇමති මංඩලේ, ඇමති මංඩල cabinet of ministers

ඇමතිවරයා, ඇමතිවරු minister
ඇමෙරිකාව America
ඇරෙන කොට besides
ඇවිදිනවා to walk
ඇවිල්ලා having come
ඇස් අමාරුව, ඇස් අමාරු eye trouble
ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බංඩාරනායක S.W.R.D. Bandaranaike
ඇහැල පෝය full moon day of July
ඇහුනා ද Did you hear?, O.K.?
ඇහෙනවා to hear
ඇෆ්. ආර්. සේනානායක F.R. Senanayake

ඈත් වෙනවා to get away

ඉක්මනට quickly, fast
ඉගනගන්නවා to study
ඉගනීම, ඉගනීම් **study, education**
ඉගැන්නීම, ඉගැන්නීම් teaching
ඉඩ space, room
ඉඩ දෙනවා to allow
ඉත්ත් so
ඉත්හාසෙ, ඉතිහාස history
ඉතුරු කරනවා to save (money)
ඉතුරු හරිය remainder, balance
ඉදිරිපිට in front, before
ඉද්රියෙ in front, before
ඉඳපු that has been, past
ඉඳලා having been, from
ඉඳලා හිටලා occasionally
ඉඳ හිට occasionally
ඉන්දනවා to plant, place
ඉන්දියාව India
ඉන්දුනීසියාව Indonesia
ඉන්නවා to be (people and animals)
ඉන්න හිටින්න to live and exist
ඉඹිනවා to kiss
ඉර, ඉරි sun, line



ඉර බහිනවා to set (sun)
ඉරිදා Sunday
ඉරිදා ඉස්කෝලෙ, ඉරිදා ඉස්කෝල Sunday school
ඉරිදා පොල, ඉරිදා පොලවල් Sunday fair
ඉරිසියාව jealousy
ඉර්තුව, ඉර්තු season
ඉලක්කම, ඉලක්කම් numeral figure
ඉලන්දාරියා, ඉලන්දාරි youth
ඉලැක්ට්‍රික් මෝල, ඉලැක්ට්‍රික් මෝල් electric generator
ඉල්ලනවා to ask for
ඉල්ලාගන having borrowed
ඉල්ලාගන්නවා to borrow
ඉවරවෙනවා to finish (intr)
ඉවසනවා to endure
ඉවසාගන්න බැරුව being unable to endure
ඉවසාගන්නවා to endure
ඉසරදේ head ache
ඉස්කෝල කාසි school fees
ඉස්කෝල ගාස්තුව, ඉස්කෝල ගාස්තු school fees
ඉස්කෝල බස්එක, ඉස්කෝල බස් school bus
ඉස්කෝල ළමයා, ඉස්කෝල ළමයි school child
ඉස්කෝලෙ, ඉස්කෝල school
ඉස්තානෙ, ඉස්තාන place
ඉස්ප්රිතාලෙ, ඉස්පිරිතාල hospital
ඉස්ම juice
ඉස්මතුකරනවා to raise, bring up
ඉස්සර before
ඉස්සරහ in front
ඉස්සරහින් in front
ඉස්සෙල්ලා before
ඉහල above
ඉංගිර්සි English
ඉංගිරිසිකාරයා, ඉංගිරිසිකාරයො Englishman
ඉංග්රිසි බේත, ඉංගිර්සි බේත් English (Western) medicine
ඉංජිනේරුවා, ඉංජිනේරුවො engineer

ඊගාවට next
ඊට පස්සෙ after that
ඊ ළඟට next

උකස් තියනවා pawn
උගත් learned
උගතා, උගත්තු learned man
උගත්කම scholarship
උගන්නනවා to teach
උගුර, උගුරු throat
උගුර කඩාගන 'at the top of his voice'
උගුල, උගුල් trick
උගුල් අදිනවා to play tricks, to put others into difficulty
උඩ up, above
උඩ පනිනවා to jump up
උඩරට uplands of Ceylon
උඩරට නැටුම, උඩරට නැටුම් upland dancing
උඩින් above
උතුම් noble
උතුර north
උතුරු northern
උත්තරේ, උත්තර answer, reply
උත්සවේ, උත්සව festival, function
උත්සාහ ගන්නවා to try
උදලු ගානවා to weed with hoe
උදවිය persons
උදව් කරනවා to help
උදාහරනෙ, උදාහරන example
උදෙන් early in the morning
උදේ morning
උදේ පාන්දර early morning
උඳු a kind of cereal
උනන්දුව interest, enthusiasm
උනන්දුවෙන් with interest, with enthusiasm
උනු hot, that has happened
උනු කරනවා to boil (liquids)
උනොත් if it happens



උන්ට to those animals
උන්න that was
උන්නා there was
උන්නැහෙ he, Mr.
උන්නු that was
උන්නෙ නැ there wasn't
උන්වහන්සෙ, උන්වහන්සෙලා He (religious)
උප ඇමති, උප ඇමතිවරු junior minister of government
උපකරනෙ, උපකරන instrument
උපදිනවා to be born
උපදේසෙ, උපදේස instruction
උපන් born
උපන් දවස date of birth, birth day
උපන් දිනේ date of birth, birth day
උපන්නා was born
උපාය, උපායවල් trick, device, plot
උයන, උයන් park
උයනවා to cook
උස tall, height
උසාවිය, උසාවි court
උසාවි යනවා to go to court, sue
උසුලනවා to hold (office)
උස්න hot, warm
උස් වෙනවා to become high
උස්සාගන්නවා to lift up

ඌ, ඌන් that animal
ඌව Uva, a province in Ceylon

එක one
එකක් one thing
එකඟවෙනවා to agree
එකට together
එකතුකරගන්නවා to collect for one's own use
එකතු කරනවා to collect, add
එකතු වෙනවා to gather (intr)
එක පාරට ම at once

එකමත් එක කාලෙක 'once upon a time'
එකවගේ alike
එක සමාන alike
එක්ක with
එක්ක යනවා to take (a person)
එක්කහු වෙනවා to gather together (intr)
එක්කෙනා person
එක්කෙනෙක් one, one person
එක්දාස් අටසිය පාලහ 1815
එක්දාස් නම සිය හතලිස් අට 1948
එක්දාස් නමසිය හතලිස් ගනන්වලදි during the 1940's
එක්දාස් පන්සිය පහ 1505
එක්දාස් පන්සිය 1500
එක්සත් united
එක්සත් කරනවා to unite
එක්සත් ජාතික පක්සෙ the United National Party
එගොඩ වෙනවා to cross (rivers etc.)
එච්චර that much
එතකොට then
එතන that place, in that place
එතෙන්ට to that place
එදාට on that day
එනවා to come
එපා don't, don't want
එපා වෙනවා to be disgusted
එවනවා to send
එයින් පස්සෙ after that
එළවළු vegetables
එළවාගන්නවා to drive away
එළිපත්ත threshold
එළිය light
එළියෙස් Eliyes
එළුමස් mutton
එළුවා, එළුවො goat
එළොළු vegetables
එල්ලාගන්නවා to hang (by or on oneself)
එල්ලෙනවා to hang (intr)



එසේ මෙසේ කෙනෙක් an ordinary person
එහා පැත්ත other side
එහෙනම් then
එහෙම like that
එංගලන්තෙ England
එංසාල් cardomums

ඒ that
ඒ ඒ various
ඒක that one
ඒකට කමක් නෑ that doesn't matter
ඒක නිසා therefore
ඒකයි that's why
ඒකි that girl
ඒ කියන්නෙ that is to say
ඒ ගොල්ල those people
ඒත් yet, even then
ඒ තරමට that much
ඒත්තු යනවා to realize, understand, accept
ඒ නිසා therefore
ඒ පාර then
ඒයි 'Say!'
ඒ ළඟ near there
ඒ වගේම similarly
ඒවා those things

ඔක්ස්පර්ඩ් Oxford
ඔය that near you
ඔය අතරෙදි in the meantime
ඔය විදියට in that manner
ඔයා, ඔයාලා you
ඔයින් මෙයින් in this way
ඔළුව, ඔළු head
ඔළුව උඩ තියාගත keeping on the head
ඔහේ, ඔහේලා you
ඔහෙ ඉන්නවා to remain doing nothing

ඕන want, any
ඕන කරනවා to become necessary
ඕන ගානට as necessary
ඕන තරම් as much as necessary
ඕන දෙයක් anything that is necessary
ඕන ම any
ඕනවාට වැඩියෙ more than necessary
ඕන වෙනවා to become necessary
ඕපදූප gossip
ඕස්ට්‍රේලියාව Australia

කකියනවා to ache
කච්චපුට Kaccaputa
කට, කටවල් mouth
කට කතාව, කට කතා legend, folk tale
කට දත කෑම, කට දත කෑම් spicy food
කටයුත්ත, කටයුතු activity
කටින් by word of mouth
කට්ට crafty
කට්ටිගැහෙනවා to throng together
කට්ටිය, කට්ටි group
කඩකාරයා, කඩකාරයො shopkeeper
කඩදාසිය, කඩදාසි paper
කඩනවා to break, pluck, pick
කඩේ, කඩ shop
